සෝවියට් සමාජවාදී සමූහ සංගමයේ ආසියාතික අගනුවර වන ටැෂ්කන්ට් නගරයේදී නොබෝදා ඇති වූ සාම සාකච්ඡාවේදී ඉන්දියානු-පකිස්තානි අරගලය සමථයකට පත් කිරීම සඳහා පියවරක් ගැනීම ඉතා වැදගත් දෙයක් බව පිළිගත යුතුයි. යුද්ධයකින් හෝ වෙනත් අන්දමේ බලහත්කාරකම්වලින් හැර මෙය විසඳා ගන්න බැරිය යන හැඟීමක්—ලෝකයේ අධිරාජ්‍යවාදී රටවල උසිගැන්වීම් නිසා—අවුරුදු දහහතක කාලයක් තිස්සේ තිබුණු බව අපි දන්නව. එවැනි අවබෝධයක් ඇතිව භයානක තත්ත්වයක තිබුණු මේ අරගලය සාමකාමී අන්දමින් නිරාකරණය කර ගන්න පුළුවන් වූයේ ලාල් බහදූර් ශාස්ත්‍රී අගමැතිතුමාගේ සහ පකිස්තානයේ ජනාධිපතිතුමාගේත් අවංක උත්සාහය නිසයි. විශේෂයෙන්ම ඉන්දියාවේ හිටපු අගමැතිවර ලාල් බහාදූර් ශාස්ත්‍රීතුමාගේ ඉතාමත් උසස් හැඟීම් අනුව ගත් උදාර ක්‍රියා මාර්ගය නිසාත් මහන්සිය නිසාත් බලහත්කාරකම්වලින් සහ යුඩයකින් හැර කාශ්මීර ප්‍රශ්නය විසඳිය නොහැකි යයි එතෙක් පැවැති හැඟීම් සහ අවබෝධය වෙනස් කරන්නට පුළුවන් වූවා පමණක් නොවෙයි, සාමය ආරක්‍ෂා කර ගැනීම සඳහා සාමකාමී අන්දමට ඇති කර ගන්නා ලද ගිවිසුමකට ඉන්දීය ජනතාව වෙනුවෙන් ලාල් බහාදූර් ශාස්ත්‍රී මැතිතුමාට අත්සන් කරන්න පුළුවන් වුනා. අභාවප්‍රාප්ත ලාල් බහාදූර් ශාස්ත්‍රී අගමැතිතුමාගේ ඒ විශිෂ්ට සේවය අගය කරන්නේ ඉන්දියාවේ ජනතාව සහ පකිස්තානයේ ජනතාව පමණක් නොවෙයි. විශෙෂයෙන් අග්නිදිග ආසියාවේ යුඩ උපද්‍රවවලට මුහුණ පෑමට සිදු වී තිබෙන රටවල සිටින කෝටි සංඛ්‍යාත ජනකාය ලෝක සාමය සම්බන්ධයෙන් එතුමාගෙන් සිදු වූ විශිෂ්ට සේවය අගය කරනවා ඇති. ඒ ගැන අපි විශේෂයෙන් අපගේ කෘතඥතාව පළ කරන්න ඕනෑ.

ලංකාවත් ඉන්දියාවත් අතර සදාකාලික මිත්‍ර සම්බන්ධකමක් ඇති කිරීමට විශාල ධාබාවක්ව තිබුණු ඉන්දියානු කම්කරු ප්‍රශ්නය සම්බන්ධයෙන් එවකට හිටපු ලංකා අගමැතිනියගේ විශේෂ ඉල්ලීම් අනුව ලාල් බහාදූර් ශාස්ත්‍රී අගමැතිතුමා දැක්වූ කාරුණික සහයෝගයත් විශේෂ උනන්දුවත් පරිත්‍යාගශීලීභාවයත් අපි දන්නවා. ඒ වගේම ඉන්දියාවත් ලංකාවත් අතර මිත්‍ර සම්බන්ධකම් ගොඩනැඟීමට එතුමා තුළ තිබුණු ආශාවත් අපි දන්නවා. එතුමාගේ එඩිතර තීරණය නිසා ලංකාව සහ ඉන්දියාව යන දෙරට අතර නොකැඩෙන මිත්‍රත්වයක් ඇති කර ගැනීමට හේතු වන අන්දමට ගිවිසුමක් ඇති කර ගැනීමෙනුත් එතුමාගේ බලාපොරොත්තුව වූයේ කුමක් දැයි අපට අවබෝධ වෙනවා. ඉන්දියාවේ හිටපු ජනනායකයෙකු වන ජවහර් ලාල් නේරු අගමැතිතුමාගේ ප්‍රතිපත්ති අනුගමනය කරන්නට ලාල් බහදූර් ශාස්ත්‍රීතුමා කටයුතු කළ බවත් අප පිළිගන්න ඕනෑ. ලංකා සමසමාජ පක්ෂයේ නායක යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ, ලාල් බහදූර් ශාස්ත්‍රී අගමැතිතුමා ඉන්දියානු සේවක සංගමයේ සාමාජිකයකු හැටියට තමාගේ වස්තුව, තමාගේ බුද්ධිමත් පුහුණුව, සම්පූර්ණයෙන්ම රට වෙනුවෙන් කැප කරමින් කටයුතු කළා. කොටින්ම කියනවා නම්, එතුමා තමාගේ සම්පූර්ණ ජීවිත කාලයම ඒ සේවක සංගමයේ සාමාජිකයකු හැටියට රට වෙනුවෙන් කැප කළා. එබඳු විශිෂ්ට සේවයක් කරමින් සිටි එතුමාගේ හදිසි අභාවය ඉන්දියාවට පමණක් නොවෙයි

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ශෝක ප්‍රකාශය : ශ්‍රී ලාල් බහදූර් ශාස්ත්‍රී

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

ඉන්දියාව සමග මිත්‍රකම් වැඩි දියුණු කර ගැනීමට කටයුතු කරන ලංකාව සහ පකිස්ථානය ඇතුළු මුළු අග්නිදිග ආසියා වටම වූ විශාල පාඩුවක්. එපමණක් නො වෙයි, එතුමාගේ අභාවයෙන් ලෝක සාම යටත් විශාල හානියක් ඇති වුණා.

ලාල් බහදූර් ශාස්ත්‍රී මහතා සාමය ඇති කිරීම උදෙසා දැරූ ප්‍රයත්නයෙන් අපට හොඳ ආදර්ශයක් ගන්නට පුළුවනි. යුද රකුසා අනුගමනය කරන ලෝකයේ බල වත් ජාතීන්, යුද්ධ මාර්ගයෙන් හැර කරන් නට බැරිය කියන සාමය තහවුරු කිරීමේ වැඩ පිළිවෙළ සාමයෙන්ම ක්‍රියාත්මක කළ හැකි දෙයක් බව ලෝක ජනතාවට පෙන්වා දීමේ නායකත්වය ගත් ඒ ශාස්ත්‍රී අගමැති තුමාගේ අභාවය සම්බන්ධයෙන් මටත් කණගාටුව ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලැබීම ගැන ඇත්ත වශයෙන්ම මා කෘතඥ වෙනවා.

ඒ සමගම විරුද්ධ පක්ෂයේ නායිකා වන් යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළ ආකාරයට ලාල් බහදූර් ශස්ත්‍රී අගමැතිතුමාගේ හදිසි අභාවය සම්බන්ධ යෙන් වහාම අපට කණගාටුව ප්‍රකාශ කිරී මට අවස්ථාවක් සලසා නොදීම ගැන මමත් මේ ආණ්ඩුව කෙරෙහි මගේ අප්‍රසා දය පළ කරනවා.

ලාල් බහදූර් ශාස්ත්‍රී අගමැතිතුමාගේ හදිසි අභාවය ගැන අපගේ බලවත් කණ ගාටුව එතුමාගේ පවුලේ අයටත් ඉන්දී යානු රජයටත් දන්වන මෙන් අවසාන වශ යෙන් මා ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I associate myself with everything that has been said and I shall convey a minute of these proceedings to the Hon. Speaker of the Lok Sabha.

**ප්‍රශ්නය විමසන ලදින්, ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது. பிரே ரணை ஏகமனதாக ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to,* nemine contradicente.

මන්ත්‍රී මණ්ඩලයේ රුස්වීම

## නොපැමිණීමේ අවසරය: බී. වයි. තුඩාවේ මයා.

*வராதிருக்க அனுமதி : திரு. பி. வை. துடாவ*

LEAVE OF ABSENCE : MR. B. Y. TUDAWE

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*

(Dr. S. A. Wickremasinghe)

මෙම යෝජනාව මම ඉදිරිපත් කර නවා :

"1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාවේ 24(1) (ඊ) ඡේදය යටතේ මාතර මන්ත්‍රීවර බී. වයි. තුඩාවේ මහතාට 1966 ජනවාරි මස 25 වන දින සිට මාස 3 ක් තුළ මන්ත්‍රී මණ්ඩලයේ රුස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතුය."

**කෙනමන් මයා.**

*(திரு. கெனமன்)*

(Mr. Keuneman)

**විසින් ස්ථිර කරන ලදී.**

*ஆமோதித்தார்.*

*Seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## මන්ත්‍රී මණ්ඩලයේ රුස්වීම

*சபை அமர்வு*

SITTING OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා :

"අද දින විසිර යැමේදී මන්ත්‍රී මණ්ඩලය 1966 ජනවාරි මස 26 වන බදාදා පූ. භා. 10 වන තෙක් කල් තැබිය යුතුය; එදින සභා රුස්වීම පැවැත් වීමේ කාල වේලා සිකුරාදා දිනයක මෙන් විය යුතුය."

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සෝමවීර චන්ද්‍රසිරි මයා.** (කැස්බෑව)
*(திரு. சோமவீர சந்திரசிரி—கெஸ்பாவ)*
(Mr. Somaweera Chandrasiri—Kesbewa)

ගරු කථානායකතුමනි, ඊනි ප්‍රශ්නයක් ඉදිරිපත් කළයුතුව තිබෙනවා. පසුගිය 18 වර්ෂය තුළම මේ හැන්සාඩ් වාර්තාව පාර්ලිමේන්තු සම්ප්‍රදායානුකූලව පිළියෙළ වන ශුද්ධ ලියවිල්ලක් වශයෙන් මේ රට පිළිගත් බව අප දන්නවා. නමුත් වර්තමානයේ සිට මේ ලියවිල්ල පච මල්ලක් බවට පත් වෙනවා නම් එය මේ ගරු සභාවට ලොකු අවනම්බුවක් වන බව තමුන්නාන්සේත් පිළිගන්නවා ඇත කියා මා විශ්වාස කරනවා.

පසුගිය 11 වැනිදා මෙහි ඇතිවූ සිද්ධිය මේ හැන්සාඩ් වාර්තාවේ වාර්තා වී තිබෙන්නේ ඉතාමත් වැරදි සහිතවයි. තමුන්නාන්සේ කරුණා කර ශබ්දය පටිගත කිරීමේ යන්ත්‍රය ක්‍රියාවේ යොදවා ඒ යන්ත්‍රයෙන් මතුවන වචනත් මේ වාර්තාවට ඇතුළත් කිරීමට එකඟ වන්නෙහි නම් තමුන්නාන්සේ පාර්ලිමේන්තු සම්ප්‍රදායානුකූලව ක්‍රියා කරන කථානායකවරයකු හැටියට අපට පිළිගන්නට පුළුවන්. නොඑසේ නම්, ආණ්ඩු පක්ෂය ගෙන යන ඒ වැඩ පිළිවෙළට තමුන්නාන්සේත් එකඟ වීමෙන් මේ සභාවේ ගෞරවය කෙලෙසෙනවාය කියන එකයි අපට කියන්නට සිද්ධ වෙන්නෙ. ඒ නිසා මා තමුන්නාන්සේගෙන් ඉතාමත් ගෞරවපෙරදැරිව ඉල්ලා සිටින්නේ, පසුගිය 11 වන දින රැස්වීමේ වැඩ පටිගත කළ යන්ත්‍රය නැවතත් ක්‍රියාත්මක කර බලා යන්ත්‍රයෙන් මතුවන වචන හා සිද්ධීන් සියල්ලම එකතු කර මේ හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීමෙන් සංශෝධනය කර එය නැවතත් මුද්‍රණය කරන ලෙසයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඒ ප්‍රශ්නය ගැන කටයුතු කරනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I did not follow what the Hon. Leader of the House said. Sometimes it is difficult to follow him. Do I understand him to say that the Sitting of the House tomorrow will be as on a Friday and therefore we start at 10 A.M. and finish at 4.30 P.M. or 5 P.M.? Is that the position?

**ගරු සී. පී.ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Yes.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Let me say this: having a majority they can treat us in any way they like. I remember, as Members of the Opposition we had much better treatment from the then Government with regard to Debates. The Hon. Leader of the House will remember that on no occasion did we have an important Debate in this House where the Opposition had the same number of hours as the Government. In every case the Opposition was given more time than the Government.

The Hon. Leader of the House will remember that even when he was with the Coalition he was the first to come before the Cabinet and say, "No, we must concede the Opposition's rights and we must give them more time." That is the position that the Hon. Leader of the House has always taken.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

He has changed.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Now you have changed. Now you think you are a greater democrat by imposing your will on us because you have a majority.

Sir, may I remind the Hon. Leader of the House that there are many people in this country and also in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

this House who think they will sit on that side of the House for ever and ever. They will learn a bitter lesson. When the next change comes I pray that you will continue to be a Member of the Cabinet! Otherwise I should feel sorry for you.

Anyway, that is neither here nor there—[*Interruption.*]

ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)

(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல— கல்வி, கலாச்சார விவகார அமைச்சர்)

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

Is it a threat?

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

This is a promise of history and not a threat. History will repeat itself. I do not want to threaten.

Is it right and proper that because you have a majority you should treat the Opposition like this? Can you give one instance where the Opposition did not have more time than the Government? Why is it that in the last two Debates you started on this arrangement of an equal number of hours?

Even when the U. N. P. was in the Opposition with only eight Members, while we had ten, we had better treatment from the Government with regard to Debates. We had more time than the Government. Why are you treating us like this? I have no objection if you think you are doing the proper thing by imposing your will on us. Please remember this: these are precedents which we will never forget. Yes, we will never forget.

Now, there is an important Debate tomorrow. For the first time we are having, under this Government, an Emergency Motion discussed. This is not the first time that Emergency Motions have been discussed in this House. I will read out to you a number of cases tomorrow where you have all participated in such Debates. The first Emergency Motion during the period of the last Parliament was discussed for two days. We introduced a substantive Motion as soon as the Emergency was declared and we wanted that Motion discussed. We have introduced a substantive Motion now. Why are you not giving us the opportunity of discussing that Motion? Why discuss it on an Adjournment Motion when there is a substantive Motion moved by us? Is it because you do not want to face a Division? You do not want to have it on record that you have voted for the continuation of the Emergency and that we voted against it. Is that fair? Is that fair by the Opposition? Are you treating the Opposition in a fair and democratic manner? We were told that the U. N. P. was a different U. N. P., a more democratic U. N. P.

All that I can say is this. You can impose your will, but you will not be able to get through a lot of the items on the Order Paper without our support, my Friend. Every one of the Supplementary Estimates you bring forward can be discussed by us for days, and you will never get a Motion through if that is the basis on which you are going to treat us.

We too have got our rights in this House. The Standing Orders too protect us in this House, and we will debate every Supplementary Estimate of yours for one week before you get your Supplementary Estimates through if that is the way you are going to treat us. The masters will be the people outside, not you. You will not be here for ever and ever.

Mind you, in the discussion with the Chief Whip of the Opposition, the Hon. Minister agreed to sit till 6 o'clock tomorrow, and now he moves a Motion here to end the sitting at 5 o'clock. What kind of man are you? Do you stand by one

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

word of what you say in this House ? Here, in a letter, you have agreed to give us one hour more by cutting down the lunch interval—[*Interruption*]. But why did he move this Motion ?

He has moved a Motion about the Sitting of the House tomorrow. Suppose that Motion was passed without our raising a voice in protest, then what would have been the hours of discussion for tomorrow ? It would have been from 10 A.M. to 12 NOON, and from 2 P.M. to 4.30 P.M. Those would have been the hours of discussion. And now, having written a letter stating that he is prepared to give us two extra hours, he gets up and moves a Motion which deprives us of that. Does he think he is treating us fairly ?—[*Interruption*]. At least let him stand by his own words.

All that I am saying is that I am claiming protection from you. We have given notice of a substantive Motion. We have a right to demand that our substantive Motion be discussed. You cannot insist on it being discussed on an Adjournment Motion. We have got a substantive Motion moved by almost all Members of the Opposition. So why are you depriving us of the normal rights of Opposition Members ? I do not understand why we are being treated like this. You have your majority and you can do what you like. But we will still register our protest and we will seek our own remedies when our time comes.

අ. භා. 3.5

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Sir, I would like to endorse the point of view expressed by the hon. Member for Yatiyantota. This Motion would not have generated so much heat if not for the fact that the Government has informed us through other channels—I do not know whether they kept you informed, but they have informed us—that a greater part of tomorrow will be allotted to the Debate on the Emergency that was proclaimed on the 8th of this month. The Government has been following expressly shifty tactics on this matter and I want to protest, first of all, against those tactics.

You will recall that on several occasions when the House met earlier, we from the Opposition Benches asked for a date to debate a specific Motion that we had given notice of, namely, a substantive Motion calling for the withdrawal of the Emergency imposed on January 8th. Now, that is a right of this House.

The Government has a right to advise the Governor-General to impose an Emergency. Within ten days it has to be reported if the House is not sitting. If the House is sitting, it must be forthwith so reported. That has happened,. But the purpose of that reporting is not merely to inform us about it, but to give us an opportunity to express our views as a House, as the supreme legislature of this country, on a major matter like the declaration of a state of Emergency.

We are not seeking an opportunity to pass some comments on the Emergency ; we are not seeking an opportunity to retail some incidents of the various irregularities and atrocities that the Government has perpetrated in the name of the Emergency ; we are seeking by that Motion to canvass the views of the House on the question whether this Emergency is to continue or not. We have a right to do so because otherwise this House as the supreme legislature in fact ceases to exist and you are imposing your Emergency not only on the country but on this House as well. I do not think my Hon. Friend the Leader of the House seems to understand this.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

On the last occasion we raised this matter with the Hon. Prime Minister. He is not here; I understand he is not well. We raised with him the question that the House should meet earlier than today in order to discuss our Motion. The Hon. Prime Minister said that he would consider it.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

To give a date before the 25th.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

To give a date even before the 25th—[*Interruption.*]

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

He said that he would consider the matter seriously.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

He had to consult his other Colleagues. He apparently consulted his other Colleagues—[*Interruption.*] I do not know how many.

Then the Hon. Leader of the House addressed a letter to the hon. Leader of the Opposition saying that they were prepared to let this matter be debated tomorrow. There was a meeting of leaders of Opposition parties and the leaders of Opposition parties agreed that the hon. Leader of the Opposition should send a letter to the Hon. Leader of the House saying that we required two days for this Debate and in that letter the hon. Leader of the Opposition said that as it may not be possible to get two days this week we did not mind even if the matter was taken up next week provided we got the two days.

Then the suggestion was made in the very letter of the Hon. Leader of the House that we should have two extra hours—one hour off the lunch interval—and in fact the letter says that we can go on till 6 o'clock. What happens now? My Hon. Friend moves a Motion which means that Parliament closes shop at 5 P.M. tomorrow and not at six, after having written to us suggesting six o'clock. It is proposed that we should start the Debate at 11 o'clock in the morning and not even at 10.30 at the end of Questions. May I say this? What is worse—and this is where I accuse the Government of underhand, shifty, manoeuvring—the Government is refusing even to discuss the matter on the substantive Motion we have moved. They want to move the Adjournment and have a Debate on the Adjournment. During the Adjournment we can discuss anything, but we cannot come to a conclusion.

I challenge the Government not to dodge a decision but to let whatever the time allocated tomorrow to be spent on debating the Motion and at the end of the Debate to let a Division to be taken. If the House votes for you, it strengthens you—you have got your majority. At least give us this opportunity of canvassing this House and through this House the country on the desirability or otherwise of the Government continuing the state of Emergency. If there is any justification whatsoever, if there is even a tittle of justification—we say there is none—[*Interruption*]. I have not finished. If it is a point of Order, I will give way.

If it is the position of the Government that all that they can give is tomorrow up to 6 o'clock, let them at least say that the whole of tomorrow up to 6 o'clock will be devoted to the Debate. Let them also say that the Debate will be on the Motion of the Opposition—on our substantive Motion—and not on a Motion for Adjournment. Let him agree that he will put our Motion on

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the Order Paper as the first item of Public Business tomorrow and, as we have only six hours for the whole Debate—I can personally speak for 16 hours about what these people have done—let them at least agree to give us four hours of those six hours and take two hours for themselves.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
May I interrupt the hon. Member ?

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)
If he is intervening I do not mind.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
The Leader of the House had no intention of going back on the letter he had written. He wanted to mention it tomorrow that we sit from 11 till 12 noon——

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
How can he do it tomorrow ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
——I will tell you. The idea may be wrong—that we sit from 11 A.M. to 1 P.M., adjourn from 1 to 2 P.M. and then sit from 2 to 6 P.M. From 10 to 10.30 A.M., Questions for oral answer ; from 10.30 to 11 a.m. a few matters of Public Business will be taken up which we hope to finish by 11 A.M. That means an extra half an hour. There would be still six hours left for Debate.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
How do you conclude that Public Business will take only half an hour ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
Even if we do not finish, we will stop at 11 A.M.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
You are not the only party in this House.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
We will stop at 11 A.M.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
How can you do that ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
It is Government Business.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
Government Business may need more time.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
We will adjourn the Debate.—[*Interruption*].

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
How do you know ? Controversial or non-controversial, it has yet to be decided.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
Even if an item of Business under discussion is not passed, we will adjourn the Debate.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

That also you will have to agree on.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

We do not mind it not being passed if you are so unco-operative.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Of course I must say you are very co-operative !

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

If you will listen to me, you will find that we are very co-operative. You are not permitting me to be co-operative.

Under the arrangement arrived at —the Hon. Leader of the House had written to the hon. Leader of the Opposition—the Debate on the Emergency was to be from 11 A.M. to 1 P.M., then adjourn from 1 to 2 P.M. and resume it again from 2 to 6 P.M., giving six hours of Debate. He had no intention at all of going back on that letter. He did not explain it properly. He thought of explaining it later or tomorrow.

Now the Opposition wants 4 hours. We cannot give four hours out of six and have only two for the Government. So, if we go on till 7 P.M., we can give you four out of seven hours, and keep three hours for us.

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Will you agree to accede to our request ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Sit down.

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Sit down ? You are intervening.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I am going to say something which will make it unnecessary for you to speak.

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

I am hoping so.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Hon. Minister of State might be allowed to state what he has to say.

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Provided it is understood that it is an intervention.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Yes.

කෙනමන් මයා.
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

The Hon. Minister asked me to sit down.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

You must listen to what I have to say. Otherwise, I will sit down.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I was listening very patiently.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I think that suggestion should find general agreement, that we sit for seven hours, the Government speaks for three out of the seven hours and the Opposition speaks for four.

Then you want to discuss a specific Motion. Yes, we will take up that Motion.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

As a specific Motion ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Yes.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I think that settles the question. It should be all right.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I do not know whether the Hon. Minister is aware of the procedure. He cannot move an amendment to the Motion regarding the Sitting of the House tomorrow morning.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

We will move it now then.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You must amend it now. That is the mistake they made last time. Any one Member can object to any change in your Standing Orders. Any one Member's objection is valid enough. It is not a question of a majority vote when you are amending Standing Orders. Do not make a mistake.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Let us get together and amend it.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என் எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is right. You must amend it now.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

The hon. Member may move the amendment.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I move to add the following words :

"and that the House be adjourned at 7 P.M."

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

What about the Motion ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

It must be on the Order Paper tomorrow.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

The only thing I want to say is that I want to start the Debate so that you may know all the facts. If you move your Motion, how can I start ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශීය හණ භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්තශාලා

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
We can move it formally.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)
We will get someone to move the Motion formally and then you can speak.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
Thank you.

ප්‍රශ්නය :
வினா :
*Question* :

"That this House at its rising this day adjourn until 10 a.m. on Wednesday, 26th January 1966; and (*a*) that notwithstanding the provisions of Standing Order No. 8, the hours of Sitting that day shall be 10 A.M. to 1 P.M.; and 2 P.M. to 7 P.M.; and (*b*) at 7 P.M. Mr. Speaker shall adjourn the House without Question put."

**විමසන ලදින් සභාසම්මත විය.**
விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Put, and agreed to.*

## දේශීය හණ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා හඟුරන්කෙත ඡන්දදායක කොට්ඨාශයෙහි කර්මාන්තශාලා

### ஹங்குரன்கெற்றத் தேர்தல் தொகுதியில் உள்ளூர்ச் சணற் பொருள்களை உற்பத்தி செய்வதற்கான தொழிற்சாலைகள்

### WORKSHOP FOR MANUFACTURE OF LOCAL HANA PRODUCTS IN HANGURANKETA ELECTORATE

අ. භා. 3.17.

**ජෝර්ජ් අබයගුණසේකර මයා.** (හඟුරන්කෙත)
*(திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர—ஹங்குரங்கெத்த)*
(Mr. George Abeyagoonasekera—Hanguranketa)

ගරු කථානායකතුමනි, මා නමින් ඇති පළමුවන යෝජනාව මම දැන් ඉදිරිපත් කරනවා. ඒ මෙසේයි :

"හඟුරන්කෙත ප්‍රදේශයෙහි හා ඒ අවට පෙදෙස්හි හණ (ජූට්) ඉතා බහුල වශයෙන් වැවෙන හෙයින් දේශීය හණ (ජූට් සහ හෙම්ප්) වලින් නොයෙක් භාණ්ඩ නිපදවීම සඳහා හඟුරන්කෙත ඡන්දදායක කොට්ඨාශය තුළ රජය නවීනතම කර්මාන්ත ශාලා ඉදි කළ යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

මෙවැනි යෝජනාවක් මේ ගරු සභාව ඉදිරිපිට තබන විට මට කල්පනා වෙනවා බොහෝ අවස්ථාවල දී මේ සභාවේ සාකච්ඡාවට භාජන වන්නේ මීට වඩා වැදගත්, රටේ ජාතික හා ආර්ථික ප්‍රශ්න පිළිබඳ යෝජනා බව. මෙය අහිංසක ගැමි ජනතාවකගේ දියුණුව ඇති කිරීම පිණිස කර්මාන්තයක් නගා සිටුවීම සඳහා කරන යෝජනාවක්.

හණ කර්මාන්තය ගැන කථා කරන විට සමහරුන් සිතන්න පුළුවනි, ගැමි ව්‍යවහාරයේ පවතින කියමනක් වන 'පැරණි හණ මිටි ලිහන්න' මන්ත්‍රීවරයෙක් සූදානම් වනවාය කියා. හණ පිළිබඳව යමක් කීමට පුළුවන් විශෙෂඥයකු නොවූවත් හණ ගස ලංකාව තරම්ම පැරණි ගසක් බව මට කියන්න පුළුවනි. අපේ පැරන්නන් ඔවුන්ගේ එදිනෙදා ජීවිකාව කර ගැනීම සඳහා හණ ගසේ කොළ නොයෙක් විදියෙන් ප්‍රයෝජනයට ගත් බව රහසක් නොවෙයි. නවීන නිෂ්පාදනයන් ඇති වෙන්නට පෙර සිටි අපේ ගැමි ජනතාව—විශේෂයෙන්ම ගොවීන්—ඔවුන් ගේ ගොවිකම් කටයුතුවලදී සෑම විටම පාවිච්චි කලේ හණ ලණුයි. නවීන නිෂ්පාදනයන් ඇතත් අදත් අපේ ගොවීන් ඒ කටයුතු සඳහා ගන්නේ හණ ලණුයි. අවාසනාවකට මෙන් හණ ගසෙන් එදා නිෂ්පාදනය කළ ද්‍රව්‍යයන්මයි, අදත් නිෂ්පාදනය කරන්නේ. ඒ ද්‍රව්‍යයන් නිෂ්පාදනය කිරීම සඳහා එදා යම් ක්‍රමයක් යෙදුවාද, ඒ ක්‍රමයමයි, අදත් යොදන්නේ. හණ ගසෙන් නිෂ්පාදිත ද්‍රව්‍යයන් එදා පාවිච්චි කළේ යම් කටයුත්තක් සඳහාද, අදත් ඒවා පාවිච්චි කරන්නේ ඒ සීමා සහිත කටයුතු සඳහා පමණයි.

ලංකාවේ ඇත්තේ කෘෂිකර්මීය පදනම් කරගත් ආර්ථික ක්‍රමයක්. ගොවි කර්මාන්තය දියුණු කිරීම සඳහා මේ රටේ නොයෙක් විදියේ ප්‍රයත්න දරා තිබෙනවා. ඒ නිසා, කරදරයක් නැතුව අපේ රටේම උපදින අමු ද්‍රව්‍යවලින් යම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශීය හණ භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්තශාලා

කිසි ප්‍රයෝජනයක් ලබා ගන්ට පුළුවන් ද යන්න ගැනත් කල්පනා කර බැලීම රජයේ යුතුකමයි.

මෙම යෝජනාව ගැන යමක් කියන්නට මත්තෙන් මා අදහස් කරනවා, මීට අදාළව තවත් කරුණු ස්වල්පයක් ප්‍රකාශ කරන්ට. 1947, 1948 කාලෙ, අළුත් ආණ්ඩු ක්‍රමය බිහිවුණාට පස්සෙ, පත් වුණු රජය කල්පනා කළා, මේ රටේ ජාතියේ පිට කොන්ද හා සමාන කළ හැකි ගැමි ජනතාවගේ ආර්ථික, සංස්කෘතික හා සදාචාර දියුණුව පිණිස කටයුතු කිරීම් වස් යම් කිසි ව්‍යාපාරයක් ආරම්භ කරන්නට. එම අදහස අනුව තමයි, මේ රටේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය එදා එම රජය විසින් පටන් ගන්ට යෙදුණේ. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය දීප ව්‍යාප්ත ව්‍යාපාරයක් හැටියට සලකා ලංකාවේ සැම තැනම එම ව්‍යාපාරය පතුරුවා ලීම පිණිස විශේෂ දෙපාර්තමේන්තුවක්ද පිහිටෙව්වා. සමිති සමාගම් ද පිහිටුවා ග්‍රාම සංවර්ධන කටයුතු ආරම්භ කළා. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයෙහි එක් පරමාර්ථයක් වන ගම් වැසියන්ගේ ආර්ථික දියුණුව සලසා ලීම පිණිස ගම්බද්ව හස්ත කර්මාන්ත දියුණු කිරීම උදෙසා විශෙෂ ආයතන පිහිටුවා විශෙෂ නිලධාරීන්ද පත් කර කටයුතු කළා. ඒ අනුව මෙම අවසථාවේදී මේ ගරු සභාවේ සිටින ගරු මන්ත්‍රීවරුන්ගෙන් මා අහන්න කැමතියි, මෙවැනි වැඩ පිළිවෙළක් මගින් මෙතරම් කලක් ග්‍රාම සංවර්ධනය සඳහා කර ගෙන ගිය කටයුතුවලින් අපේ රටට ඇති වී තිබෙන ප්‍රයෝජනය එහෙම නැතිනම් සෙත කුමක්ද යන්න ගැන එම දෙපාතීමේන්තුව මගින් හෝ වෙනයම් ආයතනයක් මගින් හෝ පරීක්ෂා කර බලා තිබෙනවාද කියා. ඒ අන්දමේ පරීක්ෂණයක් කර බලන එක හොඳය කියා මා සිතනවා. මා එසේ කියන්නෙ, ග්‍රාම සංවර්ධනය උදෙසා විශෙෂ දෙපාතීමේන්තුවක් ආරම්භ කොට විශාල ධනස්කන්ධයක්ද යොදවා කටයුතු කිරීමෙන් රටට වැඩක් සිදු වුණාද, සේවයක් සැළසුනා ද යන්න දැන ගැනීම වැදගත් කරුණක් වන නිසයි.

එවැනි පරීක්ෂණයක් කළත් නැතත්, අපට අවබෝධ වී තිබෙන විධියට නම් එම ගින් එතරම් ප්‍රයෝජනයක් සිදු වී නැතෙයි කියන්ට පුළුවනි. නිදර්ශන වශයෙන් අපි කල්පනා කර බලමු, ග්‍රාම සංවර්ධන හා සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් පටන් ගෙන තිබෙන යම් යම් ව්‍යාපාර කීපයක් ගැන. අත් යන්ත්‍රවලින් රෙදි විවීමේ ව්‍යාපාරය හැරෙනකොට, එවැනි ලාබ ප්‍රයෝජන ගෙන දෙන වෙනත් කර්මාන්ත බිහි වී තිබෙනවාද යන්න සැක සහිතයි. අපි කල්පනා කර බලමු, කුඹල් කර්මාන්තය ගැන. මා නියෝජනය කරන හඟුරන්කෙත කොට්ඨාශයේ කුඹල් කර්මාන්තයෙන් දියුණුවට මෙම දෙපාතීමේන්තුව මගින් එතරම් වැඩක් කර නැති බව කියන්ට ඕනෑ. පැරණි සම්ප්‍රදායානුකූල ක්‍රම අනුව වළං සෑදීම කර ගෙන එනවා, හැරෙන්නට එම ව්‍යාපාරයෙහි ඊට වැඩි සැළකිය යුතු වෙනසක් සිදු වී තිබෙනවාය කියන්නට පුළුවන්කමක් නැහැ. මා දන්නා හැටියට මගේ කොට්ඨාශය තුළ මෙම කර්මාන්තයෙහි ඇති දියුණුවට වඩා වෙනස් අන්දමක දියුණුවක් වෙනත් පළාතක ඇති වී තිබෙනවාය කියන්ට අමාරුයි.

මා දන්නව, ඔය දෙපාර්තමේන්තුව මගින් පටන් ගන්න යෙදුණා යකඩ කර්මාන්තය ගැන. යකඩ වැඩ කරන කම්හල්වලින් රක්ෂාවන ඒ කාර්මික මහ ජනතාවට, දෙපාර්තමේන්තුවෙන් පහසුකම් ලබා දී තිබෙනව. සමහර කම්හල්වල වැඩ කටයුතු යාන්ත්‍රික ක්‍රමයට සකස් කර ගැනීමෙන් නොයෙකුත් නිෂ්පාදන කර ගෙන යාමට හැකි වී තිබෙනව. නමුත් මෙම දෙපාතීමේන්තුවෙන් එම වැඩ කටයුතු ගැන නියමිත පරීක්ෂණයක් කර, එම ව්‍යාපාරවලින් වැඩක් වී ඇද්ද කියා සොයා බලා තිබෙනවාද කියා මම ප්‍රශ්න කරනව. පෞද්ගලික වශයෙන් මම දන්නව, අවසර පත්‍ර පිට යම් යම් පහසුකම් සලසා දෙන ලද කර්මාන්තශාලාවල දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වූ තරම් දියුණුවක් සිදු වී නැති බව. ඔය විටියට, මෙම දෙපාර්තමේන්තුව මගින් නොයෙකුත් දිස්ත්‍රික්කවල ආරම්භ කරන ලද නොයෙකුත් කර්මාන්ත වල අද දවසේ බලාපොරොත්තු වූ තරම් දියුණුවක් ඇති කර ගෙන නැහැ. එම නිසා මා පළමු වෙන්ම ප්‍රශ්න කරන්න කැමතියි, එම දෙපාර්තමේන්තුව තව දුරටත් පවත්වාගෙන යා යුතුද, පවත්වා ගෙන යාමෙන් ප්‍රයෝජනයක් වෙයිද කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබයගුණසේකර මයා.]

එසේ නැතිනම්, මෙම දෙපාර්තමේන්තුවෙන් ප්‍රයෝජනයක් සැලසෙන විධියට, අර පළමුවෙන් අදහස් කළ පරමාර්ථයන් ඉෂ්ට කර ගැනීම උදෙසා, දැනට වඩා වැඩි දියුණුවක් ඇති කර ගැනීමට කොයි විධියෙ සැලැස්මක් අනුව කොයි විධියෙන් පර්යේෂණ කළයුතුද, කියා සොය බලා, ඒ අනුව ක්‍රියා කළ යුතුයි. මේ කාරණා ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කරමින් හණ කර්මාන්තය ගැනත් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, හණ ගහ ගැන විශේෂයෙන් සඳහන් නොකළාට, හණ ගහ ලංකාවේ කඳුකර පළාත්වල සෑම තැනකම වාගේ ඉතාමත් සරුවට, ඉතාමත් සනීපදායක ලෙස වැවෙන බව කවුරුත් දන්නා කාරණයක්. කොයි විධියෙ පසක් තිබුණත් හණ ගසේ වැඩීමට එය බාධාවක් නැහැ. වියලි ප්‍රදේශයේ වුවද සීමාසහිත වර්ෂා පතනයක් ඇති සෑම තැනකම වාගේ හණ වැවෙනවා. ගරු කථානායකතුමනි, අපේ ප්‍රදේශයේ මේ අන්දමට හණ සරුවට වැඩී තිබෙන බිම් ප්‍රමාණය කොපමණද කියා කවුරුවත් සලකා බලා ඇතැයි මම හිතන්නෙ නැහැ. නමුත් සාමාන්‍යයෙන් කල්පනා කර බැලුවොත්, මම හිතන හැටියට කඳුකරයේ අක්කර 15 දහසක, 20 දහසක බිම් ප්‍රමාණයක් හණ ගස්වලින්, හණ වගාවෙන් වැසී තිබෙනව. මම හිතනව කවුරුත් මේ කාරණය පිළිගන්නව ඇතැයි කියා. එපමණ විශාල බිම් ප්‍රමාණයක මෙය වැවී තිබෙන්නෙ ස්වභාවයෙන්මයි. එසේ නැතුව, කිසිම කෙනෙකුගේ මහන්සියේ ප්‍රතිඵලයක් නිසා හෝ ගොවිකර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් කළ විශේෂ පර්යේෂණයක ප්‍රතිඵලයක් නිසා හෝ නොවෙයි මෙතරම් විශාල ප්‍රමාණයක් සරුවට වැවී තිබෙන්නෙ. එම නිසයි, විශේෂයෙන්ම මේ ගස ගැන මම සඳහන් කළේ.

ගරු කථානායකතුමනි, ලෝකයේ අද දියුණු රටවල, විශේෂයෙන්ම කර්මාන්ත සංවර්ධනය අතින් දියුණුවක් බලාපොරොත්තු වන රටවල කරන්නේ ඒ රටින්ම සොයා ගත හැකි අමුද්‍රව්‍යවලින් නොයෙකුත් නිෂ්පාදන ඇති කර ගැනීම සඳහා පර්යේෂණ කිරීමයි. තම රටවල් වලින් ලබාගත හැකි අමුද්‍රව්‍යවලින් නිෂ්පාදනයන් කිරීමයි. එම නිසා, කඳුකරයෙන් පහසුවෙන් ලබාගත හැකි මෙම අමුද්‍රව්‍යය ගැන නියම අන්දමට පර්යේෂණ කර බලා එයින් මුළු රටටම ප්‍රයෝජනවත් වන කර්මාන්තයක් ආරම්භ කිරීම වැදගත් බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. එසේ කර්මාන්ත පටන් ගතහොත් විශේෂයෙන්ම ගම්බද ජනතාවට එයින් විශාල සෙතක් සැලසෙනවා පමණක් නොවෙයි, ගම්බද ප්‍රදේශවල මෙම ගස් ඉතාමත් සාරවත් අන්දමට වැවීමට උනන්දු වෙනවාටද කිසිම අනුමානයක් නැහැ.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් අපට පොත්පත්වලින් හා වෙනත් ප්‍රවෘත්තිවලින් දැනගන්නට ලැබී ඇති අන්දමට, විදේශීය රටවල මෙම හණ ගසින් නැතිනම් මෙම වර්ගයේ හණ ගස්වලින් නොයෙකුත් කර්මාන්ත අරඹා තිබෙනවා; එම ගසින් නියම ප්‍රයෝජනය ලබාගන්නව. ඉන්දුනිසියාව, කියුබාව, පිලිප්පයින් දූපත්, ඊශ්‍රායලය ආදී රටවල මේ ගස සශ්‍රීකව වැවෙනව.

ඒ රටවල වැවෙන හණ නොහොත් "ජූට්" ගස්වල කෙඳිවලින් බොහෝ සෙයින් ප්‍රයෝජන ගන්නා බව රහසක් නොවෙයි. එහෙත් ලංකාවේ මේ ගස්වල කෙඳිවලින් ප්‍රයෝජන ගන්නේ පරම්පරාගතව කම්මාන්තයක් කරගෙන එමින් සිටින එකම පවුලක් පමණයි. ඒ පවුල විසින් නොහොත් ඒ විශෙෂ පිරිස විසින් කරන ඒ කම්මාන්තය නොහොත් නිෂ්පාදනය දුම්බර පැදුරු නමින් ප්‍රසිද්ධියට පත්ව තිබෙනව. අද අප කාගේත් සිත් ගත්, විශෙෂයෙන්ම විදේශිකයන්ගේ සිත් ගත්, ඒ වාගේම හොඳින් අලෙවි කර ගැනීමට පුළුවන් නිෂ්පාදනයක් බවට එය පත් වී තිබෙනව. මෙය සුළු කම්මාන්තයක් වශයෙන් පිළිගෙන, ගෘහ කම්මාන්ත දෙපාර්තමේන්තුව විසින් එය නිෂ්පාදනය කරන උදවියට මුදලින් ආධාරයක්ද කර, ඒවා අලෙවි කිරීමටත් වැඩ පිළිවෙළක් යොදා තිබෙන බව අපි දන්නව. නමුත් එය සීමා සහිතව කර තිබෙන දෙයක්. ඒ ආධාර [illegible] ප්‍රමාණවත් නැති නිසයි, පුළුල් වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිළිවෙළක් ඇති කිරීම සඳහා මේ නිෂ්පාදනය කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට මම අදහස් කෙළේ.

මෙම නිෂ්පාදනය සම්බන්ධව ඒ දෙපාර්තමේන්තුවේ නිලධාරී මහතකුගෙන් ප්‍රශ්න කළ විට ඒ මහතා කිව්වා, අද දවසේ ලංකාවට පිටරටවලින් ලැබෙන එවැනි නිෂ්පාදන ගැන බලන විට ඒවා හණ නූල් වලින් සකස් කරන භාණ්ඩවලට වඩා සවි ශක්තිය ඇති, පෙනුම ඇති, ලක්ෂණ භාණ්ඩය කියා. විශේෂයෙන් නයිලෝන් සහ ප්ලාස්ටික් වර්ගවලින් සකස් කරන ලද නොයෙකුත් භාණ්ඩ මේවාට වඩා ලාබෙට ලැබෙනවාය. ඒ නිසා හණ නූල් වලින් කරන නිෂ්පාදන සඳහා කාලයත් ධනයත් ශ්‍රමයත් වැය කිරීම ප්‍රඥාගෝචර නොවේය කියා ඒ මහතාගෙන් දැන ගන්න ලැබුණා. එම ප්‍රකාශයේ යම්බඳු රහසක් තිබෙන්න පුළුවන්. නමුත් මේ හණ පිළිබඳව පර්යේෂණ පවත්වා පිට රටින් එන ඒ භාණ්ඩවලටත් වඩා හොඳින්, පිට රට වෙළෙඳ පොළට පවා යැවීමට සුදුසු අන්දමින්, භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයි. මෙපමණ ලක්ෂණටත්, මෙපමණ සශ්‍රීකවත්, මෙපමණ බහුලවත් වැවෙන මෙම ගස්වල කෙඳිවලින් ප්‍රයෝජන ගැනීමට අපේ විශේෂඥයො නොහොත් අපේ රටේ කර්මාන්ත පිළිබඳ කටයුතු කරන උදවිය උත්සාහයක් ගන්නෙ නැත්තෙ කුමක් නිසාද කියා මට නම් තේරෙන්නෙ නැහැ. විද්‍යා හා කර්මාන්ත පර්යේෂණ ආයතනය කියා ඇති එක්තරා සංස්ථාවක් ගැන අපි දන්නවා. ඒ කියන්නෙ කථානායකතුමනි, "සිලෝන් ඉන්ස්ටිටියුට් ඔෆ් සයන්ටිෆික් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රියල් රිසර්ච්" යනුවෙන් විශාල නමකින් තිබෙන ආයතනය ගැනයි. එවැනි ආයතනයකුත් තිබියදී, කර්මාන්ත සම්බන්ධව යම් යම් දේ ඉගෙන ගෙන තිබෙන විශේෂඥයන් යයි පිළිගන්නට පුළුවන් පිරිසකුත් සිටියදී, මෙම හණ සම්බන්ධව පර්යේෂණ ඇති කර මෙයින් ප්‍රයෝජනයක් ගැනීමට වෑයම් නොකරන්නෙ මන්ද කියා අපට ප්‍රශ්න කරන්න සිදු වී තිබෙනවා. එමනිසා මොන විධියේ අමාරුකම් තිබුනත් දෙපාර්තමේන්තුව විසින් නිසි පර්යේෂණ ඇති කර මේ ගසෙන් ප්‍රයෝජන ගැනීමට වැඩ පිළිවෙළක් යෙදිය යුතුයයි මම යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, "කර්මාන්තශාලා" කියා මේ යෝජනාවෙ තිබුනත් පටන් ගැනීමක් වශයෙන් එක කර්මාන්ත ශාලාවක් ආරම්භ කළත් ඒකෙ ඇති වරදක් නැහැ. හඟුරන්කෙත පළාතෙත් ඒ තදාසන්න අනික් ගම්වලත් තත්ත්වය ගැන තමුන්නාන්සේලා සාමාන්‍යයෙන් අවබෝධ කරගෙන තිබුනත්, මේ ප්‍රශ්නය ගැන සඳහන් කරන විට ඒ ප්‍රදේශ ගැන යමක් කීම යෝග්‍යය කියා මම කල්පනා කරනවා. හඟුරන්කෙත වැනි ප්‍රදේශ කඳුකර ප්‍රදේශ බවත් ඒ ප්‍රදේශවල වැවෙන ගොවි කර්මාන්ත ද්‍රව්‍යවලින් විශේෂයෙන්ම ඒ ප්‍රදේශවල මිනිසුන්ටත් සාමාන්‍ය වශයෙන් ලංකාවේ අනික් ප්‍රදේශවල ජනතාවටත් ප්‍රයෝජන ලැබෙන බවත් තමුන්නාසේලා දන්නවා. අද ඒ කඳුකර පළාත්වල තිබෙන තත්ත්වය ඉතාම භයානක බවත් ඒ සමගම මම කියන්නට ඕනෑ. තේවලට සීමා වුණු කඳු පෙදෙස් හැර දුම්කොළ සහ එළවලු වගාව කෙරෙන පෙදෙස් පස සේදී යාමට භාජන වෙනවා. ඒ දුම්කොළ සහ එළවලු වගාව නිසා ලංකාවට විශාල ප්‍රයෝජනයක් ලැබුනත් පස සේදී යාම නිසා ඒ ප්‍රදේශවල ජනතාවට ඉතාමත්ම බැරෑරුම් ප්‍රශ්නයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. වතාවක් හෝ දෙවතාවක් දුම්කොළ වැව් ඉඩමකින් නැවත ප්‍රයෝජන ගැනීම එපමණ පහසු වැඩක් නොවෙයි. තද වර්ෂාව පවතින ඒ පළාත්වල පස සේදී යාම නිසා එහි ඉඩම් අද ඉතාමත්ම නිසරු තත්ත්වයකට පත් වී තිබෙනවා. එළවලු වවන ඉඩම්වල තත්ත්වයත් එසේමයි. එමෙන්ම ඉතා ශීඝ්‍ර ලෙස වැඩි වී යන ජනගහණයක් ඇති මේ ප්‍රදේශවල අද ඉඩම් නැති අයගේ සංඛ්‍යාව බොහොමත්ම වැඩියි. කෝරළ හතරකට පහකට සීමා වූ මේ මැතිවරණ කොට්ඨාශයේ දැනටම කිසිම ඉඩමක් නැති පවුල්වල සංඛ්‍යාව 3,500 කටත් වඩා වැඩි බව මෑතදී සාමාන්‍ය වශයෙන් කරන ලද පරීක්ෂණයක ප්‍රතිඵල වශයෙන් අපට දැන ගන්නට ලැබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශීය හණ භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්තශාලා

[අබයගුණසේකර මයා.]

ගරු කථානායකතුමනි, නගරබද පළාත්වල තත්ත්වය කෙසේ වුනත් අද ගම්බද පළාත්වල රැකීරක්ෂා නැති උදවියගේ සංඛ්‍යාවත් දිනෙන් දිනම ශීඝ්‍ර ලෙස වැඩි වේගෙන යනව. ඒ රැකීරක්ෂා නැති උදවියගේ සංඛ්‍යාවට ඇතුළත් වන උගත් පිරිසගේ සංඛ්‍යාවත් ඒ විධියටම වැඩි වේගෙන යනව. මා කලින් සඳහන් කළ ඒ සුළු ප්‍රදේශයේ පමණක් ජ්‍යෙෂ්ඨ සමත් තරුණ තරුණියන් 1,500 කටත්, 2,000 කටත් අතර ගණනක් සිටිනවා. සුළු ප්‍රදේශයක තත්ත්වය මේ විධියයි. ඉතාමත්ම ජනාකීර්ණව ඇති මේ පළාත්වල වගා කිරීමට තිබෙන ඉඩම් ප්‍රමාණය ඉතාමත්ම සීමා සහිත බවත්, කවදාවත් එම ඉඩම් ප්‍රමාණය වැඩි නොවන බවත් අප පිළිගත යුතුයි. එවැනි තත්ත්වයක් තිබෙනවා නම් මේ ඉඩම්, වර්ෂයක් වෂියක් පාසා, කන්නයක්, කන්නයක් පාසා, වර්ෂාව නිසාත් නොකඩවා කෙරෙන ගොවිතැන් වැඩ නිසාත් පාළු වී නිසරු වී නොයන්නට නම් පස සෝදා යාම වැළැක්වීමට කටයුතු කරන්නට ඕනෑ. දෙපාර්තමේන්තු මගින් නීති රීති හා ව්‍යවස්ථා ඇති කර කටයුතු කරන නමුත් ඒවා ක්‍රියාත්මකව පවතින්නේ එහෙමත්ම තැනක බව අපි දන්නව. පස සෝදායෑම සම්බන්ධව නොයෙක් විධියේ නිවේදන පිට කර තිබෙනවා. පස සෝදායෑම වැළැක්වීම සඳහා නොයෙක් විධියේ ආධාර හා උපදෙස් දීම සඳහා රජයේ නිලධාරීන් ඉදිරිපත් වුණා. එහෙත්, ඒ සඳහා විශාල වියදමක් දරන්නට සිදු වන නිසා ඒ අනුව කටයුතු කිරීමට ගම්මුන්ට නොහැකි වී තිබෙනව. මා වටහා ගෙන ඇති අන්දමට, දැනටමත් මගේ කොට්ඨාශයේ ගම්වල එළවලු වගාවක් හෝ වෙන යම් ගොවිතැනක් සාර්ථක කර ගන්නවා නම්, එසේ කරගනු ලබන්නේ පිටරටින් ගෙන්වනු ලබන රසායනික පොහොර නිසයි. ඒ නිසා අවශ්‍ය පොහොර ප්‍රමාණය ලබා ගැනීමට ගොවීන්ට නොහැකි වුවොත් හෝ අවශ්‍ය පොහොර ප්‍රමාණය ලබා දීමට අපට නොහැකි වුවොත් ඒ පළාත්වල මොනම ගොවිතැනක්වත් කරන්නට කෙහොමටවත්ම බැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මේ යෝජනාව සම්බන්ධව මන්ත්‍රීතුමා නොයෙක් අන්දමේ ප්‍රශ්න ඉදිරිපත් කරනව.

**ජෝර්ජ් අබයගුණසේකර මයා.**
*(திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர)*
(Mr. George Abeyagoonasekera)

ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නයටම එන්නම්. මා කියමින් සිටියේ පස සෝදා යෑමේ ප්‍රශ්නය ගැනයි. ඒ උඩරට කඳුකර ප්‍රදේශවල පස සෝදායෑම වැළැක්වීමට වැඩි වියදමක් නැතිව කළ හැකි එකම දෙය හණ වැවීමයි. ඒ නිසා පස සෝදා යෑමේ ප්‍රශ්නයත් ඒ පළාතේ ප්‍රශ්න හා සම්බන්ධ කර කථා කිරීමට මට සිදු වුණා. පොහොර යෙදීම ආදී කිසිම කරදරයක් නැතිව ස්වාභාවිකව ඒ පළාත්වල වැවෙන හණ ක්‍රමානුකූල පිළිවෙළකට වගා කරනවා නම්—ඉඩමේ පිහිටීම අනුව, පස සෝදායෑම වළකින අන්දමින් වගා කරනවා නම්—පස සෝදායෑමෙන් ඉඩම් නිසරු තත්ත්වයට පත්වීම වළක්වා ගැනීමට පුළුවන් වන බව අපට පෙනී ගොස් තිබෙනව. ඒ නිසා ස්වාභාවිකව වැවෙන මේ හණ ගස් ක්‍රමානුකූලව වැවීමට ගැමියන්ට අනුබල දෙන අතරම, මුදලින් හා ගොවි කර්මාන්තය හා සම්බන්ධ උපදෙස් දීම වැනි ආධාර දීමේ වැඩ පිළිවෙළක්ද දෙපාර්තමේන්තුව මගින් ඇති කළ යුතුයි. එසේ කිරීමෙන්, එක ගලකින් කුරුල්ලන් දෙදෙනෙකුට ගහන්නාක් මෙන්, එක අතකින් කඳුකර ප්‍රදේශවල පස සෝදායෑම වළක්වා ගත හැකි වන අතර අනික් අතින් හණ කර්මාන්තයෙන් ප්‍රයෝජන ලබා ගැනීමට හැකි වෙනව. හණ වගා කිරීමෙන් පළාතේ අයගේ දියුණුව පිණිස හණ කර්මාන්තය ඇති කරන්නට පුළුවන්. වෙන බොහෝ රටවල් තම රටේ නිපදවන අමු ද්‍රව්‍ය පිළිබඳව පර්යේෂණ පවත්වා ඒවායින් ඉතාම ලක්ෂණට නවීන ක්‍රම අනුව නොයෙක් ද්‍රව්‍ය නිෂ්පාදනය කරනවා නම්, අපටත් මේ හණ වගාව දියුණු කර ඒමගින් ප්‍රයෝජනවත් ලක්ෂණ වචිනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිෂ්පාදනයන් ඇති කර පිටරටවලට පවා යැවීමට බැරිකමක් නැහැ. මා මේ යෝජනාව ඉදිරිපත් කළේ ඒ නිසයි. වැඩි වියදමක් නැතිව පහසුවෙන්ම හණ නිෂ්පාදන පිටරටවලින් ලබා ගන්නට පුළුවන්කම තිබෙන නිසා මා කියන කාරණය පිළිබඳව හුඟදෙනෙක් නොයෙක් අන්දමට කල්පනා කරන්නට පුළුවන්. පහසුවෙන් විදේශීය දේවල් ලබා ගන්නට පුළුවන්කම තිබියදී මෙවැනි දෙයක් කියන්නේ ඇයි කියා හිතන්නට පුළුවන්. ඒ නිසා මේ හණ පිළිබඳ යෝජනාව කාගේත් විමතිය හා කුතුහලය ඇති කරන යෝජනාවක්. එහෙත්, මේ රටේ ආර්ථික දියුණුව ගොවි කර්මාන්තය මත රඳා පවතිනවා යයි කිය හැකි නමුත්, අපේ හැම දෙයක්ම ගොවි කර්මාන්තයටම සීමා කර ආර්ථික දියුණුව ඇති කර ගන්නට බැරිය කියන එකයි, මා හිතන්නෙ.

රජය මගින් කෙරෙන විශාල කම්හාන්ත සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී යමක් කියන්නට මා අදහස් කරන්නෙ නැහැ. මෙරට කම්හාන්තවලට අවශ්‍ය අමු ද්‍රව්‍ය බොහොමයක් පිටරටින් ගෙනෙන බව අපි දන්නවා. මා කලින් මතක් කර දුන්නා මේ ගරු සභාවට, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යන පේස කම් මධ්‍යස්ථානවලට අමු ද්‍රව්‍ය ගෙන්වනු ලබන්නේ පිටරටින් බව. එම නිසා අපි කොපමණ පේස කම් මධ්‍යස්ථාන පිහිටුවාගෙන කටයුතු කරගෙන ගියත්, අපි බලාපොරොත්තුවන තරම් ලාභයක් ප්‍රයෝජනයක් එවායින් ලැබෙනවා යයි හිතන්ට ඉඩක් නැහැ. ඕනෑම කර්මාන්තයක් අපි බලාපොරොත්තු වන තරමට හෝ ඊටත් වඩා දියුණු කරගත හැක්කේ ඒ කම්හාන්තය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය මෙරටින්ම සොයා ගත හැකි නම් පමණයි. හණ අපට ලැබී තිබෙන ස්වාභාවික දායාදයක්. දුප්පත් මනුෂ්‍යයන්ගේ ඉඩම්වල ඉබේ වැවී තිබෙන, එදත්-අදත් දුප්පතාට පිහිට වී තිබෙන, මේ හණ ගහට තැනක් ජාතික රජයෙන් ලැබෙයි කියා මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මේ යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්ට තවත් ගරු මන්ත්‍රීවරුන් ඇත කියා මා හිතනවා. එම නිසා මම මීට වඩා මේ සම්බන්ධයෙන් කථා කරන්ට අදහස් කරන්නෙ නැහැ.

දේශීය හණ භාණ්ඩ නිෂ්පාදනය සඳහා කම්හාන්තශාලා

දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් දැනට යම්කිසි පියවරක් ගෙන නැත්නම්, මේ ගස වැවීම සම්බන්ධයෙනුත්, ඒ කෙඳි ආදියෙන් යාන්ත්‍රික ක්‍රමයට ප්‍රයෝජන ගැනීම සම්බන්ධයෙනුත්, පර්යේෂණ ඇති කළ යුතුව තිබෙනව. අපේ විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනවල ආධාරයෙන් පරීක්ෂණ පවත්වා ආරම්භයක් වශයෙන් මේ ගස බහුලව වැඩෙන ප්‍රදේශවල කම්හාන්ත ශාලා පිහිටුවන්ට ඕනෑ. එසේ කිරීමෙන් සැලකියයුතු සංඛ්‍යාවකට රැකී රක්ෂා සැපයීමටත් හැකිවෙනවා ඇත කියා මා විශ්වාස කරනව. මේ යෝජනාව මේ ගරු සභාවේ සැලකිල්ලට ඉදිරිපත් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

අ. භා. 3.50

**ඩී. බී. විජේතුංග මයා.** (උඩුනුවර)
*(திரு. டீ. பி. விஜேதுங்க—உடுநுவர)*
(Mr. D. B. Wijetunga—Udunuwara)

ගරු කථානායකතුමනි, හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කිරීමටයි, මා නැගී සිටියේ. එය ස්ථිර කිරීමට පෙර ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කළ යුතුයයි මා හිතනව. හඟුරන්කෙත මන්ත්‍රීතුමාගේ යෝජනාව ගැන කල්පනාකාරීව බලන විට පෙනී යනවා, එතුමා එයින් අදහස් කරන්නේ හණ ගස ගැන පමණක් නොවන බව. ලංකාවේ ස්වභාවයෙන් වැඩෙන අමු ද්‍රව්‍ය, මහජනයාගේ කිසිම උත්සාහයක් නැතිව ගල්පරවල ඉබේ වැඩෙන අමු ද්‍රව්‍ය ආදියෙන් ප්‍රයෝජන ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කිරීමයි, එතුමාගේ අදහස. තමුන්නාන්සේ දන්නව, හණ ගස වැඩෙන්නෙ ගල් පරවල බව. හණ වැනි මහජනයාගේ කිසිම උත්සාහයක් නැතිව වැඩෙන අමු ද්‍රව්‍ය බොහොමයක් තිබෙනව. ඒවාට පොහොර දමන්ට වුවමනා නැහැ; වතුර වත් කරන්ට වුවමනාවක් නැහැ; කාණු කපන්ට වුවමනාවක් නැහැ; නිරායාසයෙන් වැඩෙනවා. හඟුරන්කෙත මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ දහස් ගණන් හණ ගස් තිබෙනව. මේ අමු ද්‍රව්‍ය ප්‍රයෝජනයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේතුංග මයා.]

ගනිමින් ලංකාවේ මහජනයාගේ ආර්ථික තත්ත්වය දියුණු කිරීම සඳහාත් පිට රටින් අමු ද්‍රව්‍ය ගෙන්වීමට කාබාසිනියා කරන විදේශ විනිමය රැක ගැනීමට මේ ගැන පරීක්ෂණ පැවැත්වීම ජාතික රජයේ යුතුකමක් යයි මා කල්පනා කරනව. ගම්බද ජන්දදායක කොට්ඨාශ ගැන කථා කරන විට කිව යුතු කරුණු රාශියක් තිබෙනවා. මේ විධියේ යෝජනාවක් සමහර විට මේ ගරු සභාවේ විචිකිච්ඡාවට භාජන වන්නට පුළුවනි. හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ මේ හණ යෝජනාව කුමක් දැයි සමහර විට සමහර ගරු මන්ත්‍රීවරුන්ට විචිකිච්ඡාවක් ඇති වන්නට පුළුවනි. මෙම හණ ගස උඩරට පළාත්වල ගල් පරවල මහජනයාගේ උත්සාහයක් නැතිව නිරායාශයෙන් වැඩෙන බව මා කියන්නට කැමතියි. ස්වභාව ධර්මයේ වරප්‍රසාදයෙන් ඉබේ වැඩෙන හණ ගස ගැන හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාමත්ම කාලෝචිතයි.

ගරු කථානායකතුමනි, වර්ෂයකට තුන් ලක්ෂ පණස් දාහක් මේ රටේ උපදින අතර මිය යන්නේ පණස් දාහක් පමණයි. ඒ අනුව වර්ෂයකට වැඩි වන ජනගහණය තුන් ලක්ෂයයි. ළමයකු අවුරුදු 19 ක් නැත්නම් 20 ක් වන විට රක්ෂාවක් සොයනවා. පාඨශාලාව හැර යන ළමයා දෙමව්පියන්ට බරක් නැතිව ජීවත් විය යුතු නම් ඔහු කර්මාන්තයකට යොමු කරන්නට ඕනෑ. හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් මේ රටේ කොයි තරම් අමු ද්‍රව්‍ය තිබෙනවාද? විදේශ විනිමය ආරක්ෂා කර ගැනීමටත්, රට සංවර්ධනය සඳහා මුදල් ටිකක් රැස් කර ගැනීමටත් හණ ගස කුමන විධියේ කර්මාන්තයකට පරිවර්තනය කළ යුතුද යන්න ගැන හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගෙන් නොකියැවුණු කාරණා කීපයක් ඉදිරිපත් කරමින් ඒ යෝජනාව ස්ථිර කිරීමට මා අදහස් කරනවා.

ගරු කථානායකතුමනි, මේ හණ ගස ගැන කල්පනා කරන විට මට මතක් වන්නේ දුම්බර පැදුරුයි. තමුන්නාන්සේ දුම්බර පැදුරු දක ඇතැයි මා හිතනවා. ඒවා ඉතාමත් ලස්සනට වියා තිබෙනවා. ඒවායේ පාට මැකෙන්නේ නැහැ. ඒ පැදුරු බොහෝ කාලයක් පාවිච්චි කරන්නට පුළුවනි. ඒ පැදුරු වියා තිබෙන්නේ හණ නූල්වලිනුයි. හඟුරන්කෙත පමණක් නොව තෙල්දෙණිය, උඩදුම්බර, ඌරුගල, යන ප්‍රදේශයන්හි ගල් පරවල හණ ගස නිරායාශයෙන් වැවෙනවා. මේ හණ ගස්වල නූල් ගෙන ඒ කර්මාන්තකාරයන් පැරණි ක්‍රමයටයි, පැදුරු වියන්නේ. මේක වැදගත් කාරණයක්. මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා හිටියා නම් මා කැමතියි. දැනට ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව තිබෙන්නේ එතුමාගේ අමාත්‍යාංශය යටතේයි. හණ ගස පමණක් නොව හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් උත්සාහයක් නැතිව ඉබේ වැවෙන අමු ද්‍රව්‍ය ගැන අප කල්පනා කරන්නට ඕනෑ. කිසියම් කමිටුවක් හෝ සුළු දෙපාර්තමේන්තුවක් හෝ ඇති කොට ඒවා ගැන පර්යේෂණ පවත්වන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් මේ හණ ගසේ ඉතිහාසයක් තිබෙනවා. එදා සිංහල රජ කාලේ මේ හණ ගසේ කෙඳිවලින් නොයෙකුත් භාණ්ඩ සාදා ගත්තා. අදත් උඩරට ප්‍රදේශවල සමහර ගොවීන් හණ ගසෙන් පිත්තක් කපා වේලා ලණු අඹරා ගී භාන කොට ඒ ලණු හරකුන්ගේ බෙල්ලේ බඳිනවා. ඒ වගේම කුඩා පැල් පත්වල වහලවල් සෙවිලි කිරීමේදී පොලු බැඳීම සඳහා හණ ලණු පාවිච්චි කරනවා. නමුත් තවම හණ ගසෙන් නියම ප්‍රයෝජනය ගැනීම සඳහා පර්යේෂණ පවත්වා නැහැ. පර්යේෂණ පවත්වා හණ ගසෙන් නියම ප්‍රයෝජනය ලබා ගැනීම පිළිබඳව ගැමියන්ට නියම උපදෙස් දිය යුතුයි. හණ පිති කපා වතුරේ දමා ඒවා පල් වුණායින් පසුව කෙඳි ලබාගෙන කලක් පවතින, අවුරුදු 25 ක්, 30 ක් පවතින භාණ්ඩ නිපදවන්නට පුළුවනි. හඟුරන්කෙත, තෙල්දෙණිය, උඩදුම්බර, ලග්ගල, නුවරඑළිය කොට්ඨාශවලත් ඌරුගල හා මතුරට ප්‍රදේශවලත්, වලපනේ ප්‍රදේශයේ කොටසකත් ගල් පරවල කිසි උත්සාහයක් නැතිව නිරායාශයෙන් ම හණ ගස් දහස් ගණනින් වැවී තිබෙනවා. ඒවායේ අතු වැඩක් නොගෙන කුණු වී යනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශීය හණ භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්තශාලා

හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා කිවාක් මෙන්, පැල්පත්වල ජීවත් වන පවුල් කීපයකට අද හණ කර්මාන්තය සීමා වී තිබෙනවා. එය ඉතාමත්ම කනගාටුදායක කාරණයක්. කිසිම සාත්තුවක් නැතිව නිරායාශයෙන්ම වැඩෙන හණ ගසෙන් ධනයක් නිපදවන්නට පුළුවන්කම තිබෙනවා. ඒවා කපා කුණු කර කෙඳි ලබාගෙන බඩු භාණ්ඩවලට පරිවර්තනය කිරීම සඳහා කර්මාන්තයක් ආරම්භ කිරීම ඉතාමත් වැදගත් කාරණයක් බව කියන්න කැමතියි. මා නියෝජනය කරන උඩුනුවර ඡන්දදායක කොට්ඨාශයේත් මේ විධියේ අමුද්‍රව්‍ය රාශියක් තිබෙන බව සඳහන් කරන්න පුළුවනි. හණ ගස පමණක් නොව ඒ වගේම ප්‍රයෝජනවත් වෙනත් ගස් ගණනාවක්ම උඩුනුවර ප්‍රදේශයේ තිබෙනවා. මේ ගස්වලින් ලබා ගතහැකි අමුද්‍රව්‍යවලිනුත් කරන්න පුළුවන් දේවල් තිබෙනවා. වැටකෙයියා, පන්, උණගස් වැනි දේ නොයෙක් දේවල් නිපදවීම සඳහා උපයෝගි කර ගන්න පුළුවන්කම තිබෙනවා. මේ ගස් වර්ෂාව අධික පළාත්වල ඉතාමත් හොඳින් වැවෙනවා. ඒ සඳහා කිසිම අමතර මහන්සියක් වෙන්න වුවමනාවක් නැහැ. නිරායාසයෙන්ම වගා වන මේ ගස්වර්ග ඇතැම්විට ගොවීන්ට හිරිහැරදායකයි. ඒ නිසා වරින්වර ඒවා කපා විනාශ කර දමන්නත් සිදු වෙනවා. කුඹුරු අයිනේ ඉබේටම වාගේ වැවෙන ඇතැම් ගස්වර්ග කපා විනාශ කර දමන්නේ ඒවා එසේම තිබෙන්නට හැරීමෙන් ගොයමත් නිසරු වීමට ඉඩ තිබෙන නිසයි. ඒ නිසා ඒ විධියේ ගස්වලින් වැඩක් ගන්න උත්සාහ කිරීම හොඳ දෙයක් බව මතක් කරන්න ඕනෑ. ඒවායින් ලැබෙන අමුද්‍රව්‍යවලින් යම් යම් භාණ්ඩ නිෂ්පාදනය කරන්න පුළුවනි. ඒ සඳහා අවශ්‍ය පර්යේෂණ සහ අත්හදා බැලීම් වහ වහා ආරම්භ කරන්න ඕනෑ. මෙවැනි වැඩ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් පටන් ගන්න පුළුවනි.

ගම්බද ප්‍රදේශවල සුළු කර්මාන්තවල යෙදෙන, ඒ මඟින් තමන්ගේ ජීවනෝපාය සලසා ගන්න, බොහෝ දෙනෙක් ඉන්නවා. එවැනි පවුල්වලින් හතර පස් දෙනා බැගින් තෝරාගෙන ක්‍රමානුකූලව සුළු කර්මාන්ත පටන් ගන්න පුළුවනි. තෝරා ගනු ලැබූ තරුණ තරුණියන්ට ඒ සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දිය යුතුයි. ඒ සඳහා කර්මාන්තශාලා ඇති කර වැඩ පටන් ගන්න ඕනෑ. එයින් ගම්බද තරුණ තරුණියන්ගේ රැකියාවන් නැතිකමේ ප්‍රශ්නයත් ඉතා ඉක්මණින් තරමකටවත් විසඳන්න ඉඩක් ලැබෙනවා. එපමණක් නොව, ලංකාවේ මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීමත් සිද්ධ වෙනවා.

හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ තවත් වැදගත් අංශයක් තිබෙනවා. එතුමා හණ කර්මාන්තය ගැන පමණක් කල්පනා කළේ නැහැ. එසේම එතුමා තමන් නියෝජනය කරන කොට්ඨාශය ගැන පමණක් කල්පනා කළේත් නැහැ. තදාසන්න ආසනවලත් අවශ්‍යතා ගැන එතුමා කල්පනා කර තිබෙන බව පෙනෙනවා. අපේ ප්‍රදේශවලත් අමු ද්‍රව්‍ය රාශියක් තිබෙනව. ඒවා සල්ලිවලට පරිවර්තනය කරන්න පුළුවනි. තෙල්දෙණිය ආසනය ගැන කල්පනා කර බලමු. හඟුරන්කෙත ආසනයට අයිති ප්‍රදේශයේ හණ වැවෙනවා. ඒ වගේම තෙල්දෙණිය ආසනයට අයිති ප්‍රදේශයේ ඩොලමයිට් නමින් හඳුන්වනු ලබන හුණුගල් වර්ගයක් බහුල වශයෙන් තිබෙනවා. මේවා කඩා යන්ත්‍රවලට දමා කුඩු කර රසායන ද්‍රව්‍ය සමග මිශ්‍ර කර ගත්තොත් යම් යම් වැදගත් දේවල් නිපදවන්න පුළුවන වෙනවා ඇති. ඒ නිසා කඳුකර ප්‍රදේශයේ තිබෙන අමුද්‍රව්‍ය ස්වභාව ධර්මයා විසින් අපට දෙන ලද දායාදයන් හැටියට සලකා නගරබද ප්‍රදේශවලම කර්මාන්ත ඇති කිරීමේ උත්සාහය ගම්බද ප්‍රදේශ කෙරෙහිත් දක්වන ලෙස කර්මාන්ත භාර ගරු ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා.

පිටිසර පළාත්වල නිරායාසයෙන් වැඩෙන පැළෑටිවලින් ලබා ගතහැකි අමුද්‍රව්‍යවලින් සහ කඳුකර ප්‍රදේශවල පොළොවෙන් ලබා ගත හැකි ඩොලමයිට් නමැති හුණුගල් වැනි දේවලිනුත් නොයෙක් කර්මාන්ත ඇති කරන්න පුළුවනි. හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළාක් මෙන්, හණ ගස්වලින් ලැබෙන ප්‍රයෝජන අප්‍රමාණයි. ඒ නිසා එතුමා ඉදිරිපත් කළ මේ යෝජනාව මා ඉතාමත් සන්තෝෂයෙන් සවිර කරන්න කැමතියි. එසේම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේතුංග මයා.]

මේ යෝජනාවට මේ ගරු සභාවේ සම්පූර්ණ සම්මුතිය ලැබේවායිද, ගරු කර්මාන්ත ඇමතිතුමාගේ අවධානය යොමුවේවායි ද, ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

රැස්වීම අ. භා. 4.30 වන තෙක් තාවකාලිකව අත්සිටුවනවා. නැවත රැස් වන විට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කථානායක තැන්පත් සී. එස්. ෂර්ලි කොරයා මහතාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

இதன்படி அமர்வு பி.ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு மீண்டும் ஆரம்பமாயிற்று. உப சபாநாயகர் [திரு. சீ. எஸ். ஷேர்லி கொறயா] தலைமை தாங்கினார்.

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed,* MR. DEPUTY SPEAKER [MR. C. S. SHIRLEY COREA], *in the Chair.*

**බී. එච්. බණ්ඩාර මයා.** (බදුල්ල)
*(திரு. பி. எச். பண்டார—பதுளை)*
(Mr. B. H. Bandara—Badulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව අනුමත කරන අතරම, ඒ පිළිබඳව මගේ අදහස් සවල්පයකුත් ගරු සභාව ඉදිරිපිට තැබීමටයි මා අදහස් කරන්නෙ. විශාල ආදායමක් ලබාගත හැකි මේ රටේ ඉබේ වැවෙන, ඒ වාගේම බහුල වශයෙන් වැවෙන, හණ ගස්වලින් නියම ප්‍රයෝජනය ලබාගැනීම සඳහා හඟුරන්කෙත හණ කර්මාන්ත ශාලාවක් පිහිටුවිය යුතුය යන්නයි මේ යෝජනාවෙන් අදහස් කරන්නෙ. මේ යෝජනාව අප අනුමත කරනවා. ඒ වාගේම හඟුරන්කෙත ප්‍රදේශයේ එවැනි කර්මාන්ත ශාලාවක් පිහිටුවනවා නම් ඒ ගැනත් අප සන්තෝෂ වෙනවා. ඒ සමගම, හඟුරන්කෙත ප්‍රදේශයේ වාගේම හණ ගස් බහුල වශයෙන් ඉබේ වැවෙන තවත් විශාල ප්‍රදේශ තිබෙන බව මා මතක් කරන්නට සතුටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඌව ප්‍රදේශය ගැන මා සඳහන් කරන්නට කැමතියි. හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා රජයේ සේවකයකු වශයෙන් ඌව ප්‍රදේශයේ සේවය කර තිබෙනවාය කියා මා සිතනවා. ඒ නිසා එතුමාත් දන්නවා ඇති, ඌව ප්‍රදේශයේ මේ හණ ගස් විශාල වශයෙන් ඉබේටම වැවෙන බව. හඟුරන්කෙත ප්‍රදේශයේ හණ කර්මාන්ත ශාලාවක් පිහිටුවනවාත් සමගම ඌව ප්‍රදේශයේ රැකීරක්ෂාවක් නැතිව සිටින විශාල පිරිස නිසාත්, ඌව ප්‍රදේශයේ විශාල වශයෙන් ඉබේ වැවෙන හණ ගස්වලින් ප්‍රයෝජනය ලබා ගැනීම සඳහාත් එවැනිම කර්මාන්ත ශාලාවක් ඌව ප්‍රදේශයේත් පිහිටුවීම පිළිබඳව කර්මාන්ත ඇමතිතුමාගේ විශේෂ සැලකිල්ල යොමු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හණගස් පමණක් නොවෙයි, කිසිම මහන්සියක් නැතිව වැවිය හැකි, ඒ වාගේම ඉබේම වැවෙන, බොහෝ ප්‍රයෝජන ලබාගත හැකි තවත් පැළෑටි විශාල සංඛ්‍යාවක් මේ රටේ තිබෙන බව අප දන්නව. අපේ පර්යේෂණායතන ඒ පිළිබඳව එතරම් උනන්දුවක් දක්වන්නෙ නැහැ. මේ පැළෑටි සම්බන්ධව කල්පනා කර ඒවායින් නියම ප්‍රයෝජනය ලබාගත හොත් අද නොයෙක් නොයෙක් ද්‍රව්‍ය සඳහා පිටරට ඇදී යන අපේ විදේශ විනිමය විශාල ප්‍රමාණයක් මේ රටේම ඉතිරි කර ගැනීමට පුළුවන් වෙනවා. මේ හණ කර්මාන්තය වාගේම අපට ආරම්භ කළ හැකි මේ රටට ප්‍රයෝජනවත් තවත් නොයෙක් විධියේ කර්මාන්ත රාශියක් තිබෙන බව මා මතක් කරන්නට සතුටුයි. අපේ ප්‍රදේශවල—බිබිල වැනි ප්‍රදේශවල—බහුල වශයෙන් වැවෙන බීඩි දුම්කොළ ගැන මා දන්නවා. කිසිම මහන්සියක් නැතිව, කාගේවත් උදව්වක් නැතිව මේ බීඩි දුම්කොළ බහුල වශයෙන් ඒ ප්‍රදේශවල වැවෙනවා. ලංකාවට බීඩි දුම්කොළ ගෙන්වීම සඳහා විශාල මුදල් සම්භාරයක් ඉන්දියාවට ඇදී යන බව අප දන්නවා. ඒ නිසා මේ හණ කර්මාන්තය දියුණු කිරීමට කල්පනා කරනවාත් සමගම ස්වභාව ධර්මයාගේ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

දායාදයක් හැටියට අපේ රටේ ඉබේම බහුල වශයෙන් වැවෙන මේ බිඩි දුම්කොළ වැනි ද්‍රව්‍යවලින් ද නියමම ප්‍රයෝජනය ලබා ගැනීම ඉතා අව්‍ය දෙයක් බව මා කර්මාන්ත ඇමතිතුමාට මතක් කරනවා. මේ ගැන ගරු ඇමතිතුමාගෙ සැලකිල්ල යොමු කළොත්, විශාල විනිමය ප්‍රමාණයක් මේ රටේ ඉතිරි වෙනවා වාගේම, රැකීරක්‍ෂා නොමැති ඉමහත් පිරිසකට රැකීරක්‍ෂා සැපයීමේ අවසථාවක්ද සැලසෙනවා ඇති. මා නියෝජනය කරන බදුලු ප්‍රදේශයෙ කන්දෙඅරාව නමැති ගමේ හණ කර්මාන්තයෙන් ජීවත් වන පවුල් 60ක් පමණ ඉන්නව. රජයේ කිසිම ආධාරයක් නැතිව තම දැනුමේ හැටියට ස්වොත්සාහයෙන් හණ කර්මාන්තයෙහි යෙදී එමගින් නොයෙක් විධියෙ භාණ්ඩ නිෂ්පාදනය කරන අයයි, ඒ. ස්වභාව ධර්මයෙ දායාදයක් වශයෙන් ඉබේ වැවෙන හණ ගසින් නියම ප්‍රයෝජනය ලබා ගැනීම පිණිස කර්මාන්ත ශාලා පිහිටුවා එවැනි අයට රජයේ ආධාරය ලබා දුන්නොත් රටට විශාල සේවයක් සැලසෙනවා ඇති.

මේ අවස්ථාවේදී ගරු කර්මාන්ත ඇමතිතුමාට කරුණක් මතක් කරන්ට ඕනැ. කොළඹ වැනි නගරාසන්න ප්‍රදේශවලත්, උතුරු නැගෙනහිර පළාත්වලත් කර්මාන්ත ශාලා පිහිටුවීමයි, පුරුද්දක් වශයෙන් කර ගෙන එන්නෙ. සිමෙන්ති කර්මාන්ත ශාලාව, කඩදාසි කර්මාන්ත ශාලාව, වැනි විශාල කර්මාන්ත ශාලා පිහිටුවා තිබෙන්නෙ ඒ ආකාරයටයි. නමුත් ගම්බද ප්‍රදේශවල එවැනි කර්මාන්ත ශාලා පිහිටුවීමේ පුරුද්දක් මෙතෙක් ඇති වී නැහැ. මා ප්‍රකාශ කරන්න ඕනැ, ඌව ප්‍රදේශයෙ—ආසන 10 ක් පමණ තිබෙන ඌව ප්‍රදේශයෙ—මොනම අන්දමක හෝ කර්මාන්ත ශාලාවක් නොමැති බව. ඒවගෙම, මා මතක් කරන්ට ඕනැ, ඌව ප්‍රදේශය රැකීරක්ෂා නොමැති අය විශාල සංඛ්‍යාවක් සිටින ප්‍රදේශයක් බව. ඒ අයට ජීවත් වෙන්ට ක්‍රමයක් නැහැ. අඩු තරමින් තේ වත්තකටවත් ඇතුළු වෙලා ජීවත් වෙන්ට ක්‍රමයක් නැහැ. මේ රටේ සිටින රැකීරක්ෂා නොමැති එවැනි විශාල සංඛ්‍යාවකගෙ රැකීරක්ෂා නොමැතිකමේ ප්‍රශ්නය විසඳීම සඳහා තමයි, පසුගිය කාලයෙ අපි උද්ඝෝෂණය කර සෑහෙන ප්‍රමාණයක් ඉන්දියානුන් මෙරටින් පිට කරන්න සූදානම් කළේ. එම කාර්යය තවම ඉටු වී නැහැ. මෙතෙක් නගරබදට පමණක් සීමා වුණු කර්මාන්ත ශාලා පිහිටුවීමේ ප්‍රතිපත්තිය වෙනස් කර ගම්බද ප්‍රදේශවලත් කර්මාන්ත ශාලා පිහිටුවා ගැමි ජනතාවගේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා සැලකිල්ල යොමු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා විශේෂයෙන් ඉල්ලා සිටිනව. මේ ගරු සභාව තුළදී පමණක් නොවෙයි, වෙනත් නානාවිධ අවසථාවලදිත් ගම්බද ප්‍රදේශවල කර්මාන්ත ශාලා පිහිටුවීමෙහි ඇති අගය පිළිබඳව අපි නොයෙකුත් අන්දමින් අදහස් ප්‍රකාශ කර තිබෙනව. නමුත් ඒ ගැන මෙතෙක් සැළකිල්ල යොමු කර ඇති බවක් පෙනෙන්ට නැහැ. එම නිසා මා නැවත වරක් මතක් කරනව, නගරය ගැන පමණක් ඇස් යොමු කිරීම ටිකකට නවත්වා ගම්බද ප්‍රදේශ ගැනත් සැලකිල්ල යොමු කරන්ටය කියා. මේ රටේ රැකීරක්ෂා නොමැත්තවුන්ගෙ සංඛ්‍යාව දිනපතාම වැඩි වෙනව ; ඒ ප්‍රමාණය ලක්ෂ ගණනින් ඉහළ යනව. ගම්බදවත් හොඳ කර්මාන්ත ශලා ඇති කර යම් දියුණුවක් ඇති නොකළොත් අපේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට මොනම ආණ්ඩුවකටත් පුළුවන් වන්නෙ නැහැ.

අපි දන්නව, අපේ ප්‍රදේශවල විශාල වශයෙන් පළතුරු වැවෙන බව. අඹ, අන්නාසි වැනි පළතුරු වර්ග අපේ ප්‍රදේශවල බෙහෙවින්ම වැවෙනව. ඒවා සමහරවිට ඉබේම ගස් යට වැටී කුණු වී යනව. එසේ වුණාම ඒවායින් රජයටවත් මහජනයාට වත් ප්‍රයෝජනයක් ලබා ගැනීම අසීරුයි. එමනිසා රජය මගින් කර්මාන්තශාලා ඇති කර මහජනතාවට ඒවා අලෙවි කර ගැනීම පිණිස පහසු ක්‍රම ඇති කළොත්, පළතුරු වගාව ගැන මහජනතාව තව තවත් උනන්දු වෙනවාට කිසිම අනුමානයක් නැහැ. එම නිසා, හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුමත කරන මෙම අවස්ථාවේදී නැතිනම් ඒ පිළිබඳව සාකච්ඡා කරන මෙම අවස්ථාවේදී මෙම ගරු සභාවේ සැලකිල්ල යොමු කරන්න ඕනැ ස්වභාව ධර්මයේ දායාදයන් වශයෙන් මේ රටේම හැදෙන-වැඩෙන පැළෑටි වර්ග වලින් ප්‍රයෝජනය ලබා ගැනීමට අවසථාව සලසා දීම ගැන. මෙම අමු ද්‍රව්‍යය ගැන පර්යේෂණ පවත්වන ආයතනය මේ පැළෑටි වර්ග පිළිබඳවත් පර්යේෂණ කර බැලු

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

වොත් ගම්බද පළාත්වල ප්‍රයෝජනයට ගත හැකි පැලෑටි වර්ග මෙන්ම ඛනිජ වස්තූන්ද ඇති බව පෙනී යනවාට කිසිම සැකයක් නැහැ. එම නිසා ගම්බදව ඉබේට වැවෙන පැලෑටි වර්ග මෙන්ම ඛනිජ වස්තූන් ගැනත් සොයා බලා, එම ද්‍රව්‍යවලින් නිෂ්පාදන අරඹා ඒවා දියුණු කළොත් එයින් මේ රටට ප්‍රයෝජනයක් සැලසෙනවාත් සමගම රැකිරක්ෂා නැතුව සිටින ලක්ෂ සංඛ්‍යාත මහජනතාවගේ රැකිරක්ෂා ප්‍රශ්නයත් ඉබේටම විසඳෙන බව මතක් කරන්න කැමතියි. එම නිසා, මෙම යෝජනාව ඉතාමත් සන්තෝෂයෙන් අනුමත කරන අතර විශේෂයෙන්ම ඌව ප්‍රදේශයේත් ඉතාමත් සරුවට වැඩෙන මෙම ගසින් කර්මාන්ත ඇරඹුවොත් ගම්බද මහ ජනතාව හණ ගස වැවීමට උනන්දු වෙනවාට කිසිම සැකයක් නැහැ.

හණ ගසින් නොයෙකුත් විධියෙ භාණ්ඩ නිෂ්පාදනය කරන්න පුළුවනි. එම ගස කොළ, කෙඳි ලබා ගැනීමටම පමණක් නොවෙයි වෙනත් නොයෙකුත් කර්මාන්තයන් සඳහා යොදා ගන්නත් පුළුවනි. සමහර අවස්ථාවලදී, අප දක තිබෙනවා, සබන් කෑල්ලක් මිලදී ගන්නට තරම් වත්කමක් නැති දුප්පත් අය හණ ගසේ කොළවලින් පෙන ලබාගෙන එය රෙදි සේදීම සඳහා යොදා ගන්නා බව. ගම්බද දුප්පත් උදවිය රෙදි සේදීම සඳහා හණ ගසේ කොළ යොදා ගන්නවා නම් එයින් අපට පෙනී යනවා හණ ගසේ කොළවලින් සබන් වැනි ද්‍රව්‍ය නිෂ්පාදනය කළ හැකි බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හණ ගසින් ප්‍රයෝජනය ලබා ගැනීම පිණිස හණ කර්මාන්තය ආරම්භ කරනවා වාගේම, මම මුලින්ම සඳහන් කළ අන්දමට හණ ගස වාගේ ඉබේ වැවෙන බීඩි දුම්කොළ ගස ගැනද සැලකිල්ල යොමු කිරීම ඉතාමත් වැදගත්. ඇත්ත වශයෙන්ම බිඩි දුම්කොළ ගසත් ඉබේටම කැලේ වැවෙනවා. එම නිසා පිටරටින් බීඩි දුම්කොළ ගෙන්වීම නතර කොට මේ රටේ දුම්කොල ගෙන්වීම නතර කොට මේ රටේ මහජනතාවට යම්කිසි පහසුකමක් සලසා දුන්නොත් බීඩි කොළ වවන්නට, මෙරටට අවශ්‍ය බීඩි කොළ සම්පූර්ණ ප්‍රමාණයම මෙරටින්ම සපයා ගත හැකිවා පමණක් නොවෙයි, පිටරට යැවීමට පවා බිඩි කොළ මෙරටේම වගා කර ගන්නට පුළුවනි. එම නිසා මෙම හණ ගස පිළිබඳ යෝජනාව එක්කම මේ අදහසුත් ගරු කර්මාන්ත ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කරවන අතරම නගරයේම පමණක් කර්මාන්ත ඇති කිරීමේ සිතුවිල්ලද ටික කට ඉවත් කර දමා ගම්බද ප්‍රදේශයේ මහජනයාගේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳාලීම සඳහාත් එම කර්මාන්ත ප්‍රතිපත්තිය ගම්බද දක්වා පුළුල් කරන්නටය කියා මතක් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනව.

අ. භා. 4.45

**ෆේස්ටස් පෙරේරා මයා.** (වෙන්නප්පුව)

*(திரு. பெஸ்ற்றஸ் பெரேரா—வென்னப்புவ)*

(Mr. Festus Perera—Wennappuwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හණ කර්මාන්තශාලා පිහිටුවීම පිළිබඳ යෝජනාව උඩ වචන දෙක තුනක් කථා කිරීමට මට ඉඩ ප්‍රස්ථාව ලබාදීම ගැන මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වන අතර මෙම හණ කර්මාන්තය මගේ කොට්ඨාශයේද සෑහෙන තත්ත්වයක තිබෙන බව පළමුවෙන්ම සඳහන් කරන්න කැමතියි. එසේ වුණත් කනගාටුවට කාරණයක් වී තිබෙන්නෙ, හණ කර්මාන්තයේ විශාල දෙනෙකු යෙදී සිටියත් තවමත් එම කර්මාන්තය දියුණු තත්ත්වයකට පත් වී නැති බව පෙනෙන්නට තිබීමයි. අපේ පළාතේ—විශේෂයෙන්ම මගේ කොට්ඨාශයේ සින්දාත්‍රිය කියන ප්‍රදේශයේ—හණ කර්මාන්තයෙන් ජීවත් වන පවුල් සිය ගණනක් සිටින බව මට කියන්නට පුළුවන්. අද ඒ පවුල් ඉතාමත් දුඃඛිත තත්ත්වයක සිටින බව මම සඳහන් කරන්නට කැමතියි. ඊට හේතුව ඒ හණවලින් නිපදවන නූල් අලෙවි කර ගැනීමට බැරි තත්ත්වයක් ඇති වී තිබීමයි. ඒ දුගී පවුල් වෙනුවෙන් එම හණ නූල් අලෙවි කර ගැනීමට මම පසුගිය කාලයේදී විශාල ප්‍රයත්නයක් දැරුවා. නමුත් තවමත් ඒවා අලෙවි කර ගැනීමට බැරි වී තිබෙනවා. හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් අබයගුණසේකර මයා.) විසින් ඉදිරිපත් කර ඇති මේ ඉතාමත්ම කාලෝචිත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෝජනාව පිළිගෙන ගරු ඇමතිතුමා හණ කර්මාන්තය පිළිබඳව යම්කිසි විධිමත් වැඩ පිළිවෙළක් ඇති කරාවියයි මම කල්පනා කරනව. එසේ ඇති කළ විට හණ කර්මාන්තයෙන් යැපෙන පවුල්වලට විශාල සෙතක් සැලසෙනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනව. ඒ නිසා හණ කර්මාන්තය දියුණු කරන අවස්ථාවේදී වෙන්නප්පු කොට්ඨාශයේ මා සඳහන් කළ ප්‍රදේශයේ හණ කර්මාන්තයෙන් යැපෙන පවුල්වලට සහනයක් සැලසේයයි ද, අඩු තරමින් ඒ අය දැනට නිපදවා ඇති හණ නූල් අලෙවි කර ගැනීමට ක්‍රමයක් ඇති කරාවියයිද, මම බලාපොරොත්තු වෙනව. ගරු කර්මාන්ත ඇමතිතුමා ඒ ක්‍රමය සකස් කරන අවස්ථාවේදී අනෙක් අමාත්‍යාංශවලට පුළුවන්, ඒ හණ නූල් අලෙවි කර ගැනීමට යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කිරීමට. විශේෂයෙන්ම තැපැල් අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් ඇති කරාවියයිද මම බලාපොරොත්තු වෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හණ නූල් පිටරටින් ගෙන්වීමට විශාල මුදලක් වියදම් කරනව. නමුත් දැන් එය නවත්වා ඇති බව දැන ගන්නට තිබෙනව. හණ කර්මාන්තයට ධෛර්ය දීමක් වශයෙන්, ඒ කර්මාන්තය දියුණු කිරීමක් වශයෙන්, තැපැල් අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් වැඩ කටයුතු කරනවා ඇත යන්න අපගේ එකම බලාපොරොත්තුවයි. වෙනත් අමාත්‍යාංශවලටත් ඒ හණ නූල් විශාල වශයෙන් ගැනීමට ඉඩ ප්‍රස්තා තිබෙනව. එසේ කිරීමෙන් හණ කර්මාන්තයේ යෙදී සිටින ඒ පවුල්වලට විශාල සහනයක් ලැබෙනවා ඇත යන්න අපේ එකම විශ්වාසයයි. එම නිසා ගරු කර්මාන්ත ඇමතිතුමා, හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළිගෙන ඒ අනුව වැඩ පිළිවෙල සකස් කරන අවස්ථාවේදී හණ නූල් සම්බන්ධයෙනුත් ක්‍රියා කර අපේ පළාත්වල නිපදවා ඇති හණ නූල් අලෙවි කර ගැනීමට ක්‍රමයක් ලෑස්ති කර දෙනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ කථාව අවසාන කරනව.

අ. භා. 4.49

**විමලසේන මයා.**

*(திரு. விமலசேன)*

(Mr. Wimalasena)

I have very great pleasure in supporting this Motion. Those of us who represent constituencies in the Kandyan areas know the potentialities of the hemp industry. I think there are at least two to three hundred thousand acres of land up on the hill slopes where nothing else worthwhile grows. When the top soil is very, very poor and may not be more than an inch or two, rocky slopes come up and over these grow plants which cannot be put to any use. This plant too grows in abundance on these slopes. I am sure it is possible to get two to three hundred thousand acres in the Hewaheta, Maturata, Nuwara Eliya, Kotmale and Laggala areas. The plant grows also in the Uva Province. This can profitably be developed into a very lucrative industry. It will help conserve soil and water resources in those areas. There is no attention, whatsoever, needed for this plant. If a certain amount of attention is paid to the systematic cultivation of this plant, I am sure, within a very short period of time—two to three years—we could easily bring a hundred-thousand acres under hemp.

We are spending a very considerable amount of foreign exchange on the importation of gunny bags. It would become possible to save all that money here. It is unfortunate that hitherto little attention has been paid to investigate the possibilities of all the raw materials we have in this country, particularly the hemp plant. Exploiting these resources would also prevent the rush of educated young men from the villages to the towns in search of employment. I am sure the Hon. Minister of Industries has appreciated the fact that wherever possible suitable industries must be sited away from the towns to serve the rural areas. It is a policy that must be pursued with vigour, and soon. There are thousands of unemployed

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලසේන මයා.]

young men in the Kandyan areas. I am sure they can be very gainfully employed if the wealth of material those areas have is properly exploited.

It is relevant on a subject like this to refer to other possibilities in these areas. The hon. Member for Udunuwara referred to dolomite. Dolomite is available in inexhaustible quantities in Teldeniya, Kundasale, Talatuoya and Hanguranketa areas. There are inexhaustible supplies of dolomite, which can be the base for a fertilizer industry. Dolomite is required in large quantities for the tea, rubber, and even coconut industries. The supplies that are available so readily and in such large quantities should be made use of. The time has come when we must exploit the natural resources of this country.

In this connection it is pertinent to refer to the agitation by Members representing the Kandyan constituencies that Pallekelle Estate be acquired. This agitation has gone on for a number of years. Pallekelle Estate is situated in close proximity to the town of Kandy. We have asked that, after the acquisition of this estate, industries which can be established in those areas be started in Pallekelle.

I should like to recommend to the Hon. Minister of Industries the establishment in Pallekelle of a fertilizer project with dolomite as the base. I am sure it can be developed into a vast and profitable industry—one which can help to save for this country a large amount of foreign exchange.

It is also admitted that the waste products of petroleum should be utilized for chemical fertilizer. A factory for that purpose is to be started near the petrol refinery. Ceylon can have more than one fertilizer factory. In point of fact, Ceylon being basically an agricultural country, it is necessary that we should be self-sufficient in fertilizer as early as possible. To my mind, such self-sufficiency can be achieved without much effort if we exploit the natural resources of the country soon and with imagination. I should like to submit to the Hon. Minister of Industries that here we have the opportunity to exploit this valuable mineral which is available in those areas, and with the acquisition of Pallekelle Estate a fertilizer factory can be started there side by side with a hemp factory, which the hon. Member for Hanguranketa is asking the Government to open.

There is also the need to start other industrial ventures in those areas. Hitherto it has been the unfortunate practice to site all industrial ventures round about Colombo and in cities far away from the central region. It is necessary that this policy should be changed because we do not want our young men in the villages to rush to Colombo and other places in search of employment.

Pallekelle Estate is a very suitable locality for siting even a textile factory. The climate of Kandy, I am advised, is the best in Ceylon for bleaching and for all purposes connected with the manufacture of textiles. Therefore I appeal to the Hon. Minister to give his attention to this aspect as soon as possible, and also to start a textile factory in Pallekelle.

Kandy and its surrounding areas are well known for the manufacture of brassware and so on as cottage industries. I think it is possible to develop further our cottage industries. This industry itself is an art and the finished products are not second to any in the world. I feel this cottage industry should receive the immediate attention of the Government, and I am sure that the National Government will pay due attention to these aspects of industrialization which should be supplementary to the policy of development of agriculture in this country.

I have great pleasure in supporting the Motion moved by the hon. Member for Hanguranketa.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.1

**ටී. සිවසිතම්පරම් මයා. (වවුනියාව)**
*(திரு. ரி. சிவசிதம்பரம்—வவுனியா)*
**(Mr. T. Sivasithamparam—Vavuniya)**

கௌரவ உப சபாநாயகரவர்களே, கௌரவ ஹங்குறன்கெத்த பாராளுமன்ற உறுப்பினர் (திரு. ஜோஜ் அபயகுணசேக்கர) கொண்டு வந்துள்ள பிரேரணையை முற்றுக நான் ஆதரிப்பதுடன் இலங்கையிலே சணல் உற்பத்தியைப் பெருக்கவும், சணல் உற்பத்தியைப் பெருக்குவதால் இன்று எங்களுடைய நாட்டில் வேலையில்லாமலிருக்கும் எத்தனையோ இளைஞர்களுக்குத் தொழில் கொடுக்கும் வாய்ப்பை உருவாக்கவும், எங்களுடைய நாடு வெளி நாடுகளிலிருந்து—குறிப்பாக இந்தியாவிலிருந்து—பல இலட்சம் ரூபா பெறுமதியான சணல் உற்பத்திப் பொருள்களை இறக்குமதி செய்வதைத் தடுத்து நிறுத்தவும் தேசிய அரசாங்கத்தின் கௌரவமிக்க தொழில் அமைச்சரவர்கள் கவனமெடுக்க வேண்டுமென்றும் கேட்டுக் கொள்ளுகின்றேன்.

சணல், நாருக்காக, தும்புக்காக மாத்திரம் விளைவிக்கப்படும் ஒரு பொருளல்ல. இதை ஆங்கிலத்தில் 'leguminous' என்று சொல்வார்கள். வயல் நிலங்களில்—தோட்ட நிலங்களில்—பசளையைத் திரும்பவும் நிலத்துக்குக் கொடுப்பதற்காக பசளை காற்றினுலும் நீரினுலும் அப்புறப்படுத்தப்படாமல் தடுப்பதற்காக சணலைக் கமக்காரர்கள் விளைவிக்கின்றார்கள். ஹங்குறன்கெத்த பிரதேசத்தில் மாத்திரமல்ல, இலங்கையிலே வட மாகாணத்திலும் சணல் கூடுதலாக விளைவிக்கப்படுகின்றது. அங்கு விளைவிக்கப்படும் சணல் பசளைக்காகப் பாவிக்கப்படுகின்றதேயன்றி, அதிலிருந்து எடுக்கப்படும் நாரை உபயோகித்து சாக்கு, விரிப்பு போன்ற பொருட்களை உற்பத்தி செய்யும் முயற்சியில் இலங்கை இன்னமும் ஈடுபடவில்லை. முக்கியமான பொருளொன்று பிரயோசனப்படுத்தப்படாமல், எத்தனையோ இலட்சம் ரூபா பணத்தை—மூலதனத்தை—பெறுவதற்கான ஏற்பாடுகள் செய்யப்படாமல் இருப்பது குறித்து நான் மிகமிக வருந்துகின்றேன்.

வடக்கு மாகாணத்திலும், கிழக்கு மாகாணத்தின் தெற்குப் பகுதியிலும் எத்தனையோ ஆயிரக்கணக்கான ஏக்கர் நிலத்தில் வாழை நடப்படுகின்றது. வாழையிலிருந்து எடுக்கக்கூடிய நார் பலவிதங்களில் பயன்படக் கூடிய ஒரு பொருள். இந்தியாவில் வாழை நாரிலிருந்து எத்தனையோ விதமான பிரயோசனங்களைப் பெறுகிறார்கள் என்பதைக் கௌரவ அமைச்சர் அவர்களே அறிவார்கள். எத்தனையோ ஆயிரக்கணக்கான மக்கள் அந்நார்த் தொழிற்சாலைகளிலே வேலை செய்கிறார்கள். இதைப்பற்றி அண்மையில் இலங்கையிலே 'சீ. எஸ். ஏ. ஆர்.' ஆராய்ச்சி செய்ததன் பயனுக, வாழையைப் போல திறமான நார் தரக்கூடிய பொருள் வேறெதுவுமில்லை என்பது நிரூபிக்கப்பட்டிருக்கின்றது.

இலங்கையிலே எத்தனையோ ஆயிரம் ஏக்கர் நிலத்தில் வாழை பயிரிடப்படுகின்றது. வாழையிலிருந்து பழக் குலையை மாத்திரம் பெற்றுக் கொள்ளுகின்றோமேயன்றி அதிலிருந்து பெறக்கூடிய நாரை அறவே மறந்து விடுகின்றோம். வாழை மரங்கள் பசளைக்குக் கூடப் பாவிக்கப்படாத நிலையிலே நிராகரிக்கப்படுகின்றன. வாழை நாரிலிருந்து செய்யக்கூடிய தொழில்கள் ஏராளம் இருக்கின்றன. இப் பொருளிலிருந்து உற்பத்தி செய்யக் கூடிய பொருட்களைச் செய்வதற்கு ஏராளமான மூலதனம் தேவையில்லை. மிகவும் குறைந்த செலவுடன் மிகவும் சொற்பமான மூலதனத்துடன், எங்கெங்கே இந்தவிதமான மூலப்பொருள் கிடைக்கின்றதோ, அங்கங்கெல்லாம் இத் தொழிற்சாலைகளை உருவாக்கலாம். இதற்காகக் கோடானுகோடி ரூபா பணமோ, அரசாங்க வருமானத்தின் பெரும் பகுதியோ தேவையில்லை. அநேகமாக நாட்டுப்புறங்களில் இப்படியான பொருட்களின் உற்பத்தியை உருவாக்கினுல், அது இன்று நாட்டிலுள்ள வேலையில்லாத் திண்டாட்டத்தை அகற்றி எத்தனையோ பேருக்கு வேலை கொடுக்கக் கூடிய ஒரு சந்தர்ப்பமாக அமையும்.

இரண்டாவதாக, இம்முயற்சி எடுக்கப்பட்டால் எங்களுடைய வெளிநாட்டுச் செலாவணியில் எவ்வளவோ மிச்சம் பிடிக்கக்கூடியதாக இருக்கும். இப்படியாக ஏராளமான பிரயோசனங்களை அளிக்கக்கூடிய, சணற் பொருட்களை உற்பத்தி செய்வதற்கான தொழிற்சாலைகளை நிறுவவேண்டும் என்று கௌரவ ஹங்குறன்கெத்த பாராளுமன்ற அங்கத்தவர் கொண்டுவந்திருக்கும் இந்தப் பிரேரணையை நான் முழு மனதாக வரவேற்கின்றேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. සිවසිතම්පරම් මයා.]

இவ்விதமான உற்பத்திச் சாலைகளை ஒருசில ஆயிரம் ரூபா செலவிலே, அதாவது ஐந்து அல்லது பத்தாயிரம் ரூபா செலவிலே நாம் நிறுவலாம். அவ்விதம் செய்வதனால் நாளடைவிலே அது ஒரு குடிசைக் கைத்தொழிலாக மாறி எங்கள் நாட்டின் உற்பத்தியில் பெரும் பங்கை எடுக்கும் என்பதில் எதுவித ஐயமுமில்லை. அனுமாத்திரமல்ல ; கடற்றொழிலாளர்களுக்குத் தேவைப்படும் சிறந்த வலைகளுக்கேற்ற கயிறு வாழை நார், சணல் ஆகியவற்றிலிருந்து செய்யக்கூடியதாக இருக்கின்றது. இன்று நடப்பது என்ன? பெருந்தொகையான பணம் நைலோன் வலைகளுக்காக வெளிநாட்டுக்குச் செல்கின்றது. எனவே, இவ்விதமான உற்பத்திகளைச் சரியான முறையிலே நாம் ஆலோசித்துச் செய்ய வேண்டும். இதற்கு முன்பிருந்த அரசாங்கம் இதனைக் கவனிக்காமல் விட்டுவிட்டதெனினும் தேசிய அரசாங்கம் இதனைக் கவனியாமல் விடக்கூடாது என்பதே எங்கள் கருத்து.

இவ்விதமான உற்பத்தியைத் தொடக்குவதனால் கடற்றொழிலாளர்களுக்கு நன்மை ஏற்படுகின்றது. இதனால் வெளிநாட்டு மூலதனம் கூடும் ; விவசாயிகளுக்குத் தொழில் கிடைக்கும் ; வேலையில்லாத் திண்டாட்டமும் ஓரளவு நீக்கப்படும். ஆகவே, அநேக பிரயோசனங்களைத் தரும் இவ்வித உற்பத்தியில் கௌரவ கைத்தொழில் அமைச்சர் அவர்கள் முக்கிய கவனமெடுத்து கிராமப் புறங்களில் எங்கெங்கு மூலப் பொருட்கள் இருக்கின்றனவோ ஆங்காங்கெல்லாம் இவ்வித தொழிற்சாலைகளை உருவாக்க வேண்டுமென்று கேட்டு எனது குறிப்புரையை முடித்துக் கொள்கின்றேன்.

අ. භා. 5.9

ඊ. එල්. සේනානායක මයා. (මහනුවර)
(திரு. ஈ. எல். சேனாநாயக்க—கண்டி)
(Mr. E. L. Senanayake—Kandy)

Mr. Deputy Speaker, I have great pleasure in supporting the Resolution introduced by the hon. Member for Hanguranketa. The *hana* industry is an industry well known in Ceylon for the past so many centuries. I am certain, Sir, that you have seen the *hana* mats that are produced in Ceylon. These *hana* mats, during the time of the Sinhalese kings, were used by our kings in place of bed-sheets, and even today you cannot get a mat which has a better finish or which is as soft.

*Hana* mats are not the only product that can be had from the *hana* fibre. *Hana* twine is another product which can be made from it. *Hana* twine can be woven into gunny bags, and if the *hana* industry as visualized by the hon. Member for Hanguranketa is encouraged on a large scale, if the industry is mechanized, this country could easily do without importing jute hessian bags from abroad. This industry can not only be a very great foreign exchange saver but also a greater foreign exchange earner.

In the hill-country there are thousands and thousands of acres of patna land which is not used by man or beast today. Every hill-country estate has 500 or 600 acres of patna land which can be brought under *hana* cultivation. If we mobilize the services of the plantations I am sure that every estate will bring under *hana* cultivation a stipulated acreage. And they will gladly do it because *hana* grows wild in our country. It does not need manuring, it does not need pruning. If you grow one *hana* bush it will keep on growing for several years. I am very glad that the hon. Member for Hanguranketa has thought of this.

Unfortunately, in our country we always think in terms of tea, rubber, coconut and cocoa. We never think of diversifying the acreage we have today. No, Sir, we cannot go on depending completely on rubber, tea, coconut and cocoa.

As a Member from the Central Province I must say that I am sorry that we have always been treated in a stepmotherly way in the matter of industries. If you take the revenue earned by the Government of Ceylon, the Central Province can be said to be one of the biggest income earners for the Government. In our area we have tea, rubber, coconut, and cocoa ; we have cardamom the various spices that are exported. But if the question is asked whether

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

we have been given a single industry by any Government, the answer is no. There is not a single industry established in the Central Province although the Central Province is one of the biggest revenue earners. We have not even got a tile industry. From the time of our kings the best clay came from Kandy, Kurunegala, Akurana, Gampola and Pallekelle.

On the question of Pallekelle ; the 17 Members who were returned from the Central Province made representations to the Hon. Prime Minister. I pointed out that as far back as 1951 the late Mr. D. S. Senanayake, when he was Prime Minister, had sent the Town Planner, Mr. Oliver Weerasinghe who is now our Ambassador in Washington, and His Excellency the Governor-General who then happened to be the Commissioner of the Kandy Municipal Council, to me. I was Mayor of Kandy at that time also. They were sent to me with a top secret message, namely, to go into the possibilities of acquiring Pallekelle and Kundasale, not only to serve as a satellite town but also to serve as an industrial centre in the Kandyan provinces.

Pallekelle Estate is 4,779 acres in extent. One year ago this company entered into a legal agreement to sell the estate to a private broker at the rate of Rs. 800 an acre. It is a gift, Sir, if you can get it at Rs. 800 an acre. If the Government steps in now they will not have to spend a cent more than that Rs. 800 an acre. The idea of the gentleman who wanted to buy it earlier was, of course, to parcel it out and sell it, making a profit of Rs. 2 million or Rs. 3 million.

We made representations to the then Government of Mrs. Bandaranaike and this sale was stopped. Then, after March last year an attempt was made to sell the estate again, and on representations made by us, our present Prime Minister stopped the sale. But no further action has been taken in the matter.

You can never get that land again. That is the only flat land that we have in the entire Central Province, and I appeal to the Hon. Minister of Industries that he visit the estate because I am certain that, after such a visit, he will be convinced that this is a place that can serve as an industrial centre for the Kandyan provinces. We have 22 electorates in the Central Province. Not only can this place be an industrial centre, it can produce sufficient tiles and sufficient bricks to feed the entire building trade in the Kandyan provinces.

Again, may I say that the *hana* industry is one which will not only earn valuable foreign exchange for us but also go a long way in halting the outflow of foreign exchange from this country.

I have great pleasure in supporting the Motion.

අ. භා. 5.14

**ඩී. බී. රණතුංග මයා.** (කොත්මලේ)
*(திரு. டீ. பி. ரணதுங்க—கொத்மலே)*
(Mr. D. B. Ranatunga—Kotmale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හණ කර්මාන්තය දියුණු කළ යුතු යයි ඉතාමත්ම කාලෝචිත යෝජනාවක් ගෙන ඒම ගැන මගේ මිත්‍ර හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාට (ජෝර්ජ් අබයගුණසේකර මයා.) මා ප්‍රශංසා කරනවා. මහනුවර ගරු මන්ත්‍රීතුමා (ඊ. එල්. සේනානායක මයා.) මතක් කළ පරිදි, උඩරට පළාත්වල ඇති කළ හැකි කර්මාන්ත ගැන සැලකිල්ලක් නොදැක්වීම නිසාම අද ඒ පළාත්වල ඇති වී තිබෙන රැකීරක්ෂා නොමැතිකමේ ප්‍රශ්නය පිළිබඳ වත් යම්කිසි සහනයක් මෙයින් සැලසේ යයි හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා විශේෂ යෙන් සලකා තිබෙනවා යයි මා හිතනව. ඒ නිසා මේ යෝජනාවට අපේ සම්පූර්ණ අනුමැතිය හා සහයෝගය මේ අවස්ථාවේදී දෙන අතරම, කර්මාන්ත සම්බන්ධවත් වචනයක් කියන්න බලාපොරොත්තු වෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහ නුවර ගරු මන්ත්‍රීතුමා මතක් කළ පරිදි, මෙපමණ කලක් සෑම ආණ්ඩුවකින්ම කර්මාන්ත සම්බන්ධව උඩරට ආසනවලට දක්වා තිබෙන්නේ කුඩම්මාගේ සැලකිල්ල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රණතුංග මයා.]

බවට කිසිම සැකයක් නැහැ. උඩරට ප්‍රදේශවල යම් යම් කර්මාන්ත දියුණු කිරීම සම්බන්ධයෙන් මෙතෙක් කල් ගෙනැවිත් ඇති යෝජනා රාශියක්ම යටපත් වී තිබෙන බව ගරු කර්මාන්ත ඇමතිතුමාට මතක් කළ යුතුව තිබෙනව. හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට මා අනුමැතිය දෙන අතරම, එතුමා විසින් අදහස් කළ හණ කර්මාන්තයේ දියුණුවට අවශ්‍ය වන ප්‍රමාණයට අමු ද්‍රව්‍ය සැපයීමට, එහෙම නැත්නම් හණ වගා කිරීමට කොත්මලේ ඡන්ද කොට්ඨාශයට පුළුවන්කම තිබෙනව. ඒ නිසා ඒ කර්මාන්තය දියුණු කරන්නට උඩ රට චන්ද කොට්ඨාශ රාශියක සහයෝගය ලැබෙනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එමෙන්ම තවත් දියුණු කළ හැකි කර්මාන්තයක් තමයි ඩිස්ටෙම්පර් කර්මාන්තය. ඩිස්ටෙම්පර් කර්මාන්තය සඳහා පෙරදිග රටවල තිබෙන්නා වගේ ඉතාමත්ම හොඳ, යෝග්‍ය පස කොත්මලේ හරංගලේ වැරැල්ල පතන කියන ගමේ තිබෙන බව මේ අවස්ථාවේදී අපේ ගරු කර්මාන්ත ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. මෙයට අවුරුදු කීපයකට පෙර පස් පරීක්ෂවරුන් කණ්ඩායමක් ගොස් මේ පස ගැන පරීක්ෂණ පවත්වා තිබෙනවා. ඒ අනුව ඩිස්ටෙම්පර් හදන්නට ඉතාමත්ම හොඳ, යෝග්‍ය පස ඒ ගමේ තිබෙන බව ඔවුන් අනුමත කර තිබෙනව. අවුරුදු 50 කට වැඩි කාලයක් සඳහා ඒ පස යොදා ගන්නට පුළුවන් යයි ඔවුන් කියා තිබෙනව. මේ කාරණය පසුගිය දිනක මා ගරු කර්මාන්ත ඇමතිතුමාට පෞද්ගලිකව මතක් කළා. මට එතුමාගෙන් දැනගන්නට ලැබුණු අන්දමට නම්, එවැනි අලුත් කර්මාන්ත ආරම්භ කිරීමට කර්මාන්ත ප්‍රතිපත්තියෙන් ඉඩක් ලැබෙන්නෙ නැහැ. මගේ ඒ නිගමනය හරිද කියා මා දන්නෙ නැහැ. ඒ කෙසේ වුවත්, කොත්මලේ හරංගලේ තිබෙන ඒ පස ඩිස්ටෙම්පර් හැදීම සඳහා පාවිච්චි කරන්නට පුළුවන් නම්—ඒ පස් පරීක්ෂකවරුන් ඉදිරිපත් කර තිබුණු අදහස් මා දුක්කා—ඒ පස උපයෝගී කර ගෙන දැනට පිටරටින් ගෙන්වන ඩිස්ටෙම්පර්වලට වඩා හොඳ ඩිස්ටෙම්පර් වර්ගයක් නිපදවීමට පුළුවන්කම ලැබෙනව. එමෙන්ම දැනට ඩිස්ටෙම්පර් විකුණන මිලෙන් තුනෙන්



එකක ප්‍රමාණයකට විකුණන්නටත් පුළුවන්කම ලැබෙනව. දැන් අවුරුදු ගණනාවක සිට ඒ ගම්වල අය ඒ පස දියකර බිත්තිවල ගෑමට පුරුදු වී සිටිනව. සමහර විට විකුණන්නට තිබෙන ඩිස්ටෙම්පර්වලට වඩා හොඳ පාටක් හා කල් පැවැත්මක් ඒවායේ දකින්නට ලැබෙනව. ඒ නිසා මේ කාරණය ගැන විශේෂ සැලකිල්ල යොමු කරන්නය කියා ගරු කර්මාන්ත ඇමතිතුමාට මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම මතක් කරනව. එසේ කළොත් හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා යෝජනා කළ විධියේ කර්මාන්තයක් ඇති කරන ගමන්ම රැකීරක්ෂා නැති විශාල පිරිසකගෙ රක්ෂා ප්‍රශ්නය විසඳන්නටත් අවස්ථාව ලැබෙන බව ප්‍රකාශ කරන්න කැමතියි. හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ගැන මගේ ස්තුතිය ප්‍රකාශ කරමින් හා ඒ යෝජනාවට මගේ අනුමැතිය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 5.19

**ඒ. සී. එස්. හමීඩ් මයා.** (අකුරණ දෙවන මන්ත්‍රී)

*(ஜனாப் ஏ. ஸீ. எஸ். ஹமீத்—அக்குறணை இரண்டாம் அங்கத்தவர்)*

(Mr. A. C. S. Hameed—Second Akurana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට සහයෝගය දෙන අතරම, මහනුවර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අදහස් සම්පූර්ණයෙන්ම සත්‍ය බව ගරු කර්මාන්ත ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. කඳුකර ප්‍රදේශයේ ජීවත් වන අපට අද වන තුරු කර්මාන්ත අතින් කිසිම දෙයක් ලැබී නැති බව සත්‍යයක්.

පල්ලේකැලේ යෝජනාව ගැන මහනුවර මන්ත්‍රීතුමා මතක් කළා. කර්මාන්ත ඇමතිතුමා කඳු ප්‍රදේශයේ දියුණුව ඇති කිරීමට කල්පනා කරනවා නම් එතුමා විසින් ගත යුතු එකම පියවර වහාම පල්ලෙකැලේ වත්ත රජයට ගෙන එහි කර්මාන්ත මධ්‍යස්ථානයක් ඇති කිරීමයි. ඒ නයින් තමයි, කඳු ප්‍රදේශයේ ජනතාවට දීප්තිමත් අනාගතයක් ලබා දිය හැක්කේ. කඳුකරයේ මහජනතාවත්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශීය හණ භාණ්ඩ නිෂ්පාදනය සඳහා කම්ාන්තශාලා

කඳු ප්‍රදේශයෙන් එන මන්ත්‍රීවරුනුත් පිළිගෙන අවසානයි, ඒ ප්‍රදේශයේ යම් කිසි දියුණුවක් ඇති කළ හැක්කේ පල්ලෙකැලේ වත්ත යොදවාගෙන පමණක් බව.

කොළඹ මේ රටේ අගනුවරයි. මහනුවර මේ රටේ කඳු ප්‍රදේශයේ අගනුවරයි. රටක් දියුණු කරනවා නම් එක් ප්‍රදේශ යක් පමණක් දියුණු කර මදි; සම්පූර්ණ රටම දියුණු කළ යුතුයි. කඳු ප්‍රදේශ යෙන් පැමිණෙන මන්ත්‍රීවරයකු හැටියට කොළඹ අවට තිබෙන කර්මාන්ත දිහා බලන විට මට ඊර්ෂ්‍යා හිතෙනවා. හැම දෙයක්ම තිබෙන්නේ කොළඹ, නැති නම් කොළඹ අවට ප්‍රදේශවල පමණයි. ඊට අපේ විරුද්ධත්වයක් ඇත්තේ නැහැ. නමුත් මේ රටේ ආදායමෙන් සියයට 65 ක්ම ලැබෙන්නේ කඳු ප්‍රදේශ යෙනුයි. අපට හිතාකන්න වුවමනාවක් නැහැ. අපි උදව්වක් වශයෙන් යමක් ඉල්ලන්නේ නැහැ. සියයට 65 ක් ආදායම ලබා දෙන ප්‍රදේශ දියුණු කිරීම සඳහා කටයුතු සැලසීම රජයේ යුතුකම බවයි, අපේ තර්කය.

පසු ගිය ආණ්ඩුව කර්මාන්ත ඇති කළේ, පරිසරය අනුවවත්, අවශ්‍යතාව අනුවවත් නොවෙයි: දේශපාලනමය කරුණු ගැන සලකා පමණයි. අපේ ජාතික රජයට එවැනි බලාපොරොත්තු වක් ඇත්තේ නැහැ. එසේ කරන්නය කියා අපි කර්මාන්ත ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ නැහැ. අපි කියන්නේ සම් පූර්ණ රටම දියුණු කිරීම යුක්තියුක්ත බවයි. අවුරුදු සිය ගණනක් තිස්සේ දියුණු නොවූ ප්‍රදේශයක් තමයි, කඳුකර ප්‍රදේශය. එහි නොයෙකුත් ප්‍රශ්න මතු වී තිබෙනවා. දවසින් දවස එහි ජනගහනය වැඩි වී තිබෙනවා. සමහර ගම්වල වැසි යන්ට ජීවත්වන්නත් ක්‍රමයක් ඇත්තේ නැහැ. ඉන්න ඉඩකඩ ඇත්තේ නැහැ. එහි වෙසෙන අයගෙන් සියයට 65 කටම තිබෙන්නේ අක්කරයකට අඩු කුඹුරු ප්‍රමාණයක්. ඊළඟ පරම්පරාව වන විට තත්ත්වය කෙසේ තිබේදැයි තමුන්නාන් සේට පේනවා ඇති. අක්කරයකට අඩු කුඹුරක් අයිතිවන්නේ එක පවුලකටයි. පවුලේ අට දෙනෙක් නව දෙනෙක් පමණ සිටිනවා. එතකොට ඊළඟ පරම්පරා වට අයිතිවන්නේ කොපමණද? එසේ බලන විට උඩරට ජනතාව ගොවිකමින් ජීවත් වූ කාලය අවසන් බව පෙනී යනවා. තව අවුරුදු 20 ක් 25 ක් ගත වන විට එහි ජනතාවට ගොවිකම් කර ජීවත් වෙන්න ක්‍රමයක් නැති වෙනවා. ඒ නිසා රටේ කර්මාන්ත දියුණු කිරීමට රජය අදහස් කරනවා නම් ඒ සැලැස්මේ පළමු වන තැන දිය යුත්තේ උඩරට ප්‍රදේශයට බව මම කර්මාන්ත ඇමතිතුමාට මතක් කිරීමට සතුටුයි.

නියෝජ්‍ය කථානායකතුමනි, කම්ාන්ත ඇමතිතුමාගෙන් මම එක ඉල්ලීමක් මේ අවසථාවේදී කරන්න කැමතියි. එනම් මේ රටේ කර්මාන්ත දියුණුවක් ඇති කිරීම සඳහා යම් කිසි සැලැස්මක් උඩ ක්‍රියා කිරී මයි. පසු ගිය රජය මඟින් කර්මාන්ත දියුණු කිරීමට බලාපොරොත්තු වුණේ කිසිම සැලැස්මක් නැතිවයි. පසු ගිය රජ යෙන් දස අවුරුදු සැලැස්මක් සකස් කර තිබුණා. එහෙත් කර්මාන්ත දියුණු කිරීමේ වැඩ පිළිවෙළත් ඒ දස අවුරුදු සැලැස්මත් අතර කිසිම සම්බන්ධකමක් තිබුණේ නැහැ. මට මතකයි පසු ගිය රජය ටයර් කර්මාන්ත ශාලාව සඳහා මුල් ගල් තබා ඊට සුමාන කීපයකට පස්සෙ මෙරටට ටයර් ගෙන්වීම තහනම් කළ බව. ඒ විධියට, සැලැස්මක් නැතිව කර්මාන්ත දියුණුවක් කරන්න බැහැ. පයෙෂණ නොකර සැලැස්මක් ඇති නොකර කර්මාන්ත දියුණුවක් කරන්න බැහැ. උඩ රට ප්‍රදේ ශය ගැන බලන විට අද වන තුරුම ඒ ප්‍රදේශයේ පස් පිළිබඳ පයෙෂණයක් කර නැහැ. දැන් මේ යෝජනාවේ ප්‍රතිපත්ති උඩ කර්මාන්ත ඇමතිතුමාට පුළුවන් වෙනවා මුළු ලංකාවෙ සැම ප්‍රදේශයක් ගැනම බලා ඒ ඒ ප්‍රදේශවල මොන මොන විධියේ කර් මාන්ත ආරම්භ කළ යුතුද කියා සොයා බැලීම සඳහා කොමිසමක් පත් කිරීමට. එවැනි පරීක්ෂණයක් නොකර කර්මාන්ත දියුණුවට අත ගැසීම ඥණවන්ත ක්‍රියාවක් නොවෙයි. පසු ගිය රජය ලොකු ලොකු දේවල් ගැන කල්පනා කළා. වානේ කර් මාන්තය, ටයර් කර්මාන්තය වැනි ලොකු දේවල් ගැන කල්පනා කළා. ඒවා නරකය කියා අපි කියන්නෙ නැහැ. ඒවා හොඳයි. නමුත්, මේ රටේ තිබෙන පස් සහ මේ රටේ තිබෙන වෙනත් ද්‍රව්‍ය ගැන පයෙෂණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හමීඩ් මයා.]

පවත්වා ඒවායින් කරන්න පුළුවන් දේ පළමුවෙන් පටන් ගන්න ඕනෑ. රේඩියෝ යන්ත්‍රයක් සඳහා අවශ්‍ය සෑම බඩු කෑල්ලක්ම මේ රටට ගෙන්වා ඒවා මේ රටේදී සවිකිරීම කර්මාන්තයක් නොවෙයි. එවැනි කර්මාන්තවලින් අපේ රටට ප්‍රයෝජනයක් නැහැ.

නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්තයකින් අප බලාපොරොත්තු වන්නෙ මොනවාද ? කර්මාන්තයක් ඇති කිරීමෙන් බලාපොරොත්තු වියයුතු අංග දෙකක් තිබෙනව. පළමුවැන්න මේ රටට අවශ්‍ය බඩු සැපයීමයි. දෙවැන්න ඒ කම්හල මගින් මේ රටේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳීමයි. මේ දෙකම සිදු වන්නෙ නැත් නම් කර්මාන්ත සැලැස්මක් සම්පූර්ණ වන්නෙ නැහැ. එම නිසා හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගෙ "හණ" යෝජනාවට මගේ සහයෝගය දෙන අතර, සැලැස්මක් නැතිව විශාල කර්මාන්ත පටන්ගත් පසු ගිය රජය මෙන් ක්‍රියා නොකර, අවසථාවට සුදුසු පරිදි, මේ රටේ තිබෙන ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගන්නට පුළුවන් වන පරිදි, මහජන දියුණුවට අදාළ කර්මාන්ත සැලැස්මක් ඇති කරන්නය කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. ඒ වාගේම එවැනි සැලැස්මක් උඩ කර්මාන්ත දියුණුවක් ඇති කරාවී යයි රටේ ජනතාව කර්මාන්ත ඇමතිතුමා කෙරෙහි බලාපොරොත්තු තබා ඇති බවද මතක් කරමින් මගේ වචන සවල්පය අවසන් කරනව.

අ. භා. 5.30

**පී. ජී. මුතුබණ්ඩා මයා.** (ලග්ගල)
*(திரு. பீ. ஜீ. முத்துபண்டா—லக்கல)*
(Mr. P. G. Muthubanda—Laggala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හණ කම්හන්තය පිළිබඳව අපේ හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා ගෙනැවිත් තිබෙන මෙම යෝජනාව ගැන මා ඉතාමත් සන්තෝෂ වෙනව. මා නියෝජනය කරන ලග්ගල කොට්ඨාශයේ හණ කර්මාන්තශාලාවක් පිහිටුවා අවුරුදු දෙකක් පමණ කටයුතු කරගෙන යාමට තරම් හණ ප්‍රමාණයක් ඉබේ වැවී තිබෙනව. එපමණක් නොව, එකම කර්මාන්තශාලාවක නොයෙක් නොයෙක් කම්හන්ත කීපයක් පවත්වාගෙන යාමට තරම් අවශ්‍ය අමු ද්‍රව්‍ය රාශියක් එම කොට්ඨාශය තුළ තිබෙනව. මේවා ගැන සඳහන් කරන්ට සිදු වී තිබෙන්නෙ ඉතා කනගාටුවෙන්. අද පිඟන් කර්මාන්තශාලාව පිහිටුවා තිබෙන්නෙ කොහේද ? ඊට අවශ්‍ය මැටි ගෙනෙන්නේ කොහෙන්දැයි සොයා බැලුවොත් තමුන්නාන්සේට පෙනී යයි, කොළඹ අවට ඇති එම කර්මාන්තශාලාවට ඒවා ගෙනෙන්නේ ලග්ගල මගේ කොට්ඨාශයෙන් බව. යකඩ කම්හන්තය ගැන කල්පනා කර බැලුවත්, යකඩ පෙරා ගැනීම සඳහා අවශ්‍ය ගල් සමූහයද ලග්ගල ආසනය තුළින් සොයා ගත හැකි බව තමුන්නාන්සේට උදක්ම මතක් කරනව. ඒ වාගේම කඩදාසි කම්හන්තශාලාව පිහිටුවා තිබෙන්නෙ කොහේදැයි කල්පනා කර බලන්න. කඩදාසි සෑදීමට වුවමනා අමු ද්‍රව්‍යයක් වන ඉළුක් පිදුරු මගේ ලග්ගල කොට්ඨාශයේ ඉඩම් අක්කර ලක්ෂ ගණනක් යට කරගෙන වැවී තිබෙනව. ඉළුක් ඉතාමත් සරුසාර ලෙස ඒ ප්‍රදේශයේ වැවෙන බව මට තමුන්නාන්සේට ඔප්පු කරන්ට පුළුවනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ අපේ ගරු අකුරණ දෙවෙනි මන්ත්‍රීතුමා (ඒ. සී. එස්. හමීඩ් මයා.) කිව්වා, මේ පළාතට අගනුවර කොළඹ වගේ මැද පළාතට අගනුවර මහනුවර කියා. පැරණි ඉතිහාසය දෙස අපේ හිත ටිකක් යොමු කර බැලුවොත්, අපේ සිංහල පරපුර ඇතිවන්ට පෙර ලංකාවේ සිටි ජනතාව කවුදැයි පෙනී යනව. ඒ ගැන තමුන්නාන්සේට වැඩිපුර අවබෝධයක් දීම අවශ්‍ය වෙන්නෙ නැහැ. විජය රජතුමා ලක්දිවට ගොඩබසින කාලයේදී ලංකාව තුළ සිටියේ, යක්ෂ ගෝත්‍රයටත් නාග ගෝත්‍රයටත් අයිති, අහසින් යන්ට පුළුවන්කම ඇති පොළොව යටින් යන්ට පුළුවන්කම ඇති, නොයෙක් වෙස් මවාගෙන යන්ට පුළුවන්කම ඇති, යාන-වාහන මවාගෙන යන්ට පුළුවන්කම ඇති, නොයෙක් විපර්‍යාස-මායාවල් දක්වන්ට පුළුවන්කම ඇති පිරිසක් බවත්, අපි වැනි මනුෂ්‍යයන් ඔවුන් ආහාර කොට ගත් බවත් තමුන්නාන්සේ අසා ඇති. එවැනි කල්පනා ශක්තියක් ඇති, සෘධි බලයක් ඇති උදවිය වාසය කළේ කොහේදැයි තමුන්නාන්සේ ටිකක් සොයා බලනු මැනවි. මා නියෝජනය කරන ලග්ගල කොටස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශීය හණ භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්තශාලා

එවකට ලංකා පුරය නමින් හඳුන්වා තිබෙන බව පැරණි ඉතිහාසයේ සඳහන් වෙනව. එවැනි බලවත් පිරිසක් මෙම ප්‍රදේශය රාජධානිය කරගෙන සිටියේ කුමක් නිසා දැයි මොහොතක් කල්පනා කර බැලීම අපේ යුතුකමක් .

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය දිනකදීත් මා මේ ගරු සභාවේදී කිව්වා, රාවණගේ රාජධානිය පිහිටා තිබුණේ ලග්ගල මා පදිංචිව සිටින ස්ථානයට නුදුරින් බව. ඒ හරියේ දෙතුන් දෙනෙක් ගොස් එන්සල් වගාව කරගෙන ජීවත් වෙනව. ඉතාම සරුසාර ලෙස එන්සල් වගාව කරගෙන ඔවුන් එයින් නියම ප්‍රතිඵල ලබා ගන්නව. එහෙත් අපේ සිංහල රජ කාලයේ පටන් මේ දක්වා කිසි දිනක ඒ ප්‍රදේශයේ ඉඩම් මැනීමක් කර නැති බව කනගාටුවෙන් මතක් කරන්ට සිදු වී තිබෙනව. මේ ප්‍රදේශය ගැන වැඩිදුරටත් විස්තර කරනව නම් ඔබතුමාට නොකියා බැරි කරුණු රාශියක් තිබෙනව. මුහුදු මට්ටමෙන් අඩි 4,500 කට ඉහළ ඉතා සරු සාර, නුවරඑළිය වැනි සනීපදායක, අක්කර 28,000 කට අධික තැනිතලා ප්‍රදේශයකින් මෙම කොට්ඨාශය සමන්විත වී තිබෙනව. අපට වුවමනා කරන කර්මාන්ත ආදී හැම දෙයක් සඳහාම සුදුසු බිම් ලග්ගල කොටසේ තිබෙනවා. දැනට නොයෙකුත් සංවර්ධන වැඩ කටයුතු ආරම්භ කර ඇතත් ඒවා ක්‍රියාත්මක වන්නේ ගොළුබෙලි ගමනිනුයි.

මේ වර්ෂයේදී මිනිපේ තුන් වන පියවර සඳහා විශාල මුදලක් වෙන් කර ඇති බව තමුන්නාන්සේ දන්නවා ඇති. හින්ගඟ වැඩ පොළට දැනට මාස තුනකට පමණ පෙර ට්‍රැක්ටර් යන්ත්‍ර 12 ක්, 13 ක් ගෙන ගොස් තිබෙන නමුත් තවමත් එහි කිසි වැඩක් කෙරෙන්නේ නැහැ. ට්‍රැක්ටර් යන්ත්‍ර දිරාපත් වෙමින් තිබෙනවා. මේ අන්දමට මහජන මුදල් නාස්ති වීම ගැන පරීක්ෂා කර බැලීමට ආණ්ඩුවේ නිලධාරීන් උනන්දුවක් දක්වන බවකුත් පෙනෙන්නට නැහැ. නැසී ගිය ඩී. එස්. සේනානායක මහතා මේ රට සංවර්ධනය කිරීමේ අභිලාෂයෙන් පොළොන්නරුව, ඇලහැර, මිනිපේ ආදී ජනපද පටන් ගත් කාලයේදී වීර ගස් යට සිටි හැටි මට හොඳට මතකයි. නමුත් වර්තමාන ඇමතිතුමා මේ මිනිපේ තුන් වන පියවර බැලීම සඳහා එකම දවසකවත් එහි ගොස් නැවතුණේ නැති එක ගැන මට කනගාටුයි. එතුමා ඒ ප්‍රදේශයට ගියා නම් එහි සංවර්ධන වැඩ කටයුතු සිදු වන ආකාරය ගැන හොඳ අවබෝධයක් එතුමාට ලබා ගන්නට පුළුවනි. මිනිපේ තුන් වන පියවරේදී කුඹුරු අක්කර පණස්හය දහස් අටසිය ගණනක් අස්වැද්දිය හැකි බව මා මීට කලින් ද මෙම ගරු සභාවේදී මතක් කළා. මිනිපේ හතර වැනි පියවරේ සංවර්ධන වැඩ කිරීම සඳහා තවම ඉඩම් ප්‍රමාණයන් ගැන ගණින් බලාවත් නැහැ. ලග්ගල කොටසේ තිබෙන්නේ මේ විධියේ කනගාටුදායක තත්ත්වයක් බව මතක් කළ යුතුයි.

මාතලේ හිටපු දිසාපති මහතකු මට එක් වාර්තාවක් පෙන්නුවා. පිටරට සිට පැමිණි අහස් යාත්‍රාවක් ලග්ගල කොටසේ නකල්ස් කියන ස්ථානය උඩින් උදේ පාන්දර මන්දාරම් නැති වේලාවක පියාසර කරන විට ඒ ස්ථානයේ රශ්මි ධාරාවක් විහිදෙනවා දැක්කාලු. ඒ අහස් යාත්‍රාවේ සිටි මහතුන් සිතුවේ එහි පැට්‍රල් ඇතැයි කියාලු. ඒ වාර්තාව මාතලේ දිසාපතිතුමා වෙත ඉදිරිපත් කර ඇතත් අද වන තුරු ඒ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා කිසිවකු ඒ කැලේට ගිය බවක් දැන ගන්නට නැහැ. අපේ මේ සිංහල නම ඇති වන්නට පෙර වාසය කළ උදවිය, ඍධි බලයක් ඇති උදවිය ලග්ගල ප්‍රදේශය සිය වාසය සඳහා තෝරා ගත්තේ එහි වටිනාකම දැන ගත් නිසා බව මට වැටහී තිබෙනවා. දැනට ලග්ගල ප්‍රදේශයේ ඉතා පහසුවෙන් මැණික් ගල් සොයා ගන්නට පුළුවනි. කොළඹ මැණික් ගන්න මුදලාලිලාගෙන් මට ඒ ගැන දැන ගන්නට ලැබී තිබෙනවා. සමහර විට සමහරුන් රුපියල් ලක්ෂ තුන හතර වටිනා මැණික් ගල් ගෙනැවිත් දී නෝට්ටු කඩදාසි සාක්කුවේ දමාගෙන ගෙදර යනවා. අපේ භාණ්ඩාගාරයට ලැබෙන්න තියෙන ලක්ෂ ගණන් මුදල් නොලැබී යනවා. මා නියෝජනය කරන ලග්ගල කොට්ඨාශයේ මැණික් සහ රත්රන් ඉල්ලම් පවා තිබෙනවය කියන කතාව මා අසා තිබෙනව. අහස්යාත්‍රාවලින් ගිය මහත්වරුන් දකින්න ඇත්තෙ ගිනි ගත් පෙට්රල් නොව වනාන්තරයේ තිබෙන මැණික් කන්දෙන්—මැණික් කන්දක් තිබෙනවය කියා මා අසා තිබෙනව—පිට වන එළිය වෙන්න පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශීය හණ භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්තශාලා

[මුතුබණ්ඩා මයා.]

මගේ කොට්ඨාශයේ ගමන් පහසුකම් ඇත්තේම නැහැ. ඒ නිසා පළමුවෙන් කළ යුත්තෙ ගමන් පහසුකම් ඇති කිරීමයි. එතකොට රට සංවර්ධනය කිරීම ඉතාමත් පහසු වෙනවා ඇති. මම මේ කියන දේවල් ඇත්තද බොරුද කියන එක දැක බලා ගන්න එහාට එන්න ඕනෑ. ගරු ඇමතිවරුන් මා එක්ක ආවොත් මට ඒවා පෙන්නුම් කරන්න පුළුවනි. ලංකාවේ වටිනාකම නොයෙක් කරුණු උඩ රඳා පවතින බව තමුන්නාන්සේ දන්නව. මුළු ලෝකයේම තිබෙන දේශගුණය පිළිබඳ නොයෙක් අන්දමේ වෙනස්කම් ලංකාවෙන් තිබීම ලංකාවේ වටිනාකම වැඩි වීමට එක් හේතුවක්. ලංකාව ඇතුළේ තිබෙන නොයෙක් දේශගුණයන් මගේ කොට්ඨාශයේ තිබෙනව.

සංවර්ධන කටයුතු අපේ ප්‍රදේශයට ඉතාමත් අවශ්‍යයි. දැනට පවතින තත්ත්වය අනුව සංවර්ධන කටයුතුවලට නොයෙක් අමාරුකම් තිබෙනවා. ඒ බව පසු ගිය අප්‍රේල් මාසයේදී පවත්වන්නට යෙදුණු මාතලේ දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කාරක සභාවේදී මතක් කර දුන්නා. විල්ගොමුව ගැන කියා සිටියා. මිනිපේ තුන්වන හතරවන පියවර යටතේ වැව් දොළහක් හදන්න ඇස්තමේන්තු හදන ලෙස මාතලේ වාරිමාර්ග නිලධාරීන්ට නියම කළා. එහෙත් අද වන තුරු ඒ ඇස්තමේන්තු සකස් කර නැහැ. ඇස්තමේන්තු සකස් කරන්න තබා ඔවුන් ඒ පළාතටවත් ගියේ නැහැ. මෙවැනි සේවකයන් පිරිසකගෙන්ද සංවර්ධන කටයුතු කරන්න බලාපොරොත්තු වන්නෙ? කොයි විධියකින්ද මෙවැන්නන්ගෙන් කර්මාන්තශාලා ආදිය ඇති කරන්න යන්නෙ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය ගැන සඳහන් කිරීම ගැන මට සමාව දුන මැනවි. මේ ගරු සභාවේ සිටින ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙකුටම ටෙලිපෝන් සේවය ලැබී තිබෙන නිසා මටත් ටෙලිපෝන් සේවයක් ලබා ගැනීම සඳහා මීට මාස හතරකට උඩදී මාත් ඉල්ලා සිටි නමුත් මේ වන තුරු—

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා කරුණා කර මේ යෝජනාවට අදාළව කථා කරන්න.

**මුතුබණ්ඩා මයා.**
*(திரு. முத்துபண்டா)*
(Mr. Muthubanda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කමා කළ මැනවි. මා කථා කරන්නේ මේ යෝජනාවට අදාළවයි. කර්මාන්තශාලා ඇති කරන්නේ කොහොමද, මෙවැනි කඩාකප්පල්කාරී පිරිසක් සේවයේ යොදවාගෙන ඉන්නවා නම්? තමුන්නාන්සේ එපාය කියනවා නම් ඒ ගැන කථා කරන්නෙ නැහැ. කොයි කර්මාන්තයක් පවත්වාගෙන යතත් අපට ඒ සඳහා සමගිය නැමති කර්මාන්තය මුලින්ම වුවමනා කරනව. ලංකාවේ ඒ මුලින් කී කර්මාන්තය—සමගිය නැමති කර්මාන්තය—නැහැ. මේ ගරු සභාව ඇතුළෙත් සමගිය නැමති කර්මාන්තය නැහැ. තමුන්නාන්සෙත් මට කථා කරන්න එපාය කියනව.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

යෝජනාවට අදාළව කථා කරන ලෙස යි මා කිව්වෙ; කථා කරන්න එපා කිව්වෙ නැහැ.

**මුතුබණ්ඩා මයා.**
*(திரு. முத்துபண்டா)*
(Mr. Muthubanda)

අලුතින් ආ මන්ත්‍රීන්ගේ ඔළුවල මොන මොන දේවල් තිබෙනවද කියා දැන ගන්න වචන මගින් ඒවා එළියට දමන්න ඉඩ නොදීම ගැන මා ඉතාමත් කනගාටු වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමාගේ කථාව දිගටම කරගෙන යාමට කිසිම බාධාවක් නැහැ. යෝජනාවක් තිබෙනවා නම් ඒ යෝජනාව අනුව කථා කළ යුතු බව පමණයි මා කිව්වෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශීය හණ භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්තශාලා

**මුතුබණ්ඩා මයා.**
*(திரு. முத்துபண்டா)*
(Mr. Muthubanda)

යෝජනාව අනුව තමයි මා කථා කරන්නෙ. මේ යෝජනාවේ සඳහන් වන අන්දමේ හණ කර්මාන්ත ශාලාවක් මගේ කොට්ඨාශයටත් අවශ්‍ය බවයි මා කීවෙ. හණ පමණක් නොවෙයි, තවත් නොයෙක් කර්මාන්ත ශාලා පිහිටුවීමට අවශ්‍ය අමු ද්‍රව්‍ය මගේ කොට්ඨාශයේ තිබෙනවා. ඒවා ගැනයි මේ විස්තර කළේ. මේ රටේ ආරම්භ කළ හැකි තවත් කර්මාන්ත රාශියක් තිබෙනවා. එහෙත් අපේ සමගිය නමැති කර්මාන්ත ශාලාව ගොඩනැගුවෙ නැත්නම් ඒ කිසිම දෙයක් කරන්නට බැහැ. ඔය මහනුවර පල්ලෙකැලේ වත්තෙ කර්මාන්ත ශාලාවක් ආරම්භ කළාය කියමු. එහෙත් යම් කෙනෙකු තරහවී ඒ කර්මාන්ත ශාලාවට ගිනිකූරක් ගැහුවොත් සියල්ලම විනාශ වී යනවා. කර්මාන්ත ශාලාවත්, අමු ද්‍රව්‍ය ගබඩාත් සියල්ලම විනාශ වී යනවා. ඒ නිසා තමයි පළමුවෙන්ම සමගිය ඇති කළ යුතුය කියා මා කියන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්නට අදහස් කරන්නෙ නැහැ. හණ කර්මාන්ත ශාලාවක් පමණක් නොවෙයි, කර්මාන්ත කීපයක් ආරම්භ කිරීමට අවශ්‍ය අමු ද්‍රව්‍ය වුණත් මගේ කොට්ඨාශයේ තිබෙනවා. ඒ සමගම, සිමෙන්ති සෑදීමට ගන්නා ගල් බහුල වශයෙන් මගේ කොට්ඨාශයේ තිබෙන බවත් මතක් කරනවා. දැන් කන්කසන්තුරේත් ගාල්ලේත් සිමෙන්ති කර්මාන්ත ශාලා තිබෙනවා. ලග්ගල කොට්ඨාශය ඇතුළු උඩරට ප්‍රදේශවල සිමෙන්ති සෑදීමට වුවමනා ගල් වර්ග බෙහෙවින් තිබෙනවා. ඒ නිසා මා නියෝජනය කරන ප්‍රදේශයේත් සිමෙන්ති කර්මාන්ත ශාලාවක් ආරම්භ කළොත් එවැනි කර්මාන්ත ශාලාවකට අවශ්‍ය වන සම්පූර්ණ අමු ද්‍රව්‍ය ප්‍රමාණය ඒ ප්‍රදේශයෙන්ම ලබා ගන්නට පුළුවන්. නමුත් අද ඒ ප්‍රදේශවලින් අමු ද්‍රව්‍ය ඈත ප්‍රදේශවල කර්මාන්ත ශාලාවලට ගෙන යනවා. මේ අන්දමට අමු ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීම සඳහා කොපමණ මුදලක් වැය වෙනවාද? අමු ද්‍රව්‍ය තිබෙන ස්ථානවලම කර්මාන්ත ශාලා ආරම්භ කළොත් ඒ අමතර ප්‍රවාහණ කුලී ආදී වියදම් අඩු කරගෙන කොයි තරම් අඩු මුදලට ඒ කර්මාන්ත ශාලාවලින් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය මහජනතාවට දිය හැකිද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොයි කර්මාන්ත ශාලාවක් ආරම්භ කරනත් පළමුවෙන්ම සමගියයි ඇති කරන්න ඕනැ. ලංකාවේ අමු ද්‍රව්‍ය තිබෙන සෑම ස්ථානයකම කර්මාන්ත ශාලා ආරම්භ කළ යුතුයි. ඒ සමගම සමගිය නමැති කර්මාන්ත ශාලාවත් ගොඩනැගිය යුතුයි. අවසාන වශයෙන් මට කථා කරන්නට අවස්ථාව සලසා දුන් තමුන්නාන්සේට මාගේ අවංක ස්තුතිය පුද කරමිනුත් හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව ඉතාම සතුටින් අනුමත කරමිනුත් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

අ. භා. 5.48

**ඩී. ඊ. තිලකරත්න මයා.** (රත්ගම)
*(திரு. டி. ஈ. திலகரத்ன—ரத்கம)*
(Mr. D. E. Tillekeratne—Ratgama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හඟුරන්කෙත මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන මෙම යෝජනාව ගැන අප සන්තෝෂ වෙනවා. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් මෙම යෝජනාව යටතේ ඒ ඒ ප්‍රදේශවල අභිනව කර්මාන්ත ශාලා ඇති කිරීම පිළිබඳව ගරු කර්මාන්ත ඇමතිතුමාගේ අවධානය යොමු කළා. එහෙත් අභිනව කර්මාන්ත ශාලා ආරම්භ කරන්නට ප්‍රථමයෙන් තිබෙන කර්මාන්ත ශාලා ටික රැක ගැනීම ගැන මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට සතුටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම දකුණු පළාතේ මුහුදු බඩ ප්‍රදේශවල ජනතාවගෙන් සියයට 50ක් පමණ කොහු කර්මාන්තයේ යෙදී සිටින බව අප දන්නවා. දකුණු පළාතේ ගුදිරි කොහු නැත්නම් මෙට්ට කොහු—ඒවාට කියන්නෙ "බේල්" කොහු කියායි—නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලා 200ක් පමණ අද වසා දැමීමට තරම් කටයුතු සැලසී තිබෙනවා. මේ කර්මාන්තශාලා දෙසීය තුළ දෙදහසක් තුන් දහසක් පමණ දෙනා රක්ෂාවේ සිටිනවා. තව මාස කීපයක් ගත වෙන්නට පෙර මේ සියලු දෙනාටම රක්ෂාව නැතිවන බව මා දන්නවා. අද


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශීය හණ භාණ්ඩ නිෂ්පාදනය සඳහා කම්මාන්තශාලා

[ඩී. ඊ. තිලකරත්න මයා.]

මේ කර්මාන්ත ශාලාවලින් නිෂ්පාදනය කරන කොහු මිළදී ගෙන පිට රට පැටවීම කරන්නෙ ඔය හේලීස්, වොල්කාට් වැනි සමාගම් දෙක තුන පමණයි. ඒ අය මිළ ගණන් සීමා කරගෙන තබා ගන්නවා. මීට අවුරුද්දකට පමණ පෙර කොහු හොණ්ඩරයක් රුපියල් 35 ට 40 ට තිබුණා. එහෙත් දැන් කොහු හොණ්ඩරයකට ගෙවන්නේ රුපියල් පහළොවයි නැතිනම් විස්සයි. දහස් ගණනින් රක්ෂා නැති වීම පැත්තකින් තිබියදී, ඒ මුළු පළාතම අගය කරන එම කර්මාන්තය ඒ නාමයෙන්වත් වැටෙන්නට ඉඩ නොදී ආරක්ෂා කර ගැනීම පිණිස යම් කිසි පියවරක් ගන්නය කියා මා ඉල්ලා සිටිනව. මේම රජය මගින් හෝ මේ කොහු ලනු එකතු කිරීමට යම් කිසි වැඩ පිළිවෙළක් යෙදිය යුතුව තිබෙනව. කොහු ලනු පිටරට යවන්න වුණත්, ඕනෑ තරම් අවස්ථා සැලසෙනව. මීට අවුරුදු දෙක තුනකට ප්‍රථම ටොන් 500 ක් පමණ කොහු හෝ කොහු ලනු හෝ බුරුම රටින් ඉල්ලා සිටි බව මා හොඳින් දන්නව. මීට පෙර පැවති ආණ්ඩුව එම කාර්යය වෙනුවෙන් කිසි පියවරක් ගත්තෙ නැහැ. කොහු නිෂ්පාදනය කර දෙන්ට අපි කොතෙක් උත්සාහ ගත්තත්, එදා ඒවා පිටරට යවන්න ඒ රජය කිසි උත්සාහයක් ගත්තෙ නැහැ. එදා පටන්ම කොහු පිටරට යැවීම පටන් ගත්තා නම් අපට කිසි අමාරුවක් නැතිව මේ කර්මාන්තය දියුණුව කරා ගෙන යන්ට තිබුණා.

එක්තරා කාරණයක් වෙනුවෙන් ගරු කර්මාන්ත ඇමතිතුමාට මා මෙම අවස්ථාවේදී ස්තුති කරන්ට ඕනෑ. කොහු ලනුවලින් තැනූ මලුවල ලුණු ඇහිරීම කෙරෙනව. මුළු ලංකාවෙම නිෂ්පාදනය කරන ලුණු ඇහිරීමට අවශ්‍ය කරන ලනු මලු නිෂ්පාදනය කරන්නෙ—සියයට සියයක්ම වාගෙ නිෂ්පාදනය කරන්නෙ—මගේ කොට්ඨාශයෙ බව කියන්ට ඕනෑ. වැඩි කලකට ඉහත නොවෙයි, මාස ගණනකට ඉහත ලුනු අහුරන මලු වශයෙන් ලනු මලු පාවිච්චි නොකර ජූට්වලින් සාදන ගෝනි මලු පාවිච්චි කරන්ට පටන් ගෙන තිබුණ. ඒ හේතුව නිසා අපේ ප්‍රදේශයෙ ලනු මලු නිෂ්පාදනය සියයට 50 කින් පමණ අඩු වුණා. ගරු කර්මාන්ත ඇමතිතුමා සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා වැඩි කලක් ගියේ නැහැ. එතුමා ඒ වෙනුවෙන් දැඩි පියවරක් ගෙන තිබෙන බව පේනව. අද ඒ ලුනු ඇහිරීමට අවශ්‍ය ලනු මලු ප්‍රමාණයන් පෙර පරිදි සපයන්ට අපට පුළුවන් වී තිබෙනව. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සෙ තව ටිකක් වීර්ය කලොත් ඔය අහක දමන්ට හදන කොහුලනුවලින් මීට වඩා ප්‍රයෝජන ලබා ගන්ට පුළුවන් වෙනවා ඇති. ආණ්ඩුවේ යම් යම් විධිවිධාන යටතෙ එම කොහු භාර ගැනීම කලොත් එය මුළු දකුණු පළාතටම තමුන්නාන්සෙගෙන් කෙරෙන සේවයක් බව මේ අවස්ථාවේදී මතක් කරන්ට ඕනෑ.

හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් අබයගුණසේකර මයා.) ගෙන ආ යෝජනාව වගේ යෝජනාවක් මටත් ඉදිරිපත් කරන්ට පුළුවන් කම තිබෙනව. දකුණු පළාතේ වැටකෙයියා ගස් බෙහෙවින් වැවෙන බව අපි දන්නව. අපතේ යන ඒ වැටකෙයියා ගස්වලින් ප්‍රයෝජන ගැනීම පිණිස, ඒවායින් යම් යම් භාණ්ඩ නිෂ්පාදනය කරන කම්මාන්ත ශාලාවක් දකුණු පළාතේ ඇම්මොත් දහස් ගණනකට රැකී රක්ෂා සපයා දීම කරන්ට හැකි වෙනවා ඇති. ඒ අමු ද්‍රව්‍යය ලබා ගැනීම ඉතා ලෙහෙසියෙන් කරන්ට පුළුවනි. ඒවා වෙනුවෙන් තඹ ශතයක්වත් වියදම් වන්නෙ නැහැ. නිකම් කැලෑවලත්, අගල්වලත්, මුහුද අද්දරත් ඒවා හොඳින් වැවෙනව. එම නිසා වැටකෙයියා ගස ප්‍රයෝජනයට ගෙන යම් යම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා පියවරක් ගන්න හැටියට ගරු ඇමති තුමාගෙන් මා ඉල්ලා සිටිනව. මා මීට වැඩියෙන් කතා කරන්ට යන්නෙ නැහැ. හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගෙ යෝජනාවත්, අනිකුත් මන්ත්‍රීවරුන්ගෙ අදහසුත් ගැන මෙන්ම මා ඉදිරිපත් කරන ලද සැලැස්මවල් ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වේවා කියා 'මා ප්‍රාර්ථනය කරනව.

අ. භා. 5.54

**ආර්. පී. විජේසිරි මයා.** (කුණ්ඩසාලෙ)
(திரு. ஆர். பீ. விஜேசிறி—குண்டசாலை)
(Mr. R. P. Wijesiri—Kundasale)

හණ කර්මාන්තය ගැන කතා කරන මේ අවස්ථාවෙදි හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගෙ (ජෝර්ජ් අබයගුණසේකර මයා.)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෝජනාවට පක්ෂව වචන ස්වල්පයක් කතා කිරීමට මා අදහස් කරනවා. හණ කර්මාන්තය ඉතා දියුණු ලෙස කෙරෙන කුණ්ඩසාලෙ ප්‍රදේශයෙ එම කර්මාන්තයෙහි යෙදුණු පැරණි පවුල් රාශියක් සිටින බව මා තමුන්නාන්සෙට පළමුවෙන්ම කියන්න කැමතියි. පැරණි කාලයේ සිට, දුම්බර මිටියාවතේ හේනවල ගම් ප්‍රදේශයේ පැරණි ක්‍රමයට හණවලින් නොයෙකුත් විධියෙ භාණ්ඩ නිෂ්පාදනය කරගෙන එනවා. මෙසේ නිපදවන භාණ්ඩ ලක්සැල වැනි ස්ථානවලට එවා අලෙවි කරන අතරම මෑතක සිට ඇමෙරිකාවට යැවීමටත් කොන්ත්‍රාත්තුවක් ලබාගෙන තිබෙන බව තමුන්නාන්සේට කියන්න කැමතියි. මෙය පැරණි කර්මාන්තයක් වුණත් එය දියුණු තත්ත්වයෙන් පවත්වාගෙන යන්නට, දියුණු කර ගන්නට හුඟක් අපහසුකම් තිබෙන බව මතක් කරන අතරම හණ වැවීමටත්, හණ ලබාගැනීමටත් අපහසුකම් රාශියක් තිබෙන බව මේ අවස්ථාවෙදි සඳහන් කරන්න කැමතියි. හණ කර්මාන්තයෙහි යෙදී සිටින මෙම උදවියට, හණ ලබාගැනීම පිණිස, හණ ගස් කපා ගැනීම පිණිස උඩුනුවර, යටිනුවර, හඟුරන්කෙත, ආදී දුර බැහැර ප්‍රදේශවලට යන්න සිදු වෙනවා. එසේ අපහසුකම් මධ්‍යයේ හණ ලබා ගෙනයි මෙම කර්මාන්තය පවත්වා ගෙන යන්නෙ. එම නිසා, පල්ලෙකැලේ වතුයාය රජයට අරගෙන එයින් අක්කර සිය ගණනකවත් හණ ගස් වැවීම කළොත් හණ කර්මාන්තයෙහි යෙදී සිටින අයට සෙතක් සැලසෙන අතරම හණ කමර්ාන්තයද දියුණු කරන්න පුළුවන් බව සඳහන් කරන්න සතුටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ප්‍රථම කථා කළ අකුරණ දෙවන මන්ත්‍රීතුමා (ඒ. සී. එස්. හමීඩ් මයා.) හණ කර්මාන්තයෙහි යෙදී සිටින අයගේ පහසුව සඳහා පල්ලෙකැලේ වතු යාය රජයට ගෙන එයින් කොටසක් ලබා දීම සුදුසුය කියා සඳහන් කරන්න යෙදුණා. එසේ ලබා ගෙන අක්කර දෙතුන් සියයකවත් හණ වගා කිරීමට රජයේ අවසර ලැබුණොත් ඇමෙරිකාවට පමණක් නොවෙයි ලෝකයේ අනිකුත් රටවලටද අපේ නිෂ්පාදන යැවීමට පහසුකම් ලැබෙනවාට කිසිම අනුමානයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටට පැමිණෙන විදේශික සංචාරකයින් ඒ ගමට ගොස්, ඒ අය නිපදවන අනර්ඝ භාණ්ඩ දැක, ඒවා මිලයට ගන්නවා. ඇතැම් අවස්ථාවලදී නියමිත මිලට ගන්නවා පමණක් නොවෙයි, එම භාණ්ඩ ගැන සතුටට පත්ව ප්‍රසාද මුදල් පවා දී යන බව කියන්න කැමතියි. ඒ අය, එතරම් දක්ෂ කාර්මිකයන් වුණත් දිළිඳුකම නිසා තමන්ගෙ කර්මාන්තය දියුණු කර ගැනීමට නොහැකිව සිටිනවා. එම නිසා, මෙම රජයෙන් ඉතා බැගෑපත්ව මම ඉල්ලා සිටිනවා, ඒ අයගේ හණ කර්මාන්තය දියුණු කර ගැනීම පිණිස හැකි සෑම සහයෝගයක්ම දෙන ලෙස.

තවද, හණ කර්මාන්තයෙහි යෙදී සිටින පවුල් සිය ගණනක් අපේ ප්‍රදේශයේ ඉන්නවා. ඒ අය ඉතාමත් දිළිඳු තත්ත්වයකයි ජීවත් වෙන්නෙ. එම නිසා, ඒ අයට නිවාස පහසුකම් සලසා දීම පිණිස ආසියා පදනම් —ඒසියා පවුන්ඩේෂන්—වැනි ආයතනයන්ගෙන් යම්කිසි ආධාර මුදලක් ලබා දීමට ක්‍රියා කරන ලෙස රජයෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව අනුමත කරන අතරම හණ කර්මාන්තය මෙරටේ දියුණු කරනු ලැබුවහොත් පිටරටින් මෙරටට ගෙන්වන හණවිලින් සාදන ලද සෑම භාණ්ඩයක්ම මෙහිම සාදාගැනීමට, නිපදවීමට, හැකි වීමෙන් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඉතුරු කර ගන්න හැකි වෙනවා. එමෙන්ම, රැකී රක්ෂා ප්‍රශ්නය වැනි ජාතික ප්‍රශ්නය විසඳීමට එයින් පහසුකමක් ලැබෙන නිසා, හණ කර්මාන්තය නගා සිටුවීමට රජයේ සහයෝගය ලැබේවායිද, හණ කර්මාන්තයෙහි යෙදී සිටින්නන් ගැන රජයේ අවධානය යොමු වේවායි ද ප්‍රාර්ථනය කරමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.

අ. භා. 5.59

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන** (අම්බලංගොඩ)

*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன —அம்பலாங்கொடை)*

(Dr. M. H. Saddhasena—Ambalangoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩරට මන්ත්‍රීවරුන් ඔවුන්ගේ ප්‍රදේශවල කර්මාන්ත දියුණු කර ගැනීම ගැන කථා කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය සද්ධාසේන]

අවස්ථාවේදී පහතරට අපේ ආධාරයත් ඒ සඳහා ලබා දීම පිණිස රුහුණු ප්‍රදේශය වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරයකු වශයෙන් මමද, හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් අබයගුණසේකර මයා.) විසින් ඉදිරිපත් කර ඇති මේ යෝජනාව ඉතාම සන්තෝෂයෙන් අනුමත කරනවා. දෙමළ භාෂාවට සාධාරණ තැන දීම සඳහා රෙගුලාසි සම්මත වී සති ගණනක් යන්නටත් ප්‍රථම ඉතාම දක්ෂ සිංහල කවිකයකු වූ අකුරණ දෙවන ගරු මන්ත්‍රීතුමා (ඒ. සී. එස්. හමීඩ් මයා.) අද මේ සභාවේදී ප්‍රථම වරට සිංහලෙන් කථා කිරීම ඉතාමත් ප්‍රශංසනීයයි. අපේ ලග්ගල ගරු මන්ත්‍රීතුමා (පී. ජී. මුතුබණ්ඩා මයා.) කීප වරක්ම සමගිය ගැන සඳහන් කළා. අපේ සමගිකම පෙන්වීමට වැඩි කලක් යන්නට ප්‍රථම පෙඩරල් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුත් සිංහලයෙන් කථා කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුහුදුබඩ ප්‍රදේශවල කොහු කර්මාන්තය දියුණු කළ යුතුය කියා රත්ගම ගරු මන්ත්‍රීතුමා කීවා. අද අපට පඩංගු විශාල ප්‍රමාණයක් වුවමනා කරනවා. ඒ නිසා හොඳ ගුදිරි ලබා ගැනීමට පඩංගු සෑදීම සඳහා මේ කොහු එකතු කරන්නට ඕනෑ. ඒ අනුව උඩ රටටත්, මුහුදුකරයටත් සම්බන්ධ වෙලා නව නවත් කර්මාන්ත දියුණු කරන්නට පුළුවන් වෙනවා. හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුමත කරන අතර අපේ පළාතේ ඇති කරන්නට පුළුවන් කර්මාන්ත ගැන ගරු කර්මාන්ත ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. විශේෂයෙන්ම සායම් නිපදවීමට වුවමනා කරන රමාස පස මිටියාගොඩ ප්‍රදේශයේ තියෙනවා. අපේ උඩරට සහෝදරයන්ට ආධාර කරන අතර ඔවුන්ගේ ආධාරය අපද බලාපොරොත්තු වන බව සඳහන් කරමින් හඟුරන්කෙත ගරු මන්ත්‍රීවරයා ගෙන ආ යෝජනාව පහත රටවැසියකු වශයෙන් ඉතාමත්ම ඕනෑකමින් මම අනුමත කරනවා.

අ. භා. 6.1

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

*(திரு. டீ. செல்ற்றன் ஜயசிங்க—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

As requested by my Minister I should like to reply to the matters raised by the Motion before the House. Although it does not deal directly with the Ministry of Industries most hon. Members have addressed themselves to my Minister. I hope that the Hon. Minister of Home Affairs will pardon us for taking the liberty of replying on his behalf as well.

With regard to the *hana industry* I would like to say that this is not a new venture to be started afresh. As you may know, round about 1920, the Maha-Illuppallama Farm, which is today a Government farm, was owned by an Indian prince—a Maharajah—who tried the experiment of growing *hana* on this farm. His experiment did not prove a success. I do not say that is any reason for discouragement ; but to get the record straight it shows that considerable attention has been paid to this project. Unfortunately, for us, this has not been a great success.

I am, however, pleased to mention to hon. Members, because fifteen of them have spoken on this subject, that my Minister has already instructed his officers to look further into this subject. He will no doubt be pleased to meet Members of Parliament, particularly those who represent central and up-country areas, and discuss this matter with them. He will appoint a person as early as possible to investigate and report on this project.

The question of dolomite for the fertilizer industry was raised. At the moment, the people who crush the dolomite stones find no difficulty in selling their product. So far, this

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

material has been fairly well consumed by the various fertilizer manufacturers.

I am happy to be able to say that the Government Fertilizer Corporation will very soon become a reality. A Cabinet Paper is already with the Hon. Minister. The land has been surveyed and the site has been investigated. This is the largest single Government undertaking at the moment. The work will be completed within a period of about two years. Then all the dolomite that we can find can very easily be consumed by the existing fertilizer factories as well as by the Fertilizer Corporation.

With regard to the question of the establishment of industries, no doubt every hon. Member would like to have as many industries as possible started in his electorate, including your honourable self. But there are problems that my Minister has to face, such as finance, suitability of site, availability of raw material, the profit or benefit ratio between the imported and the manufactured article and so on. It is not possible within a short period of about nine or ten months to produce an overall or a well-knit plan. I must say that our Ministry has not waited until we had what you may call a full-fledged plan, but there are certain matters that can be immediately attended to. My Minister is well aware that, particularly in the Central Province and in the up-country areas, industry has not been carried home to the rural people. He has addressed his mind to this matter and has found out a way in which he could come to the assistance of the people in these areas.

I wish to draw the attention of the hon. Members to the textile industry where it will be observed that the yarn taken to these areas is woven into cloth and brought down to Colombo, Veyangoda or Wellawatte for finishing. Now, under the various aid programmes that the Hon. Minister has been examining, particularly under the G. D. R. aid programme, it will be possible for him to establish in these areas finishing-plants for textiles. This is only the beginning of an implementation programme of industry to be taken direct into the rural areas of this country. The Hon. Minister has already taken action in regard to the formation of the Small Industries Board and is now considering the question of the establishment of a development bank for small industries so that we can have a planned set-up.

Industries can be classified under four broad heads. One would be import substitution industries, purely on a *pro rata* basis. Another would be industries to consume available raw material. The third, industries which should reach international standards, for export and earning foreign exchange. And the last, but not least, would be industries which envisage intensive programmes for labour consumption. Those were, I gather, the main objectives of the hon. Members who spoke before me. With this end in view the Hon. Minister is paying particular attention to small industries—industries like the machine—tool industry, welding units, and such other industries which will be primarily intensive labour consuming units.

Sir, it is not possible to reply in detail to all hon. Members who spoke on this Motion. One hon. Member raised the question of the manufacture of distemper. In this matter I shall make personal contact with the hon. Member for Kotmale (Mr. Ranatunga) and see what we can do about it.

There was the question of the Pallekelle Estate raised by more than one Member. When this matter was taken up in the last session of the last Parliament I was the first speaker on the Motion, and, with facts that were available to me, I presented to the Government a case for not permitting the estate to be broken up and sold. I would strongly recommend to the Hon. Minister that investigations be made in regard to



PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ෂෙල්ටන් ජයසිංහ මයා.]

this matter. There are 4,000 acres; we do not require all those 4,000 acres. But it may well be that the Minister could take up about 100 acres for an industrial site—[*Interruption.*] I am not prepared to discuss the pros and cons of the matter at the moment. There are more knowledgeable people who will come into this—[*Interruption.*] You cannot mix up housing with industry.

There was also the question of the fibre industry, coir manufacture, raised by the hon. Member for Ratgama (Mr. D. E. Tillekeratne). In this instance, I must say that most of the ills of the people engaged in this industry are of their own seeking. For the last hundred years no attempt has been made to keep up with modern techniques; the same old methods have come down from great grand-father to great grand-son. It is no wonder that we have been shut out from the export markets. Our finished product cannot compete with the products of other countries because our prices are much higher than world prices. Hon. Members who represent electorates in the Southern Province and our own areas would be well advised to tell our people that they must go in for more modern techniques if they wish to compete in the foreign market—[*Interruption.*] We are prepared to extend every assistance to any industrialist who wishes to introduce modern techniques and modern methods of manufacture. We will even go further: we will not only give advice, we will give financial assistance; we will find foreign markets. This advice and assistance will be freely available from our Ministry for the manufacture and export of fibre goods.

Before I wind up I must make particular reference to the hon. Member for Laggala (Mr. Muthubanda.) I do not know in what specific way we can possibly help him, but I assure the hon. Member that I shall arrange for a meeting with my Minister where we can discuss his difficulties, and if an effective remedy can be found at an early date, we shall be glad to help him.

I have great pleasure in accepting the Motion of the hon. Member for Hanguranketa which is primarily addressed to the Minister of Home Affairs to whom we can convey what has been said or he can read what has been said.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව පුළුල් කිරීම

## *றிக்கில்லகஸ்கடவிலுள்ள கிராம வைத்திய சாலையைப் பெருப்பித்தல்*

## EXTENSION TO RURAL HOSPITAL AT RIKILLAGASKADE

අ. භා. 6.14

**ජෝර්ජ් අබයගුණසේකර මයා.**
*(திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர)*
(Mr. George Abeyagoonasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත සම්බන්ධයෙන් වූ පළමුවන යෝජනාව ගැන ගරු මන්ත්‍රීවරු 15 ක් 16 ක් පමණ කථා කිරීමෙන් ඔප්පු වුණා, එය ඉතා වැදගත් යෝජනාවක් බව. ඒ කථාවලට බොහෝ වේලාවක් ඇහුම්කන් දී විඩාවට පත් වී සිටින මේ ගරු සභාවට මේ අවස්ථාවේදී සෞඛ්‍යය සම්බන්ධ යෝජනාවක් ඉදිරිපත් කරන්නයි, මා බලාපොරොත්තු වන්නේ. මා නමින් ඇති ඒ දෙවන යෝජනාව මම දැන් කියවන්නම්:

"රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව වැඩි දියුණු කර පුළුල් කිරීමටත්, දිස්ත්‍රික් ආරෝග්‍ය ශාලාවක තත්ත්වයට මෙම ආරෝග්‍ය ශාලාව උසස් කොට දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියෙකු යටතේ තැබීමටත් වහාම පියවර ගත යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

මේ යෝජනාව පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට ප්‍රථම මීට අවුරුදු 25 කට පමණ පෙර මේ රටේ පැවති සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව මෙනෙහි කිරීමට මම සතුටුයි. ඒ කාලයේදී අපේ රටේ බොහෝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙනකුට සෞඛ්‍ය පහසුකම් ලැබුණා නම් ලැබුණේ මහා ආරෝග්‍යශාලාවලින් පමණයි. පසු ගිය රජයක සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍ය ධුරය දරු ගරු ජෝර්ජ් ඊ. ද සිල්වා මැතිතුමා මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. එදා ගම්වල සෞඛ්‍ය තත්ත්වය දියුණු කිරීම පිණිස එක්තරා ව්‍යාපාරයක් ආරම්භ කොට ග්‍රාමීය ආරෝග්‍යශාලා පළමු වෙන්ම ඇති කළේ සාමාන්‍ය මිනිසාගේ යුගයක් උදා කළ දිවංගත ජෝර්ජ් ඊ. ද සිල්වා මැතිතුමායි. මේ කාලේ බොහෝ විට නින්දා අපහාස ලබන ධනවත්ය කියන, පොහොසත්ය කියන, උදවියගෙන් නියම ප්‍රයෝජන ගෙන, ආරෝග්‍යශාලා සඳහා ගොඩනැගිලි සෑදීමට අවශ්‍ය පමණ මුදල් වැය කිරීමට රජයට අපහසු වුවත් ගම්වල සිටි ධනවත් අයගේ ආධාර ලබා ගෙන ග්‍රාමීය ආරෝග්‍යශාලා ඇති කිරීමට එතුමාට පුළුවන් වුණා. ඒ අත්දමින් තනන ලද ආරෝග්‍යශාලාවක් තමයි, රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව. එහි පළමුවන ගොඩනැගිලි ඉදි කළේ මහ නුවර සිටි දිවංගත ජේම්ස් සේනානායක මැතිතුමායි. එතුමා මහනුවර ගරු මන්ත්‍රීතුමා (ඊ. එල්. සේනානායක මයා.) ගේ පියායි. ඒ නිසා හඟුරන්කෙත මැතිවරණ කොට්ඨාශයේ ඇති රිකිල්ලගස්කඩ ආරෝග්‍යශාලාව ගැන කථා කරන විට එය ආරම්භ කළ උදවිය ගැන මතක් කරන්නේ ඔවුන්ට කෘතගුණ සැලකීමක් වශයෙනුයි.

මේ යෝජනාවෙන් කරුණු තුනක් බලාපොරොත්තු වෙනවා. පළමුවන කාරණය මේ ග්‍රාමීය ආරෝග්‍යශාලාව විශාල කිරීමයි. දෙවන කාරණය එය දිස්ත්‍රික් ආරෝග්‍යශාලාවක තත්ත්වයට උසස් කිරීමයි. තුන්වන කාරණය එහි පාලනය දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියකුට පැවරීමයි. දැනට මේ ග්‍රාමීය ආරෝග්‍යශාලාවේ ලෙඩුන් සඳහා ඇත්තේ ඇඳන් 42 යි. සාමාන්‍ය වෛද්‍ය නිලධාරියකුත්, තවත් නිලධාරීන් දහ දොළොස් දෙනකුත් ඇතුළත් මණ්ඩලයක් විසිනුයි මේ ආරෝග්‍යශාලාවේ පාලන කටයුතු කරගෙන යන්නෙ. මේ ළඟදී මා ලබා ගත් සංඛ්‍යා ලේඛන අනුව, එම ආරෝග්‍ය ශාලාවේ නේවාසිකව සිටින ලෙඩුන්ගේ සංඛ්‍යාව 400ක් පමණ වෙනවා. ඇඳන් 42 කින් පමණක් සමන්විත මෙම ආරෝග්‍ය ශාලාවේ සාමාන්‍යයෙන් මාසෙකට නේවාසිකව සිටින ලෙඩුන්ගේ සංඛ්‍යාව 400 ක් පමණ වීම කෙතරම් කනගාටුදායකද? ඒ ළඟට ඕ.පී.ඩී. අංශයෙන් නොහොත් බාහිර ප්‍රතිකාර අංශයෙන් මාසෙකට ප්‍රතිකාර ලබා ගන්නා රෝගීන්ගේ සංඛ්‍යාව හාර දාහත් පන් දාහත් අතර සංඛ්‍යාවක් වෙනව. එම නිසා මෙම ආරෝග්‍ය ශාලාව පිළිබඳව අද තිබෙන තත්ත්වය මේ සංඛ්‍යා ලේඛනවලට අනුව බලන විට නමුන්නාන්සේලාට වැටහී යනවා ඇති, වැඩි පුර ගොඩනැගිලි සාදා මෙය විශාල කිරීම ඉතාමත් අවශ්‍ය බව. මෙම ආරෝග්‍යශාලාව තනන්නට කලින්, ලක්ෂ තුන හතරක් පමණ ජනගහනයක් ඇති මේ ගම්බද ප්‍රදේශය සඳහා තිබුණ එකම ආරෝග්‍යශාලාව නම් රිකිල්ලගස්කඩට හැතැප්ම හතක් පමණ ඈතින් පිහිටි මතුරට ආරෝග්‍යශාලාවයි. මගෙ මතකයේ හැටියට ඒ ආරෝග්‍යශාලාවටත් දැන් වයස අවුරුදු 60 ක් 65 ක් පමණ වෙනව. ඒ ආරෝග්‍යශාලාව එදා යම් බඳු තත්ත්වයකින් ඉදි කළා නම් අදත් එය ඇත්තේ ඒ තත්ත්වයෙන්මයි. එදා තිබුණු තත්ත්වයට වඩා වෙනස් ස්වරූපයක් අද එම ආරෝග්‍ය ශාලාවෙත් නැහැ. නමුත් දිස්ත්‍රික් ආරෝග්‍යශාලාවක් වශයෙන් එහි කටයුතු පවතිනව. යම් කිසි පරීක්ෂණ කාර්යයක් සඳහා පසුගිය මාසයෙ මා එහි ගිය අවස්ථාවේදී මට දකින්න ලැබුණා ගර්භණී මව්වරුන් සඳහා වෙන්ව තිබුණ වාට්ටුවේ තිබුණේ ඇඳන් 6 ක් පමණක් බව. එදා මා ගිය දවසෙ නේවාසිකව සිටි ගර්භණී මව්වරුන් 20 දෙනෙක් පමණ ඒ වාට්ටුවේ පිටත සිටියා. එම ආරෝග්‍යශාලාව අද ලෙඩුන්ගෙන් පිරී ඉතිරී ගොස් තිබෙන ස්ථානයක් බවට පත් වී තිබෙනව.

රිකිල්ලගස්කඩ ආරෝග්‍යශාලාව පිහිටා තිබෙන ස්ථානය හඟුරන්කෙත මැතිවරණ කොට්ඨාශයේ පමණක් නොව, ඒ මුළු අවට ප්‍රදේශවලම සිට වැටී ඇති පාරවල් එකතු වන සැලකිය යුතු වැදගත් ප්‍රසිද්ධ මධ්‍ය ස්ථානයක් වශයෙන් සලකන්න පුළුවන්. ඒ නිසා සතර දිසාවේම බොහෝ දෙනා, ඒ ස්ථානයේ පිහිටීම අනුවත්, වෙදකම් ලබා ගැනීමේ පහසුව අනුවත්, මෙම ආරෝග්‍ය ශාලාවට පැමිණෙනව. ඒ අනුව එම ආරෝග්‍යශාලාවේ තදබදය වැඩි වී ඇති නිසා එහි පාලනය ගෙන යාම ඉතාමත් අමාරු තත්ත්වයක පවතිනව. නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීම සඳහා සිටින ලෙඩුන්ගේ සංඛ්‍යාව වැඩි වී ඇතත්, බාහිර ප්‍රති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් අබයගුණසේකර මයා.]

කාර ලබා ගැනීම සඳහා එන ලෙඩුන්ගේ සංඛ්‍යාව වැඩි වී ඇතත්, සෞඛ්‍ය නිල ධාරීන්ගේ සංඛ්‍යාව වැඩි නොකිරීම හේතු කොටගෙන ඒ ලෙඩුන්ගේ අවශ්‍යතා සතුටු දායක ලෙස ඉටුවෙනවා යයි කියන්න පුළු වන්කමක් නැහැ. ඒ නිසා මෙම ආරෝග්‍ය ශාලාව ගැන යම් කිසි දියුණුවක් ඇති කිරීම අවශ්‍ය බව සෞඛ්‍ය ඇමතිතුමාට මතක් කර දීම ඉතාමත් කාලෝචිතය කියා මම කල්පනා කරනවා. විශේෂයෙන් ම, ක්ෂේත්‍ර නිලධාරීන් සම්බන්ධව කිය තොත්, මේ සා විශාල ජනගහනයක් හා තදබදයක් ඇති ප්‍රදේශයක සිටින සෞඛ්‍ය පරීක්ෂකවරුන් ගණන ඉතාමත්ම සුළුයි. දැනට ඒ පළාතේ සේවය කරන සෞඛ්‍ය පරීක්ෂකවරුන් තුන් දෙනෙකුට වඩා නැහැ. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පිළිගත් සාමාන්‍ය ක්‍රමය නම්, 8,000 ක හෝ 10,000 ක ජනගහනයක් ඇති ප්‍රදේශයකට සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුගේ සේවය ලබා දීමයි. එහෙත්, සෞඛ්‍ය පරීක්ෂක නිල ධාරීන් සේවය කරන මේ පළාතේ කොට් ඨාශ දෙකක් ගැන පමණක් මා මේ අවස්ථා වේදී මතක් කරන්න කැමතියි. දියතිලක හා ගහපළාත කියන කෝරළ දෙක භාරව වැඩ කරන සෞඛ්‍ය පරීක්ෂක මහත් වරුන්ගෙන් එක් කෙනෙකුට අයිති කොට් ඨාශයේ 22,000 ක පමණ ජනගහනයක් සිටිනවා. 22,000 ක ජනගහනයක් ඇති ප්‍රදේශයක කටයුතු කිරීමට සිදු වී තිබෙන් නේ එක සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුට පමණයි. අනික් සෞඛ්‍ය පරීක්ෂක මහත් මාට අයිති කොට්ඨාශයේ ජනගහනය 33,000 ක් පමණ වෙනව. ඒ අනුව කල් පනා කර බලන විට, ක්ෂේත්‍ර නිලධාරීන් වශයෙන් සේවය කිරීමට මේ සෞඛ්‍ය පරීක්ෂකවරුන් දෙදෙනා ප්‍රමාණවත් නො වන බව මේ ගරු සභාවට පෙනී යනවා ඇති.

ක්ෂෙත්‍ර නිලධාරීන් ගැන කල්පනා කිරීමේදී වින්නඹු මාතාවන් ගැනත් සලකා බැලිය යුතුයි. ඒ ප්‍රදේශයේ වින්නඹු මාතා වන්ගේ අඩුකම නිසා වැසියන්ට කරදර විඳීමට සිදු වී තිබෙනව. ඒ ප්‍රදේශයේ සිටින වින්නඹු මාතාවන්ගේ වැඩ බැලී මටත්, සාමාන්‍යයෙන් දැනට තිබෙන සෞඛ්‍ය ආයතනවල—ඒ කියන්නේ ක්ලිනික්වල—වැඩ කටයුතු සොයා බැලීම වත් මහජන සෞඛ්‍ය හෙදියක් හෙවත් Public Health Nurse කෙනෙක් ඒ කොට්ඨාශයට කවදාවත්ම පත් කර නැහැ. දැනට හඟුරන්කෙත කොට්ඨාශයේ සෞඛ්‍ය කටයුතු පිළිබඳ වැඩ කිරීමට සිටින සේවක පිරිසේ සංඛ්‍යාව ඔය විධියයි.

මේ රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව පටන්ගන්නට කලින්, යමෙකුට අසනීපයක් ඇති වූ අවස්ථාවකදී—පුළුවන් කමක් තිබුණ නම්—එන්නට සිදු වුණේ මහනුවර ආරෝග්‍ය ශාලාවටයි. සැතපුම් 30 ක් හෝ 35 ක් ඈත ගම්වල සිට මහනුවරට ලෙඩුන් ගෙන එන්නට සිදු වී තිබුණා. ඒ දිනවල මහනුවරට ලෙඩෙකු ගෙන එන්නේ එසේ කිරීමට පුළුවන්කම තිබුණු අය පමණයි. සාමාන්‍ය ගම්වැසියෙකුට එසේ එන්නට පුළුවන්කමක් තිබුණේත් නැත්නම්, සිංහල ක්‍රමයට හෝ ඉංග්‍රීසි ක්‍රමයට පාවිච්චි කළ බෙහෙත්වලින් ප්‍රති ඵලයක් ලැබුණෙත් නැත්නම් ඔවුන්ට අත් වූයේ මරණයයි. ඒ තත්ත්වය ඒ පළාතේ කොතරම් දුරට බලපෑවාද කිය තොත්, යම් රෝගියෙක් මහනුවර රෝහල ට පැමිණියා නම් එසේ පැමිණියේ ඔහු ගේ අන්තිම කැමති පත්‍රයත් ලියා තබලයි. එවැනි රෝගියෙකුට යම් කිසි විධියකින් මහනුවර රෝහලේදී සුවයක් ලැබුණේ නැත්නම් ඔහු කොළඹට ගෙනා වා. ඒකට තමයි "ගමනක අවසානය" කියා කියන්නේ. කොළඹට ගෙනා ලෙඩෙක් නැවත ගම්වලට ඒවිය කියා බලා පොරොත්තු වුණේ නැහැ. එවැනි තත්ත්ව යක් තිබියදී මේ රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව තනා ඒ පහසුකම ලබා දීම ගැන එකල පැවැති රජයට මා ස්තුති වන්ත වෙනවා. එහෙත් මේ ස්ථානයේ දියුණුව ගැන කල්පනා කර බලන විට, ඒ කොට්ඨාශය නියෝජනය කරන මට පමණක් නොව ඒ පළාතේ වාසය කරන ජනතාවටත්, එහි පවතින තත්ත්වය ගැන තෘප්තිමත් වන්ට පුළුවන්කමක් නැහැ. බොහෝ ග්‍රාමීය ආරෝග්‍යශාලාවලට පළ පුරුද්දක් ඇති නිලධාරීන් පත් කිරීම, සිරිතක් වශයෙන්, රෙගුලාසියක් වශයෙන් කරගෙන යනව. එහෙත් මේ ආරෝග්‍ය ශාලාව පාලනය කිරීමට සිරිතක් වශයෙන් පැමිණෙන්නෙ එපමණ පළපුරුද්දක් ඇති වෛද්‍යවරයෙක් නොවෙයි. සෑම විටම වගෙ අවුරුද්දක පමණ කෙටි පළපුරුද්දක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇති තරුණ වෛද්‍ය නිලධාරියෙක් මේ ස්ථානයට පත් කර එවීමයි, සිදු වෙන්නෙ. එවැනි කෙනෙකුගෙන් එපමණක් සේවයක්, ලෙඩුන් බලාපොරොත්තු වන සේවයක්, මහජනයා බලාපොරොත්තු වන සේවයක් ලැබෙන්නෙ නැහැ. මේ ආරෝග්‍ය ශාලාවට අද දවසේ පැමිණෙන ලෙඩුන්ට නිසි ප්‍රතිකාර නොලැබෙන නිසා බොහෝ දෙනෙක් බොහෝවිට අදහස් කරන්නේ වඩා හොඳ සේවයක් ලබා ගැනීමට පුළුවන් කම ඇති මහනුවර වැනි ප්‍රදේශවල ඇති උසස් ආරෝග්‍යශාලාවලට යාමටයි. පළාත් බද ආරෝග්‍යශාලාවල තදබදය ඇතිවෙනවත් සමගම සාමාන්‍ය අසනීපයකට ප්‍රතිකාර ලබාගන්ට පුළුවන් දක්ෂ නිලධාරීන් නැති නිසා බොහෝ දෙනෙක් මහනුවර ආදී මහා රෝග්‍යශාලාවට යාම සිරිතක්. මෙවැනි ග්‍රාමීය ආරෝග්‍යශාලාවලත්, ඒ වගේම මාතෘ නිවාස ආදියේත් අද පවතින තත්ත්වය උසස් කර දක්ෂ වෛද්‍ය නිලධාරීන් ඒවාට පත් කර ඔවුන්ගේ සේවය ගම්බද ජනතාවට ලබා දෙන්ට ක්‍රියා කළොත් නගරබද මහාරෝග්‍යශාලාවල තදබදය අඩුවීමට එය හේතු වෙනවා ඇති. මේ සම්බන්ධයෙන් මා පමණක් නොව මහජනයා නොයෙක් අවස්ථාවලදී සාධක සහිතව දෙපාර්තමේන්තුවට කරුණු ඉදිරිපත් කර තිබෙනව. අවාසනාවකට මෙන් තවමත් තත්ත්වය වෙනස් වී නැති නිසා මා අදහස් කළා. මේ ගරු සභාවට මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කර, එය සභාසම්මත කරගෙන ඉක්මණින් මහජනයා බලාපොරොත්තු වන සේවය ලබා දෙන්ට ඕනැය කියා.

මෙම රිකිල්ලගස්කඩ ආරෝග්‍යශාලාව පළල් කිරීම සඳහා අවශ්‍ය ඉඩම් ගැනීම අමාරු වෙන්නෙ නැහැ. අළුත් ගොඩනැගිලි සඳහා අවශ්‍ය ඉඩම් ළඟම තිබෙන වතු යායෙන් කරදරයක් නොමැතිව ලබා ගන්ට පුළුවන්කම තිබෙනව. මේ පළාතේ ජනගහනය අනුවත් වැදගත්කම අනුවත් බලන විට, මෙම ආරෝග්‍යශාලාවේ ඇති අඩුපාඩු නිසා පොලිසිය හා සම්බන්ධ යම් යම් කටයුතු ආදියේදී නොයෙක් ප්‍රමාදයන් සිදු වෙනව. බරපතල තුවාල, අපරාධ, ආදිය සම්බන්ධ පැමිණිලි ගැන කටයුතු කිරීමට සුදුසු දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියෙක් ඒ පළාතට අවශ්‍යයි. දැනට හඟුරන්කෙත කෝට්ඨාශයත් වලපනේ කෝට්ඨාශයේ විශාල කොටසකුත් ඇතුළු විශාල ප්‍රදේශයකට සිටින්නේ මතුරට දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීතුමායි. එම නිසාත්, නිලධාරීන්ගේ පහසුව සඳහාත්, මේ ආරෝග්‍යශාලාවට දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියෙක් පත් කිරීමට අවශ්‍යතාවක් තිබෙනව. රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව සම්බන්ධව ඔය වචන සවල්පය මතක් කරන අතරම ගම්බද පළාත්වල වාසය කරන උදවියත් වෙනත් පළාත්වල ආරෝග්‍යශාලා මොන තරම් දියුණු තත්ත්වයකට පත්වී තිබෙනවාදැයි දන්නා බව මතක් කළ යුතුව තිබෙනව. සේවය අතින් පමණක් නොව, බෙහෙත් ද්‍රව්‍ය අතින්ද නාගරික ආරෝග්‍යශාලාවලට තිබෙන සම්පූර්ණත්වය ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවලට නැහැ. සෞඛ්‍ය ආයතනවලින් ලැබෙන සහන සම්බන්ධයෙන් ඒ ප්‍රදේශ කුඩම්මාගේ සැලකිල්ල ලබන බව කියන්නට ඕනැ. නවීන ක්‍රම උපයෝගී කර ගනිමින් නොයෙකුත් පහසුකම් සහිතව පවත්වාගෙන යන ආරෙග්‍යශාලා තිබියදීත් ජනගහණය වැඩි ඒ ප්‍රදේශයෙහි මිනිසුන්ට වරින් වර වෛද්‍ය උපදෙස් ලබා ගන්නට පසසුකම් නැහැ. ඇස් සම්බන්ධයෙන් හෝ වේවා දත් සම්බන්ධයෙන් හෝ වේවා උපදෙස් ලබා ගන්නට හෝ ප්‍රතිකාර ලබා ගන්නට හෝ පිළිවෙළක් නැහැ. ඒ ප්‍රදේශයෙහි පාඨශාලා 55ක් තිබෙනවා. ඉතා විශාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාවක් ඒ පාඨශාලාවල ඉගෙන ගන්නවා. ළඟම තිබෙන පොරමඩුල්ල මධ්‍යම විද්‍යාලයේ ඉගෙන ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව දහසකට ඉහළයි. නමුත් දන්ත වෛද්‍යවරයකුගේ සේවයක් කවදාකවත් ඒ ප්‍රදේශයට ලැබී නැහැ. ඒ ප්‍රදේශයේ ජනතාවගේ පහසුව සඳහා රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාවට සපිර දන්ත වෛද්‍යවරයකු පත් කිරීම අපහසු නම් සතියකට වතාවක්වත් දත් පිළිබඳ චිකිත්සා පැවැත්වීමේ ක්‍රමයක් මේ ආරෝග්‍යශාලාවෙහි ඇති කරන්නට ඕනැ.

බොහෝ ප්‍රදේශවල පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දන්ත චිකිත්සාගාර පහසුකම් සලසා තිබේන බව අප දන්නවා. ලංකාවේ කිසිම මධ්‍ය විද්‍යාලයකට නොදෙවැනි වූ පොරමඩුල්ල මධ්‍ය විද්‍යාලයටත් දන්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් අබයගුණසේකර මයා.]

චිකිත්සාගාර පහසුකම් ලබා දීමට ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටින්නට කැමතියි. ඒ ප්‍රදේශයේ බාලක බාලිකාවන්ට වරින් වර තම ඇස් හා දත් පරික්ෂා කර ගැනීම සඳහා ඊ. එන්. ටී. ක්ලිනික් ක්‍රමයක් නැති නිසා ඒ ගැනත් ගරු සෞඛ්‍ය ඇමතිතුමා ගේ සැලකිල්ල යොමු කරන ලෙස මෙම යෝජනාව ඉදිරිපත් කරන අතරම මා ඉල්ලා සිටිනවා.

මේ ආරෝග්‍යශාලාවලින් නිසි සේවයක් සිදු වෙනවාදැයි පරීක්ෂා කර බැලීම ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේත්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙත් වැදගත් කට යුත්තක් යයි මා සලකනවා. මේවා සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වාර්තා ඉදිරිපත් කරනු සඳහා නිල නොලත් පරීක්ෂකවරුන් පත් කර සිටිනවා. ඒ ප්‍රදේශවලත් එවැනි නිල නොලත් පරීක්ෂකවරුන් සිටිනවා. නමුත් ඒ නිල නොලත් පරීක්ෂකවරුන් සිය වාර්තා ඉදිරිපත් කළත් ඒවායින් වැඩක් නොවන බව කණගාටුවෙන් කියන්නට සිදු වී තිබෙනවා. මා හොඳාකාර දන්න නිසයි එසේ කියන්නෙ. මේ ආරෝග්‍යශාලාවලින් අප බලාපොරොත්තු වන සේවය නිසියා කාර ඉටු වෙනවාදැයි වරින්වර සොයා බැලීම දෙපර්තමේන්තුව සතු යුතුකමක්. දෙපාර්තමේන්තුව සතු ඒ යුතුකම හරියා කාර ඉටු වෙතොත්—වරින්වර ආරෝග්‍ය ශාලා පරීක්ෂා කර බැලුවොත්—ඒවායින් අප බලපොරොත්තු වන සේවය සහ යහපත මහජනයාට සිදු වෙනවා ඇති. මා හදිසියේ මේ ආරෝග්‍යශාලාවලට ගිය අවසථාවලදී මට දකින්න ලැබුණු දර්ශන නම් ඉතාමත් කනගාටුදායකයි. සෞඛ්‍යය අතින්, පිරිසුදුභාවය අතින්, සහ එතැන වැඩ කරන උදවියගේ දක්ෂතාව අතින්, යන මේ සෑම අතින්ම සන්තෝස වන්න ට නම් ඉඩක් තිබුණේ නැහැ. ඒ කාරණ යත් මේ අවස්ථාවේදී සෞඛ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන වෙතැයි මා අපේක්ෂා කරනවා.

ආරෝග්‍යශාලා සේවය හා සම්බන්ධ වෙනත් සෞඛ්‍ය ආයතන—සංචාරක ඩිස්පෙන්සරි සහ පාඨශාලාවලට සපයන සෞඛ්‍ය පහසුකම් ආදිය—ගැනත් ඊළඟට සඳහන් කළ යුතුව තිබෙනව. මේ ආයතන වලින් සිදු වන සේවය ප්‍රමාණවත් නැහැ. ඒ නිසා අඩු ගණනේ මසකට එක් වරක් බැගින්වත් ආරෝග්‍යශාලාවලින් පාඨ ශාලාවල ළමයින්ගේ සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු කිරීමේ කටයුතු කිරීමට නිලධාරීන් පිරිසක් යැවීමට විධිවිධාන ඇති කළ යුතු බවත් දන්වන්න සතුටුයි.

නුවරඑළි දිස්ත්‍රික්කය වැනි සනීපදායක ප්‍රදේශයක පිහිටි හඟුරන්කෙත වැනි කොට්ඨාශයක මෙපමණ අසනීපකාරයින් සිටීම පුදුමයක් ලෙස බොහෝ දෙනෙක් කල්පනා කරන්න පුළුවනි. රෝගීන්ගෙන් ඒ ප්‍රදේශයේ ආරෝග්‍යශාලා පිරී ඉතිරී ගොස් මේ තරම් තදබදයක් ඇති වියහැකි දැයි තර්ක කරන්නත් පුළුවනි. ඉතාමත් යහපත් සනීපදායක දේශගුණයක් තිබු ණත්, පිරිසිදු ශීතල ජලයක ආධාරය තිබු ණත්, ඒ වගේම කඳුකර ප්‍රදේශ ආශ්‍රය කරගෙන හමා එන සිසිල් වාතයේ ආශිර් වාදය සහ එවැනි ස්වභාව ධර්මයාගේ දායාදයන් සහ වරප්‍රසාදයන් තිබුණත්, ලැබෙන ආහාර ද්‍රව්‍යවල අඩුපාඩු නිසා සහ මිනිසුන්ගේ දුප්පත්කම නිසාත් වෙනත් යම් යම් හේතූන් නිසාත් නොයෙක් විධියේ ලෙඩ රෝගවලට මනුෂ්‍යයන් භාජන වන බව කියන්න පුළුවනි. සනීප දායකවූත් සෞඛ්‍යයට හිතකරවූත් ප්‍රදේශ යක් වන හඟුරන්කෙත කොට්ඨාශයේ එවැනි කනගාටුදායක තත්ත්වයක් පව තින්නේ ඒ නිසයි. ආරෝග්‍යශාලාවල තද බදයක් පවතින්නෙත් ඒ නිසයි. අලුතින් තව තවත් ආරෝග්‍යශාලා තනවන්න සිදු වී තිබෙන්නේ ඒ නිසයි. ඒ කෙසේ වෙතත් මේ ආරෝග්‍යශාලාවේ වැදගත් කම ගැන මා මේ ගරු සභාවට කියා සිටින් නේ ඒ ගැන මට හොඳ අවබෝධයක් තිබෙන නිසයි. රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව වැඩි දියුණු කර පුළුල් කිරීමටත්, ඉතාමත් ඉක්මනින් අලුත් ගොඩනැගිලි ඇති කර දිස්ත්‍රික් ආරෝග්‍ය ශාලාවක තත්ත්වයට උසස් කොට දිස්ත්‍රික්ක වෛද්‍ය නිලධාරියෙකුගේ භාර යේ තැබීමටත්, වහාම පියවර ගැනීම ඉතා මත් අවශ්‍ය නිසයි මා මේ යෝජනාව ඉදිරිපත් කරන්නෙ.

මගේ මේ යෝජනාව ඉදිරිපත් කරන වාත් සමගම මා කල්පනා කරනවා, ඊට මේ ගරු සභාවේ එකඟත්වය ලැබේය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා. මා සඳහන් කළ අඩුපාඩුකම්වලින් බොහොමයක් වෙනත් ප්‍රදේශවල තිබෙන ආරෝග්‍යශාලාවලත් තිබෙනවා වෙන්න පුළුවනි. ඒ නිසා මෙය හඟුරන්කෙතට පමණක් සීමා වූ ප්‍රශ්නයක් නොවන බව මං දන්නවා. සෑම ඡන්දදායක කොට්ඨාශය කටම වාගේ පොදුවේ ඉදිරිපත් කළ යුතු ප්‍රශ්නයක් හැටියට මෙය සලකන්න පුළුවනි. ඒ කොයි හැටි වෙතත්, විශේෂයෙන් කඳුකර උඩරට පළාත්වල තිබෙන කනගාටුදායක තත්ත්වය නැති කිරීමට මෙයින් ඉතා විශාල සේවයක් වෙනවා ඇති. ඒ නිසා ගරු මන්ත්‍රීවරුන් මීට තමන්ගේ එකඟත්වය දක්වන බවට කිසිම සැකයක් නැහැ. එය සම්මත වූ පසු ගරු ඇමතිතුමාගේ අවධානය ඊට යොමු වනු ඇතැයි අපේක්ෂා කරමින් මගේ නමින් තිබෙන යෝජනාව මා ඉදිරිපත් කරනවා.

අ. භා. 6.44

**රණතුංග මයා.**
*(திரு. ரணதுங்க)*
(Mr. Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම කඳුරට පොදු ජනතාවටත් එසේම රටේ සාමාන්‍ය පොදු ජනතාවටත් වැදගත් වන—ප්‍රයෝජනවත් වන—කාලෝචිත යෝජනා ගෙන එන හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ දෙවැනි යෝජනාව ස්ථිර කිරීමට දෙවන වරටත් මේ ගරු සභාවේ නැගී සිටීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. එතුමා ගෙන ආ යෝජනාව පමණක් නොව එතුමාගේ කථාවේදී සඳහන් කළ සියළුම කරුණුත් උඩරට සෑම ආසනයකටම බලපාන ඒවා හැටියට මම පළමුවෙන්ම අනුමත කරනවා.

හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා හණ කර්මාන්තය සම්බන්ධයෙන් ගෙන ආ පළමුවන යෝජනාව ගැන කථා කරන අවස්ථාවේදී මා කීවා, මේ තාක් පැවති සෑම රජයකින්ම උඩරට ආසනවලට දක්වා තිබෙන්නේ කුඩම්මාගේ සැලකිල්ල බව. සෞඛ්‍ය අතින් බලන විට, 1965 මාර්තු මාසයෙන් පසු ජාතික රජයේ සෞඛ්‍ය ඇමතිතුමාට පින් සිදු වන්නට කොත්මලේ වැනි ඡන්ද කොට්ඨාශවලට හඳ පායාගෙන එන බව මම මේ අවස්ථාවේදී සන්තෝසයෙන් මතක් කරන්නට කැමතියි. මගේ ආරාධනාවක් පිළිගෙන ගරු සෞඛ්‍ය ඇමතිතුමත් සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තුමිත් මගේ ඡන්ද කොට්ඨාශයේ සංචාරයක් කළ අවස්ථාවේදී, ඒ කොට්ඨාශයේ සෞඛ්‍ය අංශයෙන් ඇති යම් යම් අපහසුකම් ඉදිරිපත් කළ විට ඒවා පිළිගත්තා. ඒ අපහසුකම් සම්බන්ධයෙන් දැනටමත් තරමක් දුරට කටයුතු කර තිබෙන බව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මට දැන ගන්නට ලැබුනා. මගේ ඉල්ලීමක් පරිදි මේ වර්ෂයේ දැනටමත් රුපියල් 72,000 ක් කොත්මලේ ආසනයේ සෞඛ්‍ය කටයුතු සඳහා වෙන් කර තිබෙන බව සතුටින් ප්‍රකාශ කරනවා. එසේ වුවත් හඟුරන්කෙත සහ කොත්මලේ කියන ආසන දෙකම එකම දිස්ත්‍රික්කයට අයිති එකම අන්දමේ අපහසුකම් තිබෙන සහෝදර ආසන දෙකක් නිසා හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර ඇති මේ යෝජනාව යටතේත් මගේ කොට්ඨාශයේ සෞඛ්‍ය අංශයෙන් ඇති අඩුපාඩුකම් කීපයක් සම්බන්ධව ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරවීමට මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පක්ෂයේ නායිකාව මේ රටේ අගමැතිනිය වශයෙන් සිටියදි පසුගිය මැතිවරණ කාලයේදී හදිසියෙන්ම අපේ කොත්මලෙත් මතක් වෙලා ඒ පළාතේ පොඩි රවුමක් ගිය බව මම මේ අවස්ථාවේදී මතක් කරන්නට සතුටුයි. එසේ යන අවස්ථාවේදී එතුමී එක්තරා ග්‍රාමීය ආරෝග්‍යශාලාවකට මුල් ගල තැබුවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමා දැනටමත් දන්නවා, එසේ ග්‍රාමීය ආරෝග්‍යශාලාවකට මුල් ගල තැබුවේ රන්වන්තලාවේ බව. මාර්තු මැතිවරණයෙන් පසු මේ රන්වන්තලාවේ ග්‍රාමීය ආරෝග්‍යශාලාවේ වැඩ කටයුතු උපන් ගෙයිම මැරී ගිය බව අපට පෙනුනා. මේ අවස්ථාවේදී පළාතේ අභිනව මන්ත්‍රීවරයා වශයෙන් මට ඉතාමත් බැරෑරුම් තත්ත්වයකට—විශාල මහජන අප්‍රසාදයකට—මුහුණ දෙන්නට සිදු වුනා, මේ ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවේ වැඩ කටයුතු ඇණහිටීම නිසා. කරුණු සොයාගෙන යන විට මට තත්ත්වය අවබෝධ වුනා. මේ රටේ අගමැතිනිය වශයෙන් එසේම ජාත්‍යන්තර නායිකාවක් වශයෙන් එතුමිය මේ විධියේ අකටයුතුවලට සහභාගිවීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සුදුසුද යන්න විසඳීම තමුන්නාන්සේගේ සුතුකමක්. එදා ඒ මැතිනිය ග්‍රාමීය ආරෝග්‍යශාලාවක් ගොඩනගනවාය කියා කොත්මලේට ගිහින් මුල් ගල තබා තිබෙන්නේ සකස් කළ සැලැස්මක්වත්, පිළිගත් යෝජනාවක්වත්, ඒ වාගේම වෙන් කළ මුදලක්වත්, වෙන කිසිම දෙයක්වත් නැතිව නිකම්ම පිට්ටනියකට බවයි මට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් දැන ගන්නට ලැබුණේ.

මහා මැතිවරණයෙන් පසු, මගේ ජය ග්‍රහණයෙන් පසු, ඒ ඡන්ද කොට්ඨාශයේ සිටින මගේ විරුද්ධකාරයෙක්—සෙනෙට් මන්ත්‍රීවරයෙක්—මේ ප්‍රශ්නය ආයුධයක් කරගෙන අභිනව මන්ත්‍රීවරයා වශයෙන් මාව ඒ පළාතේ ලොකු අප්‍රසාදයකට ලක් කරන්නට ව්‍යාපාරයක් ගෙන ගියා. එක්තරා අවස්ථාවක "ඇත්ත" හා "ජනදින" පත්‍රවල මට ලොකු තැනක් දී තිබුණා. මොකක්ද ඒ පත්‍ර වාර්තාවල සඳහන් වුණේ ? තුන් හවුල් රජය විසින් කොත්මලේ රනවන්තලාවේ ගොඩනැගීමට යෝජනා කළ ග්‍රාමීය ආරෝග්‍යශාලාව තැනීමේ වැඩ කටයුතු අභිනව මන්ත්‍රීවරයා විසින් ගරු සෞඛ්‍ය ඇමතිතුමාට විදුලි පුවතක් එවා සම්පූර්ණයෙන්ම නැවැත්වූවාය, ඒ ආරෝග්‍යශාලාව තැනීම අහෝසි කළාය, කියායි ඒ පත්‍ර වාර්තාවල සඳහන් වුණේ. ගරු සෙනෙට් මන්ත්‍රී ආනන්ද දසනායක මැතිතුමා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේදීත් මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කර තිබුණා. එය සෙනෙට් හැන්සාඩ් වාර්තාවේ සඳහන් වී තිබෙනවා. තුන් හවුල් ආණ්ඩුව විසින් රන්වන්තලාවේ ග්‍රාමීය ආරෝග්‍යශාලාවක් තනවන්නට ගියාය, නමුත් යම් කිසි පලිගැනීමක් උඩ මේ ජාතික රජය විසින් එය නැති කළාය, කියා අදත් කොත්මලේ ජනතාව අතර හැඟීමක් තිබෙනවා. මා පුළුවන් තරම් උත්සාහ ගත්තා මේ කාරණය පිළිබඳව ජනතාවට කරුණු පැහැදිලි කර දෙන්න. රටේ අගමැතිනිය වශයෙන් එදා සිටි අපේ විරුද්ධ පාර්ශ්වයේ නායිකාව මගේ චෝදනාවට ඇහුම්කන් දීමට මේ අවස්ථාවේදී සභා ගර්භයේ නොසිටීම ගැන මා කණගාටු වෙනවා. මේ කාරණය නිසා කොත්මලේ නවක මන්ත්‍රීවරයා වශයෙන් මාව අප්‍රසාදයට ලක් කිරීමට තවමත් ඉඩ තිබෙනවා. මා අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ කෙසේ හෝ මුදල් සපයා ගෙන වහාම රන්වන්තලාවේ ග්‍රාමීය ආරෝග්‍යශාලාවක් තනා මා මේ අපහාසයෙන් බේරා ගන්නා ලෙසයි. එසේ නොකලොත් විරුද්ධ පක්ෂයේ නායිකාව ගරු අගමැතිනිය වශයෙන් ඇටවූ උගුලක් නිසා මට කොහෙත්ම ජනතාවට මුහුණ දෙන්න අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් කාරණයක් තිබෙනවා. පසුගිය රජය කොත්මලේ වැනි ඈත පිටිසර ප්‍රදේශ ගැන නොසලකා හැරියා. මල්දෙණිය ග්‍රාමීය ආරෝග්‍යශාලාව ගැන මා විශේෂයෙන්ම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. මල්දෙණිය ආරෝග්‍යශාලාවේ වෛද්‍ය නිලධාරියාට නිවසකුත් බෙහෙත් දෙන ශාලාවකුත් ගොඩනැගීමට මුදල් වෙන් කර ඉඩම් වෙන් කර සැලැස්ම පිළියෙළ කර කොන්ත්‍රාත්තුව දුන්නෙ 1955 වර්ෂයේදීයි. ඒ කියන්නෙ 1952 සිට 1956 දක්වා මේ රට ආණ්ඩු කළ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව කාලයේදීයි. මගේ ආරාධනය පරිදි පසුගිය දවස්වල සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමිය මල්දෙණිය ආරෝග්‍යශාලාවට නිල ගමනක් ගියා. ඒ අවස්ථාවේදීයි මල්දෙනිය ආරෝග්‍යශාලාවේ මේ නිවාසයටත් බෙහෙත් දෙන ශාලාවටත් මුදල් වෙන්කර සැලැස්ම පිළියෙළ කර කොන්ත්‍රාත්තුව දුන්නෙ 1955 දී බව හෙළි වුණේ. 1955 සිට මේ වන තුරු අවුරුදු 11 ක පමණ කාලයක් තිස්සේ තවමත් ඒ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කරන්නට පුළුවන්කමක් ලැබී නැහැ. තවමත් ඒ වෛද්‍ය නිලධාරී නිවාසයත් බාහිර රෝගීන් සඳහා බෙහෙත් දෙන ශාලාවත් සාදා නිම කර නැහැ. දැනට මේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රජයේ මුදලුත් ලක්ෂ ගණනක් වැයවී තිබෙනවා. එපමණක් නොවෙයි, කොන්ත්‍රාත්තුව භාරගත් විවිධ සේවා සමුපකාර සංගමයේ කොන්ත්‍රාත්කරුවන් අතිනුත් මුදල් ලක්ෂ ගණනක් නැතිවී තිබෙනවාය කියා අපට දැනගන්නට ලැබී තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමා මේ සම්බන්ධව වහාම පරීක්ෂණයක් කර මාස දෙකක් තුනක් ඇතුළත මේ ගොඩනැගිලිවල වැඩ නිම කර ඒවා විවෘත කිරීමට අවස්ථාව සලසා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා. සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමිය මල්දෙණිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව පුළුල් කිරීම

ග්‍රාමීය ආරෝග්‍යශාලාවට ඒ නිල ගමන ගිය අවස්ථාවේදී එතුමිය එක් යෝජනාවක් එකහෙළාම පිළිගත්තා. කොත්මලේ බෙහෙවින් ගමන් අපහසුව ඇති ප්‍රදේශයක්. ළඟ පාත ග්‍රාමීය ආරෝග්‍යශාලාවක් තබා සාමාන්‍ය බෙහෙත් ශාලාවක්වත් නැති ප්‍රදේශ එහි තිබෙනව. එම නිසා අවට ගම් හත අටකම ප්‍රයෝජනය සඳහා තිබෙන මල්දෙණිය ආරෝග්‍යශාලාව ඉතා ඉක්මණින් ප්‍රාදේශීය දිස්ත්‍රික් ආරෝග්‍ය ශාලාවක් බවට පරිවර්තනය කළයුතුය කියා මා එදා කළ යෝජනාව ඉතා කාලෝචිත, ඉතා සුදුසු යෝජනාවක් හැටියට සෞඛ්‍ය කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියත් පිළිගත්ත. ඒ නිසා මෙම කාරණය අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කරවන්න කැමතියි.

ඇත්ත වශයෙන්ම අපේ සෞඛ්‍ය ඇමතිතුමාට තවම අවස්ථාවක් ලැබිල නැහැ, කොත්මලේ පිටිසර ගම් කීපයකට යන්ට. කුමන රජයක හෝ වේවා, ගරු ඇමතිවරු කවුරුත් පාහේ කරන ලොකු වරදක් තමයි, මේක. ගමනාගමන දුෂ්කරතා තිබෙන ආසනවල නිල ගමන් යනවිට තමන්ගෙ පහසුව සලකා වාහනයකින් යාහැකි දුර ප්‍රමාණය පමණක් ගොස්, ඒ අවට ස්ථාන පමණක් නරඹා, ඒවායේ අඩුපාඩු පමණක් සොයා බලා පැමිණීමයි බොහෝ විට කෙරෙන්නෙ. කොත්මලේ, හඟුරන්කෙත වැනි ආසනවල පවත්නා නියම තත්ත්වය දැකගන්ට නම් හැතැප්ම කීපයක් පයින් ගොස් ඒවායේ පිහිටි පිටිසර ගම් පරීක්ෂා කරන්ට ඕනැ. ඒ අන්දමට සොයා බැලුවොත් එම ආසනවල ගැමි ජනතාව කොතරම් දීන, දුගී තත්ත්වයක ජීවත් වෙනවාද යන්න දැක ගන්ට පුළුවන් වේවි.

මට එක්තරා සිද්ධියක් ගැන ලජ්ජාවක් නැතුව මතක් කරන්ට පුළුවනි. කොත්මලේ මන්ත්‍රීවරයා වශයෙන් සිටියත් මෑත එක්තරා දිනක මට සිදු වුණා, එක ගමක එක්තරා ගැබිණි මාතාවකට මහ රෑ අමාරු වීම නිසා වැස්සට තෙමි-තෙමී, කුඩැල්ලන් කඩ කඩා, ඒ මාතාව පුටුවක තබා ඔසවාගෙන සැතපුම් 4 ක් පමණ දුර ගෙවා ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවක් කරා යන අහිංසක ගැමි පිරිසක් සමග එකතු වී යන්න. ඒ වාගේම පසුගිය දිනෙක රම්බොඩ දිස්ත්‍රික් ආරෝග්‍ය ශාලාවේ මා සිටියදීම ඇති වූ සිද්ධියක් ගැන කියන්ට පුළුවනි. එම ආරෝග්‍යශාලාවේ සිටි එක්තරා ගැබිණි මාතාවකට ඉතා අමාරු වූ නිසා ඇය ශල්‍ය කර්මයකට භාජන කිරීම පිණිස ඊට වඩා උසස් ආරෝග්‍ය ශාලාවකට ගෙන යායුතුය කියා වෛද්‍ය නිලධාරියා විසින් තීරණය කරන්ට යෙදුණා. එම දිස්ත්‍රික් ආරෝග්‍යශාලාවට කිට්ටුවෙන්ම තියෙන ආරෝග්‍ය ශාලාව නුවරඑළිය ආරෝග්‍යශාලාවයි. එම ආරෝග්‍යශාලාවෙන් ගිලන් රථයක් ගෙන්වා ගන්ට අපි පුළුවන් තරම් උත්සාහ ගත්ත. එවේලේ ටෙලිපෝන් කම්බි කැඩී ගොස් තිබුණු නිසා, එම පණිවුඩය දෙන්ට ලැබුණෙ නැහැ. එම නගරයෙ ඒ වෙලාවෙ කුලී මෝටර් රථයක් ලබා ගන්නවත් තිබුණෙ නැහැ. එදා රාත්‍රි 8 සිට පසුදා එළි වන තුරුම අපි උත්සාහ කළා, කාරෙකක් සොයා ගන්න. අපි හැම තැනම ඒ සඳහා ඇවිද්ද. පසුවදා උදේ 7ට පමණ යන්තම් වාහනයක් සොයා ගෙන ඒ ගර්භණී මාතාව නුවරඑළියට ගෙන එන විට ඇය අතරමගදී මිය ගියා. කොත්මලේ ප්‍රදේශයේ තිබෙන්නෙ, එවැනි කනගාටුදායක තත්ත්වයක්. එම නිසා මා ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා—මේ පිළිබඳව මා පුද්ගලිකවත් මතක් කර ඇති—ඒ ප්‍රදේශයට ඉතාම අවශ්‍ය කරන ගිලන් රථ, විශේෂයෙන් රම්බොඩ ආරෝග්‍ය ශාලාවට ඉතාම අවශ්‍ය කරන ගිලන් රථය ලබාදෙන හැටියට. කොත්මලේ කුලී මෝටර් රථයක් සොයා ගැනීම දුෂ්කරයි. කාර් අයිතිකාර ධනපති අය කොත්මලේ ඇත්තෙත් නැහැ. මාත් කාරයක් නැති දුප්පත් අහිංසක මන්ත්‍රීවරයෙක්. ප්‍රදේශයේ රෝගීන්ගෙ එහෙම තත්ත්වය නරක් වුණාම අපෙන් උදව් ඉල්ලීම සිරිතක්. මෙවැනි අවස්ථාවලදී අපටත් උදව් කරන්න බැරිකම් ඇති වෙනව. එම නිසා මේ කාරණය ගැන තමුන්නාන්සෙගෙ කාරුණික සැළකිල්ල යොමු කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

තව කරුණු එකක් දෙකක් පමණක් මතක් කර මගෙ කථාව අවසාන කරන්ට බලාපොරොත්තු වෙනව. අපට අපේ කොට්ඨාශවල ඇති අමාරුකම් පෙන්වා දීම සඳහා හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා සලසා දුන් මෙම අවස්ථාවෙන් අපි ප්‍රයෝජන ගන්ට ඕනැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රණතුංග මයා.]

ගොඩනැගිලි කීපයක් සහිත තවත් ග්‍රාමීය ආරොගය ශාලාවක් තිබෙනවා, කොත්මලේ, "කොත්මලේ" කියන නමින්ම. ගම් රාශියකට බෙහෙත් ලබා දීම සඳහා හොඳ ග්‍රාමීය ආරොග්‍ය ශාලාවක් බවට පරිවර්තනය කළ හැකි ස්ථානයක් තමයි ඒ. නමුත් එහි තිබෙන්නෙ, ඩිස්පෙන්සරියක් පමණයි. හොඳ තත්ත්වයක ගොඩනැගිලි හතරක් පහක් අවුරුදු ගණනාවක් තිස්සෙ වසා දමා තිබෙනව. මට මතකයි, අවුරුදු ගණනාවකට ඉස්සර එක්සත් ජාතික පක්ෂයේ රජය මගින් ගොඩනැගිලි රාශියක් තනා මෙය ග්‍රාමීය ආරෝගය ශාලාවක් බවට පරිවර්තනය කිරීමට කටයුතු කළ නමුත්, යම්කිසි දේශපාලන බලපෑමක් උඩ ඒ කටයුත්ත නවත්වා දමා, සාමාන්‍ය බෙහෙත් ශාලාවක් වශයෙන් අද වන තුරු පවත්වා ගෙන යනව. මේ නිසා කිසිම වැඩක් නැතුව ගොඩනැගිලි තුනක්ම ජරාවාස වී යනව. මේ කාරණය ගැන ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන අතරම, මේ ගැන පරීක්ෂණයක් පැවැත්තුවොත් මෙම අමතර ගොඩනැගිලි කීපය උපයෝගි කරගෙන ඉතාමත් පහසුවෙන්, සුළු වියදමකින්—සමහර විට වියදමක් නොකරම—මෙම බෙහෙත් ශාලාව ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවක් බවට පරිවර්තනය කිරීමට අවස්ථාව ලැබෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ හඟුරන්කෙත ගරු මන්ත්‍රීවරයා සඳහන් කළා, එතුමාගෙ ඡන්ද කොට්ඨාශයට ඉන්නෙ සෞඛ්‍ය පරීක්ෂකවරුන් තුන් දෙනෙක් පමණක් බව. මා කනගාටුවෙන් මතක් කරනව, හඟුරන්කෙත ඡන්ද කොට්ඨාශයට වඩා කොත්මලේ ඡන්ද කොට්ඨාශය විශාල වුණත්, වැඩි ජනගහනයක් ඇතත්, සිටින්නෙ සෞඛ්‍ය පරීක්ෂකවරුන් දෙදෙනෙක් පමණක් බව. එපමණක් නොවෙයි, අපේ ප්‍රදේශයට අයත් සෞඛ්‍ය පරීක්ෂකවරයා සිටින්නෙ නුවරඑළියෙයි. එම නිසා, අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා මේ කාරණය ගැන විශෙෂයෙන් සැලකිල්ල යොමු කොට, එතුමාට පුළුවන් කමක් තිබෙනවා නම්—මා හිතනවා මේ කාරණය ගැන කෙළින්ම පියවරක් ගනීය කියා—කොත්මලේ ප්‍රදේශය, සෞඛ්‍ය නිලධාරි තුමකුගේ පාලනය යටතෙ පවත්නා ප්‍රදේශයක් බවට පත් කළොත්, ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරි කොට්ඨාශයක් කිරීමට කටයුතු කළොත්, මම කලින් සඳහන් කළ අවහිරකම් රාශියක්ම මගහැර ගන්නට හැකි වන බව සඳහන් කරන්න කැමතියි.

කොත්මලේ ප්‍රදේශයේ ඇති යම් යම් සෞඛ්‍ය අපහසුකම් රාශියක් ගැන පසුගිය මාස කීපය තුළ කරුණු ඉදිරිපත් කළාට පස්සෙ ගරු සෞඛ්‍ය ඇමතිතුමා ඒ ගැන සලකා බලා ප්‍රදේශයේ ජනතාවට විශාල සහනයක් සැලසීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

කොත්මලේ ප්‍රදේශයේ වාහන ගමනාගමනය කරන්නට පුළුවන් ගම් දොළහකට—මධ්‍යස්ථාන දොළහකට—පමණ, සතියකට කීපවතාවක් පැමිණ ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය බෙහෙත් දීම සඳහා සංචාරක බෙහෙත් දෙන රථයක් යොදා තිබීම ගැන ප්‍රදේශයේ ජනතාව විසින් කරන ලද ඉල්ලීමක් ඉටු කර දීම ගැන, කොත්මලේ ජනතාව වෙනුවෙන් මම එතුමාට ස්තුතිවන්ත වෙනව. මේ අතරම එතුමාට මතක් කිරීමට කැමති කාරණයක් තිබෙනව. දැනට මෙම සේවය පටන් ගෙන ගත වී තිබෙන්නෙ හරියටම සුමාන තුනයි. සේවය ඉතාමත්ම ප්‍රශංසනීයයි. ප්‍රදේශයේ දුප්පත් ජනතාවට එයින් විශාල පහසුවක් ලැබී තිබෙනව. නමුත් පසුගිය වතාවෙ බෙහෙත් දීම සඳහා පැමිණි විට, එම රථය භාර නිලධාරියා කීව ලබන සතියෙ සිට බෙහෙත් දීම සඳහා පැමිණෙන්න අවස්ථාවක් ලැබෙන්නෙ නැත කියා. එසේ නොපැමිණෙන්නෙ බෙදා හැරීමට අවශ්‍ය බෙහෙත් ප්‍රමාණය කොළඹින් ලැබෙන්නෙ නැති නිසා බවත් සඳහන් කළා. එම නිසා ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉතාමත්ම බැගෑපත්ව ඉල්ලා සිටින්නෙ, අනිකුත් පිටස්තර කාරණාවලට වඩා මෙම කාරණය ගැන විශෙෂ සැලකිල්ලක් දක්වා, එතුමා ලොකු ඕනෑකමකින්, ලොකු උනන්දුවකින් පටන් ගත් මෙම සේවය දිගටම නොකඩවා පවත්වාගෙන යන ලෙසටයි. එසේ පවත්වාගෙන යා හැකි නම් කොත්මලේ ප්‍රදේශයේ ජනතාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉදිරි කාලය තුළදී ඩිස්පැන්සරි ඉල්ලා කරදර කරන එකක් නැහැ. එම නිසා, මෙම සංචාරක වෑන් රථය දිගටම පවත්වාගෙන යමින් ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය බෙහෙත් ලබා දීමට ඉදිරියටත් කටයුතු සලසන ලෙසයි ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් නැවතත් ඉල්ලා සිටින්නෙ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ප්‍රදේශයේ ඇති සෞඛ්‍ය අපහසුකම් ගැන කථා කිරීමට අවකාශයක් සලසා දුන් හඟුරන්කෙත ගරු මන්ත්‍රීවරයාටත් මේ අවස්ථාවේදී ස්තුති කරන්න කැමතියි.

අවසාන වශයෙන් එක් කරුණක් ගැන සඳහන් කරන්න ඕනැ. පසුගිය කාලයෙ රම්බොඩ ආරෝග්‍ය ශාලාවෙ දන්ත චිකිත්සාගාරයක් ඇති කළා. මේය අංග සම්පූර්ණ චිකිත්සාගාරයක්ය කියා මම හිතනවා. නමුත් දැන් මාස ගණනාවක් තිස්සෙ මෙම දන්ත චිකිත්සාගාරයෙ දොරවල් වසා තිබෙනව, දන්ත වෛද්‍යවරයකු හරියට පැමිණෙන්නෙ නැති නිසා. ගරු සෞඛ්‍ය ඇමතිතුමා ආරෝග්‍යශාලාව නැරඹීමට පැමිණි අවස්ථාවේදී මේ කාරණාව ගැන එතුමාට පැමිණිලි කළායින් පසුව, එතුමා ඒ ගැන ක්‍රියා කිරීම නිසා, නැවත වරක් සති දෙකක් පමණ එම නිලධාරියා පැමිණිය. ඉන් පස්සෙ නැවතත් නිලධාරියාගෙ ගමන නවත්වා තිබෙනව.

අද වන තුරුත් ඒ දන්ත චිකිත්සාගාරය වැසූ ගමන් තිබෙන්නේ. මේ පිළිබඳව සෙවූ මට දැනගන්න ලැබුනේ, නුවර එළියේ සිට කොත්මලේට එන්න ගියාම ඒ වෛද්‍ය නිලධාරියාගේ කාර් එකේ ටයර් ගෙවන ප්‍රමාණයටවත් ගමන් ගාස්තු නොලැබෙන නිසා ඒ ගමන නවත්වා ඇති බවයි. ඒ නිසා අමාත්‍යාංශයේ නිලධාරීන් ගරු ඇමතිතුමාගේ නියෝග පිළි නොපැද ඒවාට පිටු පා ක්‍රියා කරනවා නම් මහජනයාට අවශ්‍ය සෞඛ්‍ය සේවය ලබා දීමට ඇමතිතුමා වගබලාගන්නා මෙන් මම එතුමගෙන් ඉල්ලා සිටිනවා. මේ ගත වුණු 9 මාසය තුළ කොත්මලේ කොට්ඨාශයට පමණක් නොව පොදුවේ මුළු රටටම ලැබුණු සේවය පිළිබඳව මහජනයා ප්‍රශංසා කරනවා. ඒ නිසා ඊටත් වඩා හොඳ සේවයක් ලබාදීමට විධි විධාන සලසන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින අතර, හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ යෝජනාව මම සතුටින් සපිර කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

අ. භා. 7.4

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා. (හපුතලේ)
(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—ஹப்புத்தளை)
(Mr. W. P. G. Ariyadasa—Haputale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කොට ඇති මේ යෝජනාව යටතේ මගේ ඡන්ද කොට්ඨාශයේ ඇති අඩුපාඩුකම් රාශියක් පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවීමට මම බලාපොරොත්තු වෙනවා. රජයේ සේවකයකුට විරුද්ධව ප්‍රථම වරට මේ ගරු සභාවේදී චෝදනාවක් ඉදිරිපත් කිරීමට සිදුවීම ගැන මම කනගාටු වෙනවා. මේ පිළිබඳව කුමක් කළ යුතුද කියා මම හොඳට කල්පනා කර බැලුවා. අවසානයේදී මම තීරණය කළා, මේ සම්බන්ධයෙන් මේ ගරු සභාවේදී ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළ යුතුය කියා. මා කියන්න යන මේ කාරණය පිළිබඳව ගරු ඇමතිතුමාත් දන්නවා ඇත කියා මම විශ්වාස කරනවා.

මගේ ඡන්ද කොට්ඨාශයේ කොස්ලන්දේ ආරෝග්‍යශාලාවක් තිබෙනවා. එහි සිදු වන යම් යම් දේ පිළිබඳව මට ආරංචි ලැබී තිබෙනවා. ගරු ඇමතිතුමාගේ පක්ෂයේ අයගේ නියෝජිත පිරිසක් මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා හමු වීමට පැමිණි බවත් මට දැනගන්නට තිබෙනවා. මා මේ අවස්ථාවේදී කථා කරන්නේ දේශපාලන පක්ෂ භේදයක් අනුව නොවෙයි. කොස්ලන්දේ ආරෝග්‍යශාලාවෙන් වෛද්‍යොපකාර ලබාගන්නා සෑම පක්ෂයකටම අයත් මහජනයා බලවත් කනස්සල්ලකට පත් වී සිටිනවා. ගරු ඇමතිතුමාගේ පක්ෂයට අයත් වැඩි දෙනකුගෙන් සමන්විත පෙළපාලියක් ගියා, මේ ආරෝග්‍යශාලාවේ වෛද්‍ය නිලධාරි මහතාට විරුද්ධව. ඒ බව ඇමතිතුමාටත් ආරංචි ඇති. මේ වාගේ දේ සිදු වන තවත් ආරෝග්‍යශාලාවක් ලංකාවේ නැතුව ඇති. එහි ඇඳන් අසූ ගණනක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව පුළුල් කිරීම

[ආරියදාස මයා.]

තිබෙනත් ලෙඩුන් සිටින්නේ 15 කට 20 කට නොවැඩි ගණනක්. එවැනි තත්ත්වයක් කොස්ලන්දේ ඇති මේ ආරෝග්‍ය ශාලාවේ මිස ලංකාවේ වෙනත් කිසිම ආරෝග්‍යශාලාවක ඇතැයි මම විශ්වාස කරන්නේ නැහැ.

මෙහි සිටින වෛද්‍ය නිලධාරියාට විරුඬව නැඟී තිබුණු චෝදනා විභාග කළ අවසථාවේදී සාක්ෂි දුන් අයගෙන් වැඩි පිරිස ගරු ඇමතිතුමාගේ පක්ෂයට අයත් උදවිය බව මට ආරංචියි. නමුත් අවසානයේදී කුමක්ද සිදු වී තිබෙන්නේ ? ඒ වෛද්‍ය නිලධාරියා එහිම සිටිනවා. පුළුවන්කමක් තිබෙනවා නම් ගරු ඇමතිතුමාම එහි පැමිණියොත් එතුමාට අවබෝධ වේවි, මා කියන දෙයෙහි සත්‍යයක් තිබෙනවාද නැද්ද කියා. ඒ නිසා මම ඉතා ගෞරවයෙන් ආරාධනා කරනවා, පුළුවන් කමක් තිබෙනවා නම් කොස්ලන්දෙ ආරෝග්‍යශාලාවට පැමිණ ඒ අවට සිටින පිරිසගෙන් මේ සම්බන්ධව වග විභාග කර බලන්නය කියා. එවිට නමුත් නාන්සේට මේ කාරණය ගැන හොඳ අවබෝධයක් ලබා ගැනීමට පුළුවන් වේවි. එම පරීක්ෂණය නැත්නම් විභාගය පැවැත්වූවාට පස්සෙ සිදු වී තිබෙන්නෙ කුමක්ද? විභාගය පැවැත්තුවෙ එම අරෝග්‍යශාලාවේ සිටින වෛද්‍ය නිලධාරි මහත්මයාට විරුඩවයි. නමුත් සති කීපයක් යන්නට මත්තෙන්, ඒ අරෝග්‍යශාලාවේ සෑම දෙනකුගේම සිත් දිනාගෙන සිටි ඇපොතිකරි මහත්මයා මාරු කර යැවීමේ වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවා. මේ විධියේ සිද්ධියක් ඇති වීමට හේතුව කුමක්ද ? එහි සිටින වෛද්‍ය නිලධාරී මහත්මයා කියනවාලු, කවුරු කොපමණ පෙත්සම් ලිව්වත් තමා මොන එහෙකටවත් බය නැත, තමා ඇමති මණ්ඩලයේ සිටින ඇමති කෙනෙකුගේ—සෞඛ්‍ය ඇමතිතුමාගේ නොවෙයි—නෑදෑයෙක්ය කියා. එපමණක් නොවෙයි, ඒ වෛද්‍ය නිලධාරී මහත්මයා එක දිනක් වැල්ලවායේ පොලිස් ඉන්ස්පෙක්ටර් මහත්මයත් සමග තම වාහනයෙන් වැලිමඩ පාරෙන් බණ්ඩාරවෙල නගරයට එන අතරමඟදී හිටපු ගම් සභාපතිවරයෙක් මුණ ගැසී තිබෙනව. ඒ ගම්සභාපතිවරයා මොහුට විරුද්ධව සාක්ෂි කී කෙනෙක්. එසේ මුණ ගැසුණ සැටියේම කාර් එක නවත්වා, සාක්කුවෙන් පිස්තෝලය අරගෙන අර ඉන්ස්පෙක්ටර් මහතා ඉදිරිපිටදීම මොහුට වෙඩි තබන්න තර්ජනය කර තිබෙනව. දැන් ඒ සම්බන්ධ නඩුවක් තිබෙනව. පොලිස් ඉන්ස්පෙක්ටර් මහත්මයෙකුත් කාර් එක තුළ වාඩි කරවාගෙනයි මෙසේ වෙඩි තැබීමට තර්ජනය කර තිබෙන්නෙ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

ඒ සම්බන්ධ නඩුවක් තිබෙනවා නම් ඒ ගැන කරුණු සඳහන් කරන්න එපා.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

මා හිතනවා ඒ ගැන නඩුවක් තිබෙනවාය කියා. ඒ සම්බන්ධයෙන් මතක් කරන්න සිදු වීම ගැන කනගාටු වෙනව. ඔය විධියේ සිදු වීම් රාශියක් එම ආරෝග්‍ය ශාලාවේ සිදු වේගෙන යනවා. එක් සේවකයකුට විරුද්ධව මා ප්‍රථම වරට කළ චෝදනාව කළ යුතුද නැද්ද කියා මම බොහෝම කල්පනා කිරීමෙන් පසුවයි කෙළේ. මගෙන් කීප දෙනෙක්ම ඇසුවා ඇයි මේ ගැන නිශ්ශබ්ද වෙන්නෙ, මොන ක්‍රියා මාර්ගයක්ද මේ ගැන ගන්න බලාපොරොත්තු වන්නෙ කියා. ඊට පසුවයි මම තීරණය කර ගත්තේ ඒ සම්බන්ධයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමාට දැනුම් දිය යුතුය කියා.

මී ළඟට තවත් කාරණාවක් ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙනව. එනම් දියතලාවෙ නගරය සඳහා යෝජිත ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව ගැනයි. ආරෝග්‍ය ශාලාවක් ඒ ප්‍රදේශයට ඉතාමත් අවශ්‍යය කියා මම සෞඛ්‍ය ඇමතිතුමාට සැල කර සිටීමට කැමතියි. බණ්ඩාරවෙල නගරයේ ආරෝග්‍ය ශාලාවක් තිබුණත්, දියතලාව විශාල ජන ගහනයකින් යුත් ගම් රාශියක් අවටින් පිහිටි නගරයක් නිසාත්, වැලිමඩ, ගුරුතලාව, ගල්ලේදණ්ඩ වැනි විශාල ගම් කීපයකටද ප්‍රයෝජනවත් වන නිසාත්, දියතලාවෙ යෝජිත ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව පිළිබඳ කටයුතු ඉක්මනින් කරන හැටියට ගරු ඇමතිතුමාට මතක් කරනවා. මා එසේ ඉල්ලීමක් කරන්න හේතුව මෙමම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෝජිත ආරෝග්‍යශාලාව ගැන ළඟදී යම් වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමට බලා පොරොත්තුවක් නැති බවට මට ආරංචි යක් ලැබී තිබෙන නිසයි. මම ගරු ඇමති තුමාගෙන් නැවතත් වරක් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, පුළුවන්කමක් තිබෙනවා නම් දියතලාව ප්‍රදේශයට පැමිණ ආරෝග්‍ය ශාලාවක් අවශ්‍යද නැද්ද කියා සෝදිසි කර බලන්නය කියා. එසේ සෝදිසි කර බලා එම ආරෝග්‍යශාලාව ලබා දෙන හැටියට මම ඉල්ලා සිටිනවා.

කොස්ලන්දේ හල්දුම්මුල්ල මාතෘ නිවාසය ඒ ප්‍රදේශයට විශාල සේවාවක් ඉටු කරන මාතෘ නිවාසයක්. එම ස්ථානයට තවත් අවශ්‍ය ගොඩනැගිලි ඉදි කර එය ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවක් බවට පරිවර්ත නය කර විශාල සේවයක් සැලැස්වීමට සෞඛ්‍ය ඇමතිතුමාගේ බලාපොරොත්තු වක් තිබෙනවාය කියා මම අදහස් කරනව. මේ කරුණු පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන අතරම, වැඩි කල් නොගොස් ගරු ඇමතිතුමා මේ ඉල්ලීම් ඉටු කර දුන්නොත් එතුමාගෙන් ඒ ප්‍රදේශවලට විශාල සේවයක් සිදුවන බව මා කියන්න කැමතියි. මේ සැම දෙයක් ගැනම පරීක්ෂා කිරීමට ගරු ඇමතිතුමාට පුළුවන්කම තිබෙනව. එතුමාට විවේකයක් තිබෙනවා නම් ඒ ඡන්දදායක කොට්ඨාශ යට පැමිණ මේ කරුණු ගැන පරීක්ෂා කර බලක්නය කියා මා ඉල්ලනව.

එමෙන්ම ඒ ප්‍රදේශයේ තිබුණු බෙහෙත් දෙන මධ්‍යස්ථාන කීපයක්ම වසා දමා තිබෙ නව. එයට හේතුව නිලධාරීන්ගේ වරද නොවෙයි. ඇතැම් අවස්ථාවල ඇති වන යම් යම් අමාරුකම් නිසා එසේ වුණා වෙන්න පුළුවන්. ඒ ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන හැටියට මා ඉල්ලා සිටිනව.

මේ කරුණු ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන හැටියට ඉල්ලා සිටි නව. විශේෂයෙන්ම මා කලින් සඳහන් කළ කොස්ලන්දේ සිද්ධිය සම්බන්ධයෙන් ඉක්මනින් සහනයක් ලබා දුන්නොත් එහි ගෞරවය අමතිතුමාට ලැබෙනවාට කිසිම සැකයක් නැහැ.



අ. භා. 7.14

**විජේතුංග මයා.**

*(திரு. விஜேதுங்க)*

(Mr. Wijetunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හඟු රන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ ඉතාම වැදගත් යෝජනාවට අනුකූලව කරුණු ස්වල්පයක් ඉදිරිපත් කිරීමට මා බලා පොරොත්තු වෙනව. හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව මධ්‍යම ආරෝග්‍ය ශාලාවක් බවට පත් කිරීමටයි. මේ ග්‍රාමීය ආරෝග්‍යශාලා ක්‍රමය ජෝර්ජ් ආර්. ද සිල්වා මැතිතුමා ආරම්භ කළ එකක්. ඒ සම් බන්ධයෙන් එතුමාගේ නාමය ගෞරව යෙන් මතක් කරන්න කැමතියි. මේ ග්‍රාමීය ආරෝග්‍යශාලා යහපත් සේවයක් කරන මධ්‍යස්ථාන වශයෙන් තවමත් ගම්වල පවතිනව. මේ රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව මධ්‍යම ආරෝග්‍යශාලාවක් කිරීමේ වැදගත්කම ගැන සලකන විට, ලංකාවේ ගම් වල තිබෙන අනිකුත් ග්‍රාමීය අරෝග්‍යශාලාත් මධ්‍යම ආරෝග්‍ය ශාලා බවට පත් කිරීම යෝග්‍යය යන්න අපට පෙනී යනව. ඊට අනුකූලව වචනයක් දෙකක් මා විසිනුත් කිව යුතුව තිබෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද නගරවල ආරෝග්‍යශාලාවල තිබෙන තත්ත්වය ගම්වල ආරෝග්‍යශාලාවල නැති බව තමුන්නාන්සේ දන්නව. ඒ කාලයේදී ග්‍රාමීය ආරෝග්‍යශාලා ඇති කළේ සාමාන්‍යයෙන් මධ්‍යස්ථාන වශයෙන් සලකා ගෙනයි. ඉන් පසු ඒ ගම්වල ජනගහනය විශාල වශයෙන් වැඩි වී තිබෙනව. ඒ නිසා රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව ගැන කල්පනා කර බලන විට අපට පෙනී යන කරුණක් තිබෙනව. ඒ පළාත්වල පිහිටීම අනුව බලන විට ලෙඩෙකු හැතැප්ම 4ක් හෝ 5ක් ඇඳකින්, පල්ලැක්කියකින් හෝ පුටුවකින් උසුලාගෙන යන්නට සිදු වීම පුදුමයට කරුණක් නොවෙයි. එසේ ලෙඩෙකු උසුලාගෙන පැමිණියත්, සමහර විට විදින්නට බෙහෙතක් නැත්නම් හෝ ශල්‍ය කර්මයක් කිරීමට වෛද්‍යවරයෙක් නැත්නම් හෝ "ඇම්බියුලන්ස්" එකකින් මධ්‍යම ආරෝග්‍ය ශාලාවකට ගෙනයාමට රථයක් ගෙන්වා ගැනීමට දුරකථන පහසු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේතුංග මයා.]

කම් නැත්නම්, සමහර විට වර්තමාන රජය කෙරෙහි සාමාන්‍ය ගැමි ජනතාවගේ අප්‍රසාදයක් ඇති වන්නට ඉඩ තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමාගේ වැඩ කටයුතු ගැන ප්‍රසංශා කරන අතරම, නගරවල තිබෙන මධ්‍යම ආරෝග්‍යශාලා වෙනුවෙන් වියදම් හා මහන්සියක් දරන්නා සේම වැඩි දුප්පත් ජනතාවක් සිටින ගම්වල ග්‍රාමීය ආරෝග්‍යශාලා ගැනද විශේෂයෙන් සලකා බලන ලෙස මා ඉල්ලා සිටිනවා. සාමාන්‍යයෙන් රජයේ බෙහෙත් ශාලාවලින් බෙහෙත් ගැනීමට අවශ්‍යව ඇත්තේ දුප්පත් ජනතාවටයි. හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා කීවා වගේ හොඳ පිහිටීමක් හෝ දේශගුණයක් හෝ වාතාශ්‍රයක් තිබුණත්, සමහර විට දුප්පත්කම නිසා හොඳ ආහාර නොලැබීමෙන් මහජනයාට ලෙඩ හැදෙන්නට ඉඩ තිබෙනවා. ඒ නිසා ගම්බදව පිහිටුවා තිබෙන ග්‍රාමීය ආරෝග්‍යශාලාවලටත් නගරවල තිබෙන ආරෝග්‍යශාලාවල තත්ත්වයටම නැති වුණත් ඊට කිට්ටු ප්‍රමාණයකින්වත් පහසුකම් සලසා දීම වර්තමාන රජයේ වැදගත් පියවරක් හැටියට ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි.

ග්‍රාමීය ආරෝග්‍ය ශාලා ක්‍රමය ලංකාවේ සෞඛ්‍යය දියුණු කිරීමේ ක්‍රමයේ වැදගත් පියවරක්. ලංකාවේ සෑම ප්‍රදේශයකම පාහේ ග්‍රාමීය ආරෝග්‍යශාලා පිහිටුවා තිබෙනවා. ඒවා අඩු වශයෙන් මහජනයාට අත්‍යවශ්‍ය පහසුකම් සලසන ස්ථාන හැටියටවත් පරිවර්තනය කළහොත්, නගරවල ඇති මධ්‍යම ආරෝග්‍යශාලාවල තදබදය සම්පූර්ණයෙන්ම මගහැර ගැනීමට හැකි වේ යයි මා හිතනව. ඒ නිසා හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට අනුකූලව වචන සවල්පයක් කථා කිරීමට ලැබීම ගැන මා සන්තෝස වෙනව.

මෙහි තවත් පැත්තක් තිබෙනව. ලංකාවේ මහජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය දියුණු වෙනවා නම්, අරෝග්‍යශාලා වසා දැමිය යුතුයි. එහෙත්, ලංකාවේ මහජනයාගේ සෞඛ්‍ය තත්ත්වය ගැන අද ලොකු විචිකිච්ඡාවක් දෙපාර්තමේන්තුවේ හා මේ ගරු සභාවේ පමණක් නොව රටේ සෑම තැනකම තිබෙන බව අපි කල්පනා කරන්න ඕනෑ. අපි පොඩි කාලයේ පාසැල් යන අවධියේ රෝග නිවාරණ ක්‍රමය නමැති පොත් පිංචකින් හෝඩියේ පටන් ඉගැන්නුවා, සෞඛ්‍ය ගැන. අද රෝග නිවාරණයක් නැහැ; අද තිබෙන්නේ බෙහෙත් කිරීම පමණයි. ලංකාවේ රෝග නිවාරණය ගැන සෞඛ්‍ය නිලධාරීන් අද අනුගමනය කරන ක්‍රම ප්‍රමාණවත් මදි බව මේ අවස්ථාවේදී ඇමතිතුමාට මතක් කරන්ට කැමතියි. අප නියෝජනය කරන කඳුකර ප්‍රදේශවල සාමාන්‍යයෙන් ලෙඩ රෝග අඩුයි. රෝග නිවාරණ ක්‍රම ගැන කථා කරන විට මම පෙන්නා දෙන්නට කැමතියි, ලංකාවේ අධ්‍යාපන සැලැස්මේ කෘෂිකර්මය අනිවාර්ය විෂයයක් වශයෙන් "සිලබස්" එකේ හෙවත් නිර්දේශ පත්‍රයේ යොදා තිබෙන්නා වගේම සවස්ථතාවත්—රෝග නිවාරණ ක්‍රමය නමැති විෂයයත්—අනිවාර්ය විෂයයක් හැටියට පාසැල්වල උගන්වන්ට පටන් ගත්තොත්, ඉස්පිරිතාලවල, වෛද්‍යහල්වල තිබෙන තදබදය ටිකක් අඩු කර ගැනීමට පුළුවන්කම තිබෙනව බව.

ගම්බද ආරෝග්‍යශාලාවකට ඉතා අමාරු ලෙඩෙක් හැටියට ගෙනෙන්නේ ගර්භණී මාතාවක් වගේ කෙනෙක් පමණයි. සමහර විට නියුමෝනියා නැත්නම් පාචනය හැදුණු කෙනෙක්, සෙම්ප්‍රතිශ්‍යාව ටිකක් කල් අත පසු කළ ලෙඩෙක්, වැනි කෙනෙක් තමයි. සාමාන්‍යයෙන් ඒවාට ඇතුළු වෙන්නෙ. එසේ නැත්නම් කකුලක් කඩාගෙන තුවාලයක් වෙලා ඊට පණුවො ගැසූ කෙනෙක් එසේත් නැත්නම් දබරයක් වෙලා තුවාල වුණු කෙනෙක් හෝ පිහි ඇණුම් කෑ කෙනෙක් වැනි කෙනෙක් තමයි, මේ ආරෝග්‍යශාලාවලට එන්නෙ. ගරු ඇමතිතුමා ග්‍රාමීය ආරෝග්‍යශාලා සියයකින් වාර්තා ලබා ගත්තොත් මේ මා සඳහන් කළ අන්දමේ රෝගීන් වැඩිපුර ඒවාට ඇතුළු වී තිබෙන බව පෙනී යනවා ඇති. වැඩිපුරම ඒවාට ඇතුළු වෙන්නේ මෙවැනි රෝගීනුයි. එම නිසා කොළඹ මහාරෝග්‍යශාලාවට වගේ වෛද්‍ය විශේෂඥයින් ඒ ආරෝග්‍යශාලාවලට වුවමනා යයි මා හිතන්නෙ නැහැ. එහෙත් හඟුරන්කෙත මන්ත්‍රීතුමාගේ යෝජනාවේ වැදගත්කමක් තිබෙනව. ඒ මේකයි. ඉතාමත්ම අවශ්‍ය, අත්‍යවශ්‍ය—අපි "අත්‍යවශ්‍ය" යයි කියමු—පහසුකම් කීපයක් ඒවායේ ඇති කරන්ට ඕනෑ. පොඩි ශල්‍යකර්මයක් කරන්ට, නූල් දෙපටක් තුන් පටක් ගසා බෙහෙත් ටිකක් දමන්ට, සිහි නැති වූ ලෙඩෙකුට සිහිය ලබා දී ඉන්ජෙක්ෂන් එකක් ගහල පිටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්ට, ඔය ආදි කටයුතු සාමාන්‍යයෙන් ඇපෝතිකරි කෙනෙකුට කරන්ට පුළුවන් කමක් නැහැ. එම නිසා ග්‍රාමීය ආරෝග්‍ය ශාලා සැමෙකක්ම වගේ වෛද්‍ය නිලධාරි යෙක් සිටින ආයතනයක් බවට පරිවර්තනය කරන්ට ඕනෑ. ඊට ලොකු මුදලක් වියදම් වන බව අප දන්නවා. නිලධාරීන්ගේ පඩි සඳහා වැඩිපුර මුදලක් ලබා ගන්ට ගරු සෞඛ්‍ය ඇමතිතුමාට මේ ගරු සභාවට එන්ට සිදු වෙනවා. අතිරේක මුදලක් අනුමත කරවා ගැනීමට, ඇස්තමේන්තුවක් සමග. අප ඒවාට අනුකූල තාව දක්වා කථා කරන්ට කැමතියි. ඡන්දය දෙන්ට කැමතියි. උදව් කරන්ට කැම තියි. රටේ මුදල් තත්ත්වය ගැනත් අපි දන්නවා. එසේ වුවත්, නගරබද වෛද්‍ය පහසුකම් සම්බන්ධයෙන් එතරම් වැදගත් කමක් නැති, එහෙත් ග්‍රාමීය ආරෝග්‍යශාලා සම්බන්ධයෙන් ඉතාම අවශ්‍ය යයි සැලකෙන පහසුකම් සැපයීම ඉතා වැදගත් කාරණයක් බව ඇමතිතුමා පමණක් නොව අප කවුරුත් පිළිගන්නවා. මුළු රටම පිළිගන්නවා.

මගේ කොට්ඨාශයේ, විශේෂයෙන් මහ නුවර නගරයට යාබදව තිබෙන උඩුනුවර ඡන්ද කොට්ඨාශයේ, එකම ඉස්පිරිතාල යක්වත් නැහැ, හොඳ එකක්. ග්‍රාමීය ආරෝග්‍යශාලාවක් තිබෙනවා. එය බොහොම දුර්වලයි. අපේ ඇමතිතුමා මා ගැන අනුකම්පා කර එය දියුණු කරන්ට යන වා. වෙන කිසිම දෙයක් නැහැ. මාතෘ නිවාසයක් තිබෙනවා, එහි වතුර නැහැ; එළිය නැහැ; දෙස්තර මහත්මයාට නිවා සයක් නැහැ. සාත්තු සේවිකාවට නිවාස යක් නැහැ. ඈ එන්නෙ බොහොම එපිට සිටයි. ඒකට ලෙඩෙක් එන්නෙ ඉතා කලා තුරකින්. හදිසියේ ලෙඩෙක් ආවත් ඒ ලෙඩා මැරී යනවා. මෙවැනි නගරයට කිට්ටු පළාතක ග්‍රාමීය ආරෝග්‍යශාලාවක තත්ත්වය මෙතරම් දුර්වල නම් අපි කවුරුත් පිළිගන්නට ඕනෑ, හඟුරන්කෙත මන්ත්‍රීතුමා නියෝජනය කරන පිකිල්ල ගස්කඩ පළාතේ ග්‍රාමීය ආරෝග්‍යශාලාව ඊට වඩා භයානක තත්ත්වයක තිබෙ නවා ඇති කියන කාරණය. මන්ද, ඒ පළාත්වල පාරවල් දුර්වල නිසා හැතැප්ම හත අට තරම් දුර ලෙඩුන් උස්සාගෙන එන්නේ පුටුවල තබාගෙනයි. ගරු සෞඛ්‍ය ඇමතිතුමාට විවේක තිබෙන වෙලාවකදී අපේ පළාත්වල ග්‍රාමීය ආරෝග්‍යශාලාවල පවතින තත්ත්වය ගැන ටිකක් පරීක්ෂා කර බලන මෙන් අපි එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එතුමාට නොහැකි නම් පළාත් අනුව බෙදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙතුන් දෙනෙකුගේ කමිටුවක් මගින්වත් කරුණු සොයා බලා වාර්තාවක් ලබාගත්තොත්, ඒ අනුව සැලකිල්ලෙන් වැඩ කරන්ට ක්‍රමයක් යොදාගන්ට පුළුවන් යයි මා බලාපොරොත්තු වෙනවා.

සෞඛ්‍ය තත්ත්වය ගැන අද පාඨශාලාවල නිසි ඉගැන්වීමක් කෙරෙන්නේ නැහැ. සෞඛ්‍ය පරීක්ෂකවරුන් සම්බන්ධයෙන් හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කළා. මා නියෝජනය කරන කොට්ඨාශයේ 75,000ක් පමණ ජනගහණයක් ඉන්නවා. නමුත් එහි සෞඛ්‍ය පරීක්ෂක වරුන් සිටින්නේ දෙදෙනකු පමණයි. ජනගහණය වැඩි වුනාට සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව වැඩි වී නැහැ. ඒ අතර ඔවුන්ට වැඩ වැඩි කර තිබෙනවා. ප්‍රාදේශීය බල මණ්ඩලවල තිබෙන තේ කඩ පරීක්ෂා කිරීමත් අද ඒ මහතුන්ට පැවරිලා. දැන් ඒ මහතුන් කරන්නේ තේ කඩ පරීක්ෂා කිරීම විතරයි. තේ කඩ පරීක්ෂා කිරීමත්, බේකරි පරීක්ෂා කිරීමත් මිස වැසිකිළි පරීක්ෂා කිරීම හෝ ළිං පරීක්ෂා කිරීම හෝ රෝග සම්බන්ධයෙන් බහුලව කටයුතු කිරීම හෝ දැන් ඔවුන්ගෙන් වැඩිපුර සිදුවන්නේ නැහැ. මෙසේ වී ඇත්තේ මොන කාරණයක් නිසාදැයි මට කියන්නට බැහැ. සමහර විට මීට හේතුව බොහෝ දෙනකුට වැටහෙනවා ඇති. කියන්නට බැරි කාරණයක් මේ කටයුතුවල තිබෙනවා. කෙසේ වෙතත් සෞඛ්‍ය පරීක්ෂක මහතුන් තේ කඩ පරීක්ෂා කිරීමේ කටයුතුවලට උනන්දු වෙනවා වැඩියි. සෞඛ්‍ය පරීක්ෂක මහතුන් ප්‍රාදේශීය බල මණ්ඩලවලින් කරන ඉල්ලීම්වලට ඇහුම්කන් නොදී රෝග නිවාරණ ක්‍රම ගැන පමණක් ක්‍රියා කරනවා නම් වඩා හොඳයි. ඒ සඳහා ක්‍රමයක් ඇති කළොත් හොඳයි. වුවමනා නම් ප්‍රාදේශීය බල මණ්ඩලවලට වෙනම සෞඛ්‍ය පරීක්ෂකවරුන් පත් කරන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේතුංග මයා.]

පුළුවනි. කෙසේ වෙතත් මේ වැඩ දෙක එකට වෙළීම හොඳ මදි. නිතරම අපට ආරංචි වන්නේ සෞඛ්‍ය පරීක්ෂක මහතුන් එක්කෝ අතන තේ කඩය පරීක්‍ෂා කිරීමට ගිය බවයි; නැත්නම් මෙතැන බේකරිය පරීක්ෂා කිරීමට ගිය බවයි.

සාමාන්‍යයෙන් බඩ වැලේ රෝග හැදෙන්නේ නරක වතුර පානය කිරීම නිසයි. අපේ ගම්වල තිබෙන ළිං පිරිසිදු මදි. ප්‍රාදේශීය මණ්ඩල මගින් ඇස්තමේන්තු සම්මත කර ගෙන මුදල් වෙන් කරගෙන ළිං සෑදුවත් සමහර විට ඒවායේ වතුර හොඳ නැහැ. තවත් සමහර විටෙක ළිං සාදන්නේ හොඳ වතුර තිබෙන තැන්වල නොවෙයි. පිරිසිදු ජලය ලබා ගන්නා ක්‍රම ගැන ගැමියන්ට කියා දුන හොත් එසේ නැත්නම් පිරිසිදු ජලය ලබා ගත හැකි ළිං ලබා දීමට ක්‍රියා කළ හොත් අපේ ග්‍රාමීය සහෝදර සහෝදරියන්ට හැදෙන ලෙඩ රෝග බොහොමයක් අඩු කර ගන්නට පුළුවන් වෙනවා ඇති. රෝග නිවාරණ කටයුතු සඳහා ගරු ඇමතිතුමාගේ අවධානය බොහෝ දුරට යෙදවුවහොත් ආරෝග්‍යශාලා පවත්වා ගෙන යෑමේ තත්ත්වය දැනට වඩා පහසු වෙනවා ඇතැයි මා හිතනවා. නගර බදව නම් මිශ්‍ර ජනගහණයක් සිටින නිසා, නිතරම පිටින් මිනිසුන් එන යන නිසා රෝග ඇති වන්නට ඉඩකඩ තිබෙනවා. සහජයෙන් හැදෙන රෝග පමණක් නොව බෝ වන රෝගත් බොහොමයක් ඇති වන්නට පුළුවනි. ඒ නිසා නගරවල ආරෝග්‍යශාලා දියුණු කිරීම කොයි විධියට කරගෙන ගියත් කාටවත් ඒකට දෝෂයක් කියන්නට බැහැ. නමුත් ග්‍රාමීය ආරෝග්‍යශාලාවල දැන් තිබෙන තත්ත්වය ගැන ටිකක් සලකා බලා ඒවාට අත්‍යවශ්‍ය පහසුකම්වත් ලබා දීමට ක්‍රියා කරන අතරම රෝග නිවාරණ ක්‍රම ගැන අවධානය යොමු කර ඒ සඳහා කිසියම් වැඩ පිළිවෙළක් ක්‍රියාවේ යොදවන ලෙස ඉල්ලා සිටිනවා. රෝග නිවාරණ කටයුතු ගැන පාඨශාලා මාර්ගයෙන් හෝ කිසියම් වැඩ පිළිවෙළක් ඇති කළහොත් ඉදිරියට හැදෙන පරම්පරාවලටවත් ඒ පිළිබඳ හැඟීමක් අවබෝධයක් ලබා ගන්නට පුළුවන් වෙනවා ඇති. රට දියුණු කරන ගමන්ම, සමාජය දියුණු කරන ගමන්ම එහි සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව, රෝග වළක්වා ගැනීම පිළිබඳව හොඳ දැනීමක්, වැටහීමක් හා හැඟීමක් සමාජයට ලබා දෙන්නට පුළුවන් නම් එය ඉතාමත් වැදගත් සේවයක් බව මතක් කරන්නට කැමතියි, ඇත්තෙන්ම රෝග වළක්වා ගැනීම සම්බන්ධව පාඨශාලා මාර්ගයෙන් කිසියම් වැඩ පිළිවෙළක් ඇති කරනවා නම් එයින් ඉතාමත් වැදගත් සේවයක් සිදු වෙනවා.

දුර කථන පහසුකම් ග්‍රාමීය ආරෝග්‍යශාලාවලට අඩුයි. දුර කථන පහසුකම් ඇති කිරීම සඳහා ලොකු වියදමක් දරන්නට සිදු වන බව ඇත්තයි. එසේ වුවත් ගිලන් රථයක් ගෙන්වා ගැනීම වැනි කටයුතුවල දුර කථනයකින් සිදු වන සේවය ඉතා විශාලයි. ඉක්මනින් ගිලන් රථයක් ගෙන්වා ගෙන රෝගියෙක් මධ්‍යම ආරෝග්‍යශාලාවට ගෙන යෑම සඳහා ග්‍රාමීය ආරෝග්‍යශාලාවලට දුර කථන පහසුකම් ඉතාමත් අවශ්‍යයි. සාමාන්‍යයෙන් බොහෝ ග්‍රාමීය ආරෝග්‍යශාලාවලත්, මාතෘ නිවාසවලත් දුර කථන පහසුකම් අඩුයි. ඒ නිසා ඒ ගැන සැලකිල්ල යොමු කරන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ග්‍රාමීය ආරෝග්‍යශාලාවලට උසස් අධ්‍යාපනයක් ලැබූ වෛද්‍ය නිලධාරීන් පත් කිරීම අපහසු කාරණයක් බව අපටත් පෙනී යනවා. උසස් අධ්‍යාපනයක් ලැබූ වෛද්‍ය නිලධාරීන් යටත් පිරිසෙයින් මාසයකට එක් වතාවක් බැගින්වත් එක් ආරෝග්‍යශාලාවකට යැවීමට ක්‍රමයක් සකස් කළොත් ඇත්ත වශයෙන් මීට වඩා පහසුකම් ගම්බද දුප්පත් මහජනයාට ලැබෙනවට කිසිම අඩමානයක් නැහැ. ඒ නිසා හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවට අනුකූලව මා විසින් මේ ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලද කරුණු කෙරෙහි මේ ගරු සභාවේත් ගරු ඇමතිතුමාගේත් අවධානය යොමු කරනු ඇතැයි බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන අතර ඒ ගැන සෞඛ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනව. බොහොම ස්තුතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 7.29

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*

(The Hon. M. D. H. Jayawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා ගෙන ආ ඉතා වැගදත් යෝජනාව ගැන ගරු මන්ත්‍රීවරුන් කීප පොළක්—කොත්මලේ ගරු මන්ත්‍රීතුමා, යටිනුවර ගරු මන්ත්‍රීතුමා, හපුතලේ ගරු මන්ත්‍රීතුමා සහ උඩුනුවර ගරු මන්ත්‍රීතුමා වැනි ගරු මන්ත්‍රීවරුන් කීප පොළක්—විසින් කථා කීපයක් කර තිබෙනවා. මගේ කථාව සඳහා ඉතිරි වී තිබෙන්නේ පැය භාගයක් පමණ වූ කෙටි කාල සීමාවක් පමණක් බව ඔර්ලෝසුව දෙස බලන විට මට පෙනී යනවා. ඒ කෙටි කාලය ඇතුළත ගරු මන්ත්‍රීන් විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු කරුණු සියල්ලටම උත්තර දෙන්න උත්සාහ කරනවා.

රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව ගැන විශේෂයෙන් මා නො කිව්වට අනෙක් දේවල් ගැන මගේ කථාවේදී සඳහන් කරන විට ග්‍රාමීය ආරෝග්‍යශාලා වැඩි දියුණු කිරීම සඳහා අප ගෙන ඇති පියවර මොනවාදැයි යන්න පිළිබඳව ගරු මන්ත්‍රීවරුන්ට සෑහෙන අවබෝධයක් ඇති කර ගත හැකි වනු ඇතැයි මා විශ්වාස කරනවා. රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව ගැන මා නොකිව්වට හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුම අද ඒ ආරෝග්‍යශාලාව පවතින තත්ත්වය ගැන හොඳාකර දන්නවා ඇති. දැනට එහි තිබෙන්නේ ඇඳන් 38 ක් පමණයි. ආරෝග්‍යශාලාවේ නතර වී නේවාසිකයන් හැටියට ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සාමාන්‍ය ගණන 77 ක් වන අතර බාහිර රෝගීන්ගේ අංශයෙන් ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සංඛ්‍යාවේ සාමාන්‍ය ගණන 145 ක් බව සඳහන් කරන්න පුළුවනි. මේ ග්‍රාමීය ආරෝග්‍යශාලාවේ තත්ත්වය ගැන එක්තරා ප්‍රමාණයක හැඟීමක් ඇති කර ගැනීමට මේ සංඛ්‍යාලේඛන උපකාරී වනු ඇති. දරු ප්‍රසූතිය සඳහා එන ගර්භණී මාතාවන්ගේ සාමාන්‍ය ගණන මසකට 55 ක් වෙනව. ඒ අනුව බලන විට මේ ග්‍රාමීය ආරෝග්‍යශාලාව පුළුල් කිරීම ඇත්ත වශයෙන් අත්‍යවශ්‍ය කාරණයක් බව අප පිළිගත යුතුයි. ඒ කාරණය හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාට මේ අවස්ථාවේදී මතක් කරන්න සතුටුයි.

ඒ කාරණය ගැන කථා කරන විට ලංකාවේ තිබෙන ආරෝග්‍යශාලා ගැනත් වචන ස්වල්පයක් කථා කිරීමට මා අදහස් කරනවා. මේ තරම් ලෙඩුන් සංඛ්‍යාවක් සිටිද්දී ඒ අයට වුවමනා කරන තරම් ඇඳන් නැතැයි මහජනයා අද ගරු මන්ත්‍රීවරුන්ට දෝෂාරෝපනය කරනවා. ඒ වගේම ගරු මන්ත්‍රීවරුනුත් ඒ කාරණය සම්බන්ධනේ දෙපාර්තමේන්තුවට සහ අමාත්‍යාංශයටත් දෝෂාරෝපනය කරනවා. අද මුළු ලංකාවේම තිබෙන සියලුම ආරෝග්‍යශාලාවලට සපයා ඇති ඇඳන්වල සම්පූර්ණ ගණන 34,454 යි. ඒ කියන්නේ, මධ්‍යස්ථාන 417 ක තිබෙන්නේ ඇඳන් 34,454 ක් පමණයි. මේ ගණන් බටහිර රටවල තත්ත්වය සමග සසඳා බලන්න පුළුවනි. ඒ අනුව බටහිර රටවල් කල්පනා කරන්නේ රටේ ජනගහනයෙන් දාහකට ඇඳන් දහයක් තිබිය යුතුය කියායි. එහෙත් ලංකාවේ තිබෙන්නේ ජනගහනයෙන් දාහකට ඇඳන් 3.4 ක් පමණයි. ඒ අවනු සලකා බලන විට ඇඳන් 63,000 ක පමණ අඩුපාඩුවක් තිබෙන බව පෙනී යනු ඇති. බටහිර රටවල් සමග සසඳන විට අපේ රටේ විශාල අඩුපාඩුවක් ඇති බව පිළිගන්න ඕනෑ. ඇඳන් නැතැයි කියන තත්ත්වයේ නියම ආකාරය ඒ අනුව ගරු මන්ත්‍රීවරුන්ට තේරුම් යනු ඇති. ඇඳන් 34,000 ක් පමණයි තිබෙන්නෙ. ලෙඩුන් සංඛ්‍යාව අනුව සලකා බලන විට ඒ සම්බන්ධයෙන් විශාල අඩුපාඩුවක් තිබෙන බව කාටත් අවබෝධ වෙනවා ඇති. එහෙත් අවාසනාවකට කාරණයක් තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු. එම්. ඩී. එච්. ජයවර්ධන]

මොකක්ද ඒ කාරණය? අලුත් ගොඩ නැගිලි ඉදි කිරීම සඳහා වර්ෂයක් පාසා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට රුපියල් කෝටි දෙක හමාරක් හෙවත් ලක්ෂ දෙසිය පණහක් වෙන් කරන නමුත් ඒ සම්පූර්ණ මුදල් ප්‍රමාණය යොදා වැඩ කරන්න රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ශක්තිය නැහැ. රජයේ වැඩ දෙපාර්ත මේන්තුව අවුරුද්දකට රුපියල් අනූ ලක්ෂ යක පමණ වැඩ කරන නිසා විශාල මුදල් සම්භාරයක් වැය නොවී ඉතිරි වෙනව. ඇස්තමේන්තු මගින් විශාල මුදලක් වෙන් කරනු ලබන නමුත් වැය කරන්නේ එයින් සුළු ප්‍රමාණයක් නිසා බලාපො රොත්තු වන ගොඩනැගිලි ඉදි කෙරෙන් නෙ නැහැ. තම තමන් නියෝජනය කරන කොට්ඨාශවල වැඩ කටයුතු අතපසු කර තිබෙනවය කියා ගරු මන්ත්‍රීවරුන්ගෙන් අපට දොස් ලැබෙනව. ඒ කාරණය අපේ සැලකිල්ලට භාජන කරමින් ඉදිරියට වෙනත් දෙපාර්තමේන්තු මඟිනුත් ගොඩනැගිලි ඉදි කරවීම සඳහා කැබිනට් මණ්ඩලයෙන් අවසර බලාපොරොත්තු වුණා. දැන් ඒ අවසරය ලැබී තිබෙනව.

විශේෂයෙන් "ඉංජිනියරිං කෝපරේ ෂන්" එකට ලොකු ගොඩනැගිලිවල වැඩ කරන්න භාර දෙන්නයි බලාපොරොත්තු වන්නෙ. ඒ වුණත් රජයේ වැඩ දෙපාර්ත මේන්තුව අදත් එවැනි ක්‍රියා මාර්ගයක් අප අනුගමනය කරනවට වැඩි කැමැත් තක් දක්වන්නෙ නැහැ. අදත් ඒ උදවිය තුළ ඒ ගැන යම්කිසි ප්‍රමාණයක ඊර්ෂ්‍යා වක් පවතිනව. වෙනත් දෙපාර්තමේන්තු වලින් වැඩ කරවා ගැනීම ගැන රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කැමැත්තක් ඉදි කෙරෙන ගොඩනැගිලි නඩත්තු කිරීම නැහැ. වෙනත් දෙපාර්තමේන්තු මගින් පවා භාර ගන්නෙ නැහැ. මේ කාරණය ගරු අගමැතිතුමාට ඉදිරිපත් කර තිබෙ නව. කොහොම හරි අපේ වැඩ කරවා ගන්න ඕනෑ. රජයේ වැඩ දෙපාර්තමේන් තුව ලවාම කරවා ගන්න ගියොත් නම් එකක්වත් කරන්න බැරි වෙයි කියා අපි කියා සිටියා. ඒ සම්බන්ධයෙන් ඉතා ඉක්මනින් පියවරක් ගන්න පුළුවන් වෙතැයි බලාපොරොත්තු වෙනව. මීට ප්‍රථමයෙන් වැඩ කළාට වඩා ඉක්මනින් වැඩ කිරීමට අපි අදහස් කරනව. අපට තිබෙන ඇඳන් ප්‍රමාණය මදි බව මම මුලින්ම සඳහන් කළා. නමුත් සෞඛ්‍යය අතින් බලන විට එක කරුණක් ගැන පමණක් ලංකාවට සන්තෝස වන්නට පුළුවන්. ඇත්ත වශයෙන්ම ලංකාවේ සිටින සෞඛ්‍ය විශේෂඥයන් ගැන අපි සියලු දෙනාම ආඩම්බර වන්නට ඕනෑ. වුවමනා කරන සෞඛ්‍ය විශේෂඥයන් අපට ලැබී තිබෙනව. සෞඛ්‍ය විශේෂඥ යන් 500 ක් අපට වුවමනා කරනව. 424 දෙනෙක් අපට ඉන්නව. අධ්‍යාපනය ලබා ගැනීමට පිටරට ගිය විශේෂඥයෝ 75 දෙනෙක් ඉන්නව. ලංකාවේ තිබෙන විශාල ආරෝග්‍යශාලා සියල්ලෙහිම විශෙෂඥ අංශ වලට විශේෂඥයන් පත් කිරීමට අපට පුළුවන් බව මම සතුටින් මතක් කරනව. නමුත් ආරෝග්‍යශාලාවලට වුවමනා කරන් නේ විශේෂඥයන් පමණක් නොවෙයි. විශේෂයෙන්ම අපේ ආරෝග්‍යශාලාවලට පිරිසිදු ජලය වුවමනා කරනව. ඒ නිසා අපේ ආරෝග්‍යශාලා සෑම එකකටම වාගේ නළ මගින් පිරිසිදු ජලය ලබා දීම සඳහා මුදල් වියදම් කළ යුතු බව මම මූලික වශයෙන් තීරණය කර තිබෙනව. ඒ අනුව මුදල් වෙන්කර තිබෙන සැටි දැන ගත් තොත් තමුන්නාන්සේ සන්තෝස වෙනවා ඇති. මේ අවුරුද්දේ ඇස්තමේන් තුවල සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ 32, 33 යන පිටුවල පෙන්වා තිබෙනව, කොයි කොයි ආරෝග්‍යශාලාවලට අප ජලය ලබා දෙන්නට බලාපොරොත්තු වෙනවාද කියා. ඒ ආරෝග්‍යශාලාවල ලැයිස්තුව මෙසේයි:

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගාල්ල, අංගොඩ, තණමල්විල, මාන්තිව් ලාදුරු ආරෝග්‍යශාලාව, බලන්ගොඩ, මාතලේ, මැදගම, කොලොන්න, වැලිගම, ඇහැලියගොඩ, වලස්මුල්ල, අනුරාධපුර, මඩකලපුව, පොලොන්නරුව, මන්නාරම, ත්‍රිකුණාමලය.

මීට වඩා අපට කරන්නට බැහැ. වර්ෂය කට දෙන්නට පුළුවන් තරම් මේ වර්ෂයේ අපි දී තිබෙනවා. නළ මගින් පිරිසිදු ජලය සැපයීමටත්, නවීන ක්‍රමයට වැසිකිළි පහසුකම් සැපයීමටත් අපි අදහස් කර තිබෙනවා. එම නිසා පළමුවැනි පියවර වශයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් සෑම ආරෝග්‍යශාලාවකටම පිරිසිදු ජලය දීමට තීරණය කර මුදල් වෙන් කර තිබෙන බව සන්තෝසයෙන් මතක් කර නවා. මේ ආරෝග්‍යශාලාවලට ජලය සැපයී මට පමණක් නොව රසායනාගාර සැපයීම වත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රෝග පරීක්ෂා කිරීම පිණිස රසායනාගාර ඉතාමත්ම අවශ්‍ය බව තමුන්නාන්සේ දන්නවා. එම නිසා සෑම ආරෝග්‍යශාලාවක ටම මේ රසායනාගාර දෙන්නට අපි විධිවිධාන යොදා තිබෙනවා. ඒ සම්බන්ධ යෙනුත් අප පියවර කීපයක් ගෙන තිබෙන බව සන්තෝසයෙන් ප්‍රකාශ කර නවා. මින් ඉදිරියට අළුත් ආරෝග්‍යශාලා වල ගෙවන වාට්ටු ඇති නොකරන්නටයි, අපි අදහස් කරන්නෙ. සාමාන්‍ය දුප්පත් ජනතාවට පහසුකම් ලබා ගැනීමටයි, අපි අළුත් ආරෝග්‍යශාලා ඇති කරන්නෙ. අපට විශේෂඥයන් වුවමනා තරම් සිටින බව මම මොහොතකට පෙර කිව්වා. ඉදිරියට පුහුණුවන විශේෂඥයන් පෞද්ගලික අංශයට බැඳී කොළඹ තිබෙන පෞද්ගලික ආරෝග්‍යශාලා දියුණු කරාවියයි මම බලා පොරොත්තු වෙනවා. පොහොසත් අය එවැනි පෞද්ගලික ආයතනවලට ගොස් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්නවා ඇතැයි අපි කල්පනා කරනවා. ඒ අතරම දුප්පත් අයට ආණ්ඩුවේ ආරෝග්‍යශාලාවල සියලුම පහසු කම් ඇතිව හොඳම ප්‍රතිකාර ලබා දීමටයි, මේ රජය උත්සාහ කරන්නෙ.

වුවමනා තරම් වෛද්‍යවරු නැතැයි කියපු කාලයක් තිබුනා. දැනට ලංකාවේ තිබෙන වෛද්‍ය විද්‍යාල දෙකෙන් අවුරුද්ද කට වෛද්‍යවරුන් 300ක් පමණ පුහුණු වී සමර්ථ වන බව මම කියන්නට සතුටුයි. එයින් 175ක් පමණ රජයට ගන්නට බලා පොරොත්තු වෙනවා. අනික් 125 ට පෞද්ගලික අංශයට බැඳී වෛද්‍ය පහසු කම් නැති නොයෙක් නගරවල ඒ අයගේ පෞද්ගලික දිස්පෙන්සරි දමාගෙන ප්‍රති කාර කරන්නට පුළුවන් වෙනවා. එයින් මහජනයාට පහසුවක් සැලසේය කියා අපි විශ්වාස කරනවා. ඒ වෛද්‍යවරුන්ට පිටිසර පළාත්වල ප්‍රතිකාර කරන්නට ඉඩ ලැබෙනවා. ඒ සමගම මතක් කළ යුතු තවත් කරුණක් තියෙනවා. දැනට සියලුම සෞඛ්‍ය මධ්‍යස්ථාන තියෙන්නෙ සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන් භාරයෙයි. මා ඒ ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් කර තිබෙ නවා. ඒ සෞඛ්‍ය මධ්‍යස්ථාන භාරව වැඩ කිරීමට දැනටම සෞඛ්‍ය නිලධාරීන් 22 දෙනෙක් පත් කර තිබෙනවා. මේ වර්ෂය අවසානයේදී තවත් 28 දෙනෙකු පත් කළාම ලංකාවේ මේ මධ්‍යස්ථාන 84 කම මින් ඉදිරියට වැඩ කරන්නේ වෛද්‍ය නිලධාරීනුයි. එසේ කිරීමෙන් පහසුකම් දෙකක් සැලසෙනවා. යටිනුවර ගරු මන්ත්‍රී තුමා පාසැල්වල ළමයින්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කරන්නේ නැත කියා කිව්වා. ඇත්ත වශයෙන්ම අද පාසැල් ළමයින්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම ඇනහිට තිබෙනවා. ඒ නිසා මින් ඉදිරියට පාසැල්වලට පැමිණ පාසැල් ළම යින්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව පරීක්ෂා කර බැලීමට අප බලාපොරොත්තු වෙනවා. සාමාන්‍යයෙන් අවුරුදු 10ක පමණ කාලයක් පාසැලක සිටින ළමයකු ඒ කාල පරිච්ඡේදය තුළ අඩු වශයෙන් තුන් වරක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

වත් සෞඛ්‍ය පරීක්ෂණයකට භාජනය කිරීමට අප විධිවිධාන යොදා ගෙන යනවා. එපමණක් නොවෙයි. සෞඛ්‍ය නිලධාරීන් නැතිකම නිසා වතුවල වැඩ කරන ජනතා වගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමත් බොහොම කල් ගියා. ඒ කටයුතුත් ඉක්මණින්ම කරන්නට අප බලාපොරොත්තු වෙනවා. මා කලින් සඳහන් කළ පරිදි ඉදිරි කාලයේදී සෞඛ්‍ය මධ්‍යස්ථාන වලට සෞඛ්‍ය නිලධාරීන් පත් කිරීමෙන් පාසැල් ශිෂ්‍යාශිෂ්‍යාවන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමේ කටයුතුත් ඒවාගේම වතුවල ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමේ කටයුතුත් විධිමත් අන්දමින් කරන්නට බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සෞඛ්‍ය නිලධාරීන් පත්කරන්නේ වින්නඹු මතාවන්ගේ වැඩ කටයුතුත් දනට වඩා හොඳින් කරවීමටයි. ඇල්පිටිය, කුරුණෑගල ආරෝග්‍යශාලා පරීක්ෂා කිරීමට මා ගිය අවස්ථාවේදී මා දුටු දෙයක් තමයි නියම දිනට ප්‍රථමයෙන් ළමයින් ලැබෙන්නට සිටින ගර්භණී මාතාවන් ඒ ආරෝග්‍යශාලාවට පැමිණ සිටින බව. මා ඊට හේතුව කුමක්ද කියා සොයා බැලුවා. බොහෝ අවස්ථාවලදී අපේ සෞඛ්‍ය වින්නඹු මාතාවන් රාත්‍රී ඇවිත් කුද්දා කරන කරදරයෙන් බේරෙන්න වුවමනා වට ගර්භණී මවුවරුන් කලින්ම ආරෝග්‍ය ශාලාවලට පිටත් කරනවා. මේ හේතුව නිසා දරුවා ලැබෙන්න නියම දිනට ප්‍රථම යෙන් ගර්භණී මවුවරුන් බොහෝ ගණනක් ආරෝග්‍යශාලාවට පැමිණීමෙන් ආරෝග්‍යශාලා පිරී ඉතිරී තිබෙන අවස්ථා තමුන්නාන්සේලා දකින්න ඇති. නියෝජ්‍ය කථානායකතුමනි, එබඳු අවස්ථා හලාවත ආරෝග්‍යශාලාවේත් තිබෙනවා තමුන්නාන්සේත් දකින්නට ඇති. මේ තත්ත්වය නිසා මින් ඉදිරියට ගර්භණී මවුවරුන්ට ආරෝග්‍යශාලාවට ඇතුල් වීම සඳහා පළාතේ සෞඛ්‍ය නිලධාරිතුමා ගෙන් ලිපියක් ගත යුතුය කියා නියම කරනවා. සියලුම සෞඛ්‍ය මධ්‍යස්ථානවලට නිලධාරීන් පත් කිරීමෙන් පසුව ඒ පියවර ගන්නටයි අප බලාපොරොත්තු වන්නෙ. ඊටපසු සෑම මව් කෙනෙකුම මාස්පතා හෝ සතිපතා හෝ පළාතේ සෞඛ්‍ය මධ්‍යස්ථානයට ගොස් පරීක්ෂා කරවා ගෙන අවවාද උපදෙස් ලබා ගත යුතුයි. ඊට පසු ආරෝග්‍යශාලාවට ඇතුළත් වීමට ලිපියක් ලබා ගත යුතුයි. එවැනි වැඩ පිළිවෙළක් අනුගමනය කිරීමෙන් දනට පවතින ආරෝග්‍යශාලාවල තදබද ගතිය විශේෂයෙන්ම මාතෘ නිවාසවල පවතින තදබද ගතිය සම්පූර්ණයෙන් ම නැති කර ගන්නට පුළුවන් වේවිය කියා මා කල්පනා කරනවා.

ගරු කථානායකතුමනි, මේ නොබෝදා මා අගලවත්ත කොට්ඨාශයේ හදිසි පරීක්ෂණයක් සඳහා ගිය අවස්ථාවේ දී හොරවල ග්‍රාමීය ආරෝග්‍යශාලාවටත් ගියා. මා යන විට ඒ මාතෘ නිවාසයේ දොරවල් සම්පූර්ණයෙන්ම වසා තිබුණා. ඒ අවස්ථාවේදී එක වින්නඹු මාතාවක් වත් එහි හිටියෙ නැහැ. පරීක්ෂා කර බැලුවාම එක වින්නඹු මාතාවක් මාරු කර තිබෙන බවත් සිටින අනික් වින්නඹු මාතාවගේ සිහි කල්පනාව මදි නිසා ලෙඩුන් කවුරුවත් ඒ ස්ථානයට නොපැමිණෙන බවත් හෙළි වුණා. මෙපමණ කාල යක් තුළ මේ කාරණය ගැන පරීක්ෂා කර වාර්තා නොකළේ මොන හේතුවක් නිසාද කියා ඒ අවස්ථාවේදී මා පළාතේ සෞඛ්‍ය අධ්‍යක්ෂ තුමාගෙන් ප්‍රශ්න කළා. ඒ පළාතට සෞඛ්‍ය නිලධාරි මහත්ම යෙකු නැතිකම නිසා මේ කටයුතු අතපසු වුණාය කියායි මට දනගන්නට ලැබුණේ. ඒ නිසා මින් ඉදිරියට සෞඛ්‍ය නිලධාරීන් පත් කර දනට වඩා විධිමත් අන්දමින් මාතෘ නිවාසවලත් අනිකුත් සෞඛ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මධ්‍යස්ථානවලත් වැඩ කටයුතු කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට හඟුරන්කෙත, කොත්මලේ වැනි ප්‍රදේශවල වතුවල තිබෙන ආරෝග්‍යශාලා වලට ආධාර කිරීමට අප බලාපොරොත්තු වෙනවා. බෙහෙත් දෙන මධ්‍යස්ථානත් ආරෝග්‍යශාලාත් කීපයක්ම මේ වතුවල තිබෙනවා. ඒවාට ආධාර මුදල් දී වතුවල පමණක් නොවෙයි ප්‍රදේශයේ ජනතාවටත් ප්‍රතිකාර කරන්නට අවසරදෙන්නට අප බලාපොරොත්තු වෙනවා. වතුවලට යාව තිබෙන ප්‍රදේශවල ගැමියන්ට මේ ආරෝග්‍ය ශාලාවලින් ප්‍රතිකාර කරන්නට සූදානම්ය කියා මේ ආරෝග්‍යශාලා කීපයක්ම අපට දන්වා තිබෙනවා. ඒවායින් ප්‍රතිකාර ලබා ගන්නා ලෙඩුන්ගේ ප්‍රමාණය අනුව ඒ ආරෝග්‍යශාලාවලට ආධාර කරන්නටයි අප බලාපොරොත්තු වෙන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා වේ සමුපකාර ආරෝග්‍යශාලාත් කීපයක් ම තිබෙන බව අප දන්නවා. යාපනේ, බෙන්තර, කොළඹ, කුරුණෑගල ආදී නගරවල තිබෙන එබඳු ආරෝග්‍යශාලා මම දැක්කා. සාමාන්‍යයෙන් මෙවැනි ආරෝග්‍යශාලාවලින් ප්‍රතිකාර ගන්නේ දිනකට රුපියල් තුනක්, පහක් පමණ ගෙවිය හැකි මධ්‍යම පන්තියේ අයයි. මේ සමුපකාර ආරෝග්‍යශාලාවලට ආධාර මුදල් දීමටත් අප සතුටුයි. ඒ ආරෝග්‍ය ශාලා විශාල කිරීමට රුපියල් 15,000 රුපියල් 20,000 ණය මුදල් දෙන්න අප සතුටුයි. ඒවාගේම සමුපකාර ආරෝග්‍ය ශාලාවලට වුවමනා කරන පරීක්ෂණාදිය නොමිලයේ කිට්ටුවම තිබෙන රජයේ ආරෝග්‍යශාලාවලින් කරවා ගැනීමට ඉඩ දෙන්නත් අප සූදානමින් සිටිනවා. මේ ක්‍රමය අනුව සමුපකාර ආරෝග්‍යශාලා දියුණු කිරීමෙන් මධ්‍යම පන්තියේ ජනතා වට විශාල සෙතක් සැලසේවිය කියා මා විශ්වාස කරනවා. එවැනි ආරෝග්‍යශාලා වලට වුවමනා කරන උපකරණ තීරු බද්දක් නැතිව ගෙන්වන්නත් දැන් විධි විධාන යොදා තිබෙනව. සමුපකාර ආරෝග්‍ය ශාලා ලංකාවේ මීට වඩා ඇති වේවිය කියා අපි විශ්වාස කරනව. ඒවාට අවශ්‍ය උප කරණ දෙන්ටත් අපි බලාපොරොත්තු වෙනව. ඒ වාගේම ඒවා පරීක්ෂා කර බලා සුදුසු තත්ත්වයට උසස් කිරීමටත් බලාපොරොත්තු වෙනව.

අද කොළඹ මධ්‍යම බෙහෙත් ශාලා කීප යක් තිබෙනව. මා ලඟ දැන් සිටිනව, මීට පෙර සිටි නගරාධිපතිතුමෙකුත්. එතුමාගෙ කාලෙත් නගර සභාවට අයිති ආරෝග්‍ය ශාලා අපට භාර දෙන්ටය කියා—අපටය කියන්නෙ, මහ රජයට—මා ඉල්ලීමක් කළ බව මතක ඇති. මා එම ඉල්ලීම දැනුත් කරනව. කොළඹ නගර සභාවට් අයිති මාතෘ නිවාසවල ඇඳන් හිස්. අද ඒවයේ කවුරුවත් නැහැ. ඒව අපට භාර දුන්නොත් මීට වඩා හොඳ වෛද්‍ය විශෙෂඥයන් පත් කර වැඩ ගෙනියන්ට පුළුවනි. දැන් මා ඉදිරිපිට සිටිනව, විරුඬ පාර්ශවයෙ ගරු මන්ත්‍රීවරයෙකුත්. එතුමා මා කියන දේට හොඳින් ඇහුම් කන් දීගෙන සිටින බව පේනව. පුළුවන් නම් නගර සභාවට කියා මෙම කාරණය ගැන උනන්දු කරවන ලෙස මා ඒ අයගෙනුත් ඉල්ලා සිටිනව. අඩු වශයෙන් මාතෘ නිවාස 4 ක් වත් අපට භාර දෙන්ටය කියා මා කියනව.

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)
එකක්වත් හිස් නැහැ.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
අද කාසල් වීදියෙ මාතෘ නිවාසයෙත්, ද සොයිසා සූතිකාරොග්‍ය ශාලාවෙත් වැඩි

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හරියක් සිටින්නෙ—සියයට 90 ක් පමණම සිටින්නෙ—කොළඹ මව්වරුයි. ඒ අයගෙන් වැඩි දෙනාට එම ආරෝග්‍ය ශාලා දෙකට එන්ට කිසි වුවමනාවක් වෙන්නෙ නැහැ, මේ ආකාරයට කටයුතු කළොත්. විශෙෂයෙන් වැල්ලවත්ත, උතුරු කොළඹ, නාරාහේන්පිට සහ කොම්පඤ්ඤ වීදිය යන ස්ථානවල පිහිටි මාතෘ නිවාස 4 අපට භාර දෙනව නම්, අඩු වශයෙන් මව්වරු 200 කට 250 කට වත් පහසුකම් සලසා දෙන්ට පුළුවන් වේවි. එසේ වුණොත් කාසල් වීදියෙ තිබෙන මාතෘ නිවාසයෙත්, ද සොයිසා සූතිකා රෝග්‍ය ශාලාවෙත් අද පවතින තදබදය හුඟක් දුරට අඩු කරන්ට පුළුවන් වේවිය කියා අපි විශ්වාස කරනව. [බාධා කිරීමක්] මට ලැබී තිබෙන වාර්තාවල හැටියට පෙනෙන්නෙ, විශෙෂඥයන් නැති නිසා මව්වරු ඒවට යන්ට සතුටු නැති බවයි.

**ගරු සුගතදාස**
*(கௌரவ சுகததாச)*
(The Hon. Sugathadasa)
එසේ වුණත්, ඒවයෙ ඉඩ නැහැ.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
එම්. ආර්. සී. ඕ. ජී. විශෙෂඥයො. [බාධා කිරීමක්] එහෙනම් මට ලැබී තිබෙන්නෙ වැරදි වාර්තා වෙන්ට ඇති. යළිත් වරක් ඒවා ගැන පරීක්ෂා කර බලන්නම්. විශෙෂඥයො නැත කියායි, මට ලැබී ඇති වාර්තාවල තියෙන්නෙ. ඒ කෙසේ වෙතත් මා විශ්වාස කරනව, අපට එම ආරෝග්‍යශාලා හතර [බාධා කිරීමක්]. උතුරු කොළඹ ගරු මන්ත්‍රීතුමාගෙන්, ඒ කියන්නෙ ජනසතු සේවා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගෙන්, ඉල්ලා තිබෙනව ඉඩම් ප්‍රමාණයක්, උතුරු කොළඹ තවත් විශාල ආරෝග්‍යශාලාවක් ඉදි කරන්න. ඒ ගැන එතුමා [බාධා කිරීමක්] එක ඉඩමක් නම් දුන්න. ඒක මඩ වගුරක්. ඒකෙ ගොඩ නැගිල්ලක් ඉදි කරන්න බැරි නිසා මා වෙනත් එකක් ඉල්ලා තිබෙනව.

මා මෙතෙක් විස්තර කළේ, බටහිර වෙදකම ගැනයි. බටහිර වෙදකම කර ගෙන යන අතරම අපේ පැරණි සිංහල වෙදකම දියුණු කිරීමටත් විශාල උත්සාහයක් දරනව. බොරැල්ලෙ අළුත් ආයුර්වේද ආරොග්‍ය ශාලාවකට මුල් ගල් තබා ඇති බව තමුන්නාන්සෙල දන්නව ඇති. ලංකාවෙ ගම් සභා ප්‍රදේශ සෑම එකකටම එක ආරෝග්‍යශාලාවක් බැගින් පිහිටුවීම සඳහා අපි මුදල් දෙන්ට සූදානම්. ආයුර්වේද ආරොග්‍ය ශාලා සඳහා අපි මේ අවුරුද්දේ වියදම් කරන්ට බලාපොරොත්තු වන්නෙ, ලක්ෂ 270 යි. 1970 වන විට ලක්ෂ 840 ක් ඒ වෙනුවෙන් වියදම් කරන්ට අපි බලාපොරොත්තු වෙනව. අළුත් ආයුර්වේද ආරොග්‍යශාලා ඉදි කරන ප්‍රදේශ දැනටමත් තීරණය කර තිබෙනව. අවශ්‍ය නම් ඒවා කියන්නත් පුළුවනි. මහනුවර, කුරුණෑගල, හොරණ, යාපනේ, බදුල්ල සහ මඩකලපුව යන ස්ථානයි, ඒ. රත්නපුරයේ සහ බෙලිඅත්තේ ආයුර්වේද ආරොග්‍යශාලා දෙකක් විවෘත කරන්න බලාපොරොත්තු වෙනව, මේ අවුරුද්දෙම. විශෙෂයෙන් වෙසක් පොහොයට ප්‍රථම රත්නපුර ආයුර්වේද ආරොග්‍යශාලාව විවෘත කිරීමට බලාපොරොත්තු වෙන බව රත්නපුරයෙ ගරු මන්ත්‍රීතුමාට (ඩී. පී. ආටිගල මයා.) මා කියා තිබෙනව. ඒ පොරොන්දුව ඉටු කරන බව මා නැවත වරක් එතුමාට කියා සිටිනව. බෙලිඅත්තෙත් දැන් වැඩ ආරම්භ කර තිබෙනව. අපි මෙම අවුරුද්ද අවසානයට ප්‍රථම එය ඉවර කරන්ට බලාපොරොත්තු වෙනව.

බටහිර වෙදකමත්, ආයුර්වේදයත් ගැන මා දැන් කරුණු කීව. දොස්තර මහත්වරුන්ගේ තත්ත්වය අපේ ආයුර්වේද වෙද මහත්වරුන්ටත් ලබා දෙන්ට අපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලාපොරොත්තු වෙනව. දැන් ඒ විභාග වල තත්ත්වය උසස් කර තිබෙනව. ඊයෙ පෙරේද ආයුර්වේද විද්‍යාලයෙ ඇති වූ පුදුම සිද්ධිය ගැන මේ අවස්ථාවෙදි මතක් කරන්න ඕනැ. එහි වාර්ෂික පරීක්ෂණයක් පවත්වන අවස්ථාවෙ ඒ ළමයි වැඩ වර්ජනයක් ඇති කළා, එම වාර්ෂික පරීක්ෂණයට විරුද්ධව. එම පරීක්ෂණයට ඇතුළු නුනොත් අපි ආයුර්වේද විද්‍යාලය වසා දමනවය කියා ප්‍රකාශ කරන්න එම අවස්ථාවෙ අපට සිදු වුණා. අපි මේ කාරණා සියල්ලක්ම කළේ ඒ ළමයින්ගේ තත්ත්වය උසස් කරන්න, ලංකාවේ තිබෙන පැරණි ආයුර්වේද ක්‍රමය දියුණු කරන්න. ඒ අනුව විධිවිධාන කීපයක් යොදා තිබෙනව. වැඩි කලක් යන්නට පෙර—හෙට අනිද්දම—යාපනයෙ සංචාරයක යෙදෙන්න මම බලාපොරොත්තු වෙනව. එසේ යෙදුණාම, මම බලාපොරොත්තු වෙනවා ආයුර්වේදයේ සිද්ධ අංශය සම්පූර්ණයෙන්ම යාපනයෙ පිහිටුවන්න. එතකොට, කොළඹ බොරැල්ලෙ විද්‍යාලය සම්පූර්ණයෙන්ම සිංහල ආයුර්වේද ක්‍රමයට වෙන් කරන්නට පුළුවනි. මේ අනුව වැඩ කරන්න අපි බලාපොරොත්තු වෙනව.

ඒ වාගේම ගම්පහ තිබෙනව, අපේ සිද්ධ ආයුර්වේද විද්‍යාලයක්. ඒකට අපේ රජයෙන් ආධාර මුදල් දෙනව. අනිකුත් තැන්වලත් පිහිටුවිනවා නම් ඒවාට ආධාර මුදල් දෙනව. හැබැයි, යම් තත්ත්වයක තිබෙන්න ඕනැ. කොළඹ තිබෙන ආයුර්වේද විද්‍යාලයේ තත්ත්වය තිබෙන්න ඕනැ. සුදුසු ගුරු මහතුන්, පුහුණුවූ ගුරු මහතුන් ඉන්න ඕනැ. ඒ වාගේම ඒවායින් හොඳ පුහුණුවකුත් ලබා දෙන්න ඕනැ. ඒවා ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න අවකාශයක් නැහැ. කෙටියෙන් වුණත් මේ කාරණා මතක් කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනව.



ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බලාපොරොත්තු වෙනව, බටහිර වෛද්‍ය කම දියුණු කරන අතරම සිංහල වෛද්‍ය කමත් දියුණු කර සිංහල වෛද්‍ය මහත්වරුන්ටත් යම් තත්ත්වයක් ලබා දෙන්නට. අපි වාර්ෂික පරීක්ෂණයක් පවත්වන්න ඕනැය කියා නියම කළොත් එසේ පරීක්ෂණයක් පවත්වන්නෙ ආයුර්වේද වෛද්‍ය ශිෂ්‍යයන්ගේ හොඳට බව මේ අවස්ථාවෙදි මතක් කර දෙන්න කැමතියි. අපි බලාපොරොත්තු වෙනවා, මෙම ශිෂ්‍යයන් හොඳින් පුහුණු වූවාට පසුව, ඔවුන්ට මධ්‍යස්ථාන භාරව වැඩ කරන්න අවස්ථාව දෙන්න. ආයුර්වේදය ගැන කථා කරන විට සඳහන් කළ යුතු කාරණා රාශියක්ම තිබුණත් දැන් ඊට වෙලාවක් නැහැ. නමුත් විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනැ තවත් කාරණා කීපයක් තිබෙනවා.

රෝගයන් සුව කිරීම කරන අතරම ජනතාව නිරෝගිව තබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නත් අපි බලාපොරොත්තු වෙනව. විශේෂයෙන් සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන් ගැන අපේ යටිනුවර මන්ත්‍රීතුමා (එස්. එස්. අබේසුන්දර මයා.) මතක් කළා. මින් ඉදිරියට සියලුම සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ට වෛද්‍ය නිලධාරීන් යටතෙහි වැඩ කරන්න සිදු වන්නෙ. එසේ කළොත් මෙයට වඩා හොඳ සේවයක් ඒ අයට ඉටු කරන්න පුළුවන් වේයයි මම විශ්වාස කරනව. යටිනුවර ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, අද සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන් පරීක්ෂා කරන්නෙ බේකරි සහ ආපන ශාලා පමණක් බව. නමුත් මට ලැබී ඇති පැමිණිලි අනුව නම් ඇතැම් සෞඛ්‍ය පරීක්ෂක මහතුන් ඒ තරම්වත් වැඩක් කරන්නෙ නැහැ. ඒ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ තරම්වත් ඒ ප්‍රදේශයේ වැඩක් කරනවා නම් ඒ ගැන සතුටු වෙන්න පුළුවනි. සමහර දෙනකු බොහොම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

හොඳින් වැඩ කළත් බොහෝ දෙනකු අපි බලාපොරොත්තු වන සේවය ඉටු නොකරන බව කනගාටුවෙන් මතක් කරන්න ඕනෑ.

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
*(திரு. பேர்னாட் சொய்ஸா—கொழும்பு தெற்கு அங்கத்தவர்)*
(Mr. Bernard Soysa—Colombo South)

බටහිර බෙහෙත් වර්ග පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමේ පනත යටතේ පරීක්ෂක මහත්වරුන් කී දෙනෙක් පත් කර සිටිනවද ?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

කොළඹ නගර සභා සීමාව තුළද ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

කොළඹින් පිට.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

මට හරියට කියන්න බැහැ, මේ අවස්ථාවේදී මම දන්නව 7 දෙනෙකු යවා තිබෙනව, එහෙ පුහුණුවට. නියම ගණන හරියට මට දන් කියන්න බැහැ. ඊයෙ පෙරේදා ඒ පිළිබඳව රෙගුලාසි වගයකට අත්සන් කළා මතකයි. කෙසේ වුණත් ඒ ගැනත් හොඳින් ක්‍රියා කරන්න මම බලාපොරොත්තු වෙනව.

අපි මහජනතාවට පිරිසිදු ජලය ලබා දෙන්නටත් බලාපොරොත්තු වෙනව. දැනට ඒ පිළිබඳව යෝජනාවක් තිබෙනව ; ජාත්‍යන්තර සෞඛ්‍ය ආයතන අපට ආධාර දෙන්නට පොරොන්දු වී තිබෙනව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේත් ඒ ගැන සන්තෝෂ වනවාට සැකයක් නැහැ. හලාවතට නැතත් මීගමුවේ සිට මාතර දක්වා මුහුදු බඩ ප්‍රදේශයට දිගටම පිරිසිදු ජලය ලබා දෙන්න එයින් පුළුවන් වෙනව. රුපියල් කෝටි දහයකට අධික මුදලක් මේ කට යුත්ත සඳහා වුවමනා කරන අතර ජාත්‍යන්තර සෞඛ්‍ය මධ්‍යස්ථානය මෙයින් විශාල කොටසක් පොළී නැතුව ණයට දෙන්න සූදානම්. ඒ ගැන විශේෂඥයන් පැමිණ දැනට පරීක්ෂා කරගෙන යනව. ඒ පිළිබඳ වාර්තාව ක්‍රම සම්පාදක මණ්ඩලය ඉදිරියෙ දැනට තිබෙනව. එම මුදල ලැබුණොත් විශාල සහනයක් බටහිර ප්‍රදේශයෙ සහ මුහුදුබඩ ප්‍රදේශයෙ ජනතාවට සැලසෙනව. දැනට පිරිසිදු ජලය නොලැබෙන නගර තිස් පහක් තිබෙනව. මෙසේ ජලපහසුකම් සපයන ප්‍රදේශ ඒ ඒ පළාත් පාලන ආයතන යටතේ තිබුනත්, ඒවා පළාත් පාලන අමාත්‍යාංශය භාර කට යුතු වුණත්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සෑම උත්සාහයක්ම දරණව එම ප්‍රදේශවලට අවශ්‍ය පිරිසිදු ජලය ලබා දෙන්න. දැනට අප පිරිසිදු ජලය ලබා දෙන්න ළිං තැනීමට මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනව. අවුරුදු පතා එසේ මුදල් වෙන් කිරීමෙන් එම ප්‍රදේශවල ජනතාවට පිරිසිදු ජලය ලබා දෙන්න අප උත්සාහ දරණව.

මානසික රෝගීන් පිළිබඳවත්, බාල පක්ෂ රෝගීන්, බරවා රෝගීන් හා ක්ෂය රෝගීන් පිළිබඳවත් කථා කිරීමට ගියොත් කාලය මදි වෙනවා. ඒ අංශ පිළිබඳවත් කල්පනා කොට බලා සුදුසු කටයුතු කරගෙන යන බව මම ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස සඳහන් කරන්න කැමතියි.

සෞඛ්‍ය හෙදියන් ගැන හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා මතක් කළා. මෙතෙක් කල් සෞඛ්‍ය හෙදියන් වර්ෂයකට බඳවා ගත්තේ 300 ක් නැති නම් 250ක් පමණයි. මීට පසු ඒ වාගේ දෙගුණයක් පුහුණු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඔවුන් ප්‍රථමයෙන් විශාල ආරෝග්‍යශාලාවලටයි, පත් කරන්නෙ. 1953 දී ගත් තීරණයක් තිබෙනවා, මින් ඉදිරියට ඇටෙන්ඩන්ට්වරුන් පත් කරන්න එපාය කියා. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා, හෙදියන් පමණක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බඳවා ගැනීමට. එවිට කම්කරුවන් හා හෙදියන් පමණයි, ආරෝග්‍යශාලාවලට බඳවාගන්නේ. දැනට සිටින ඇටෙන්ඩන්ට්වරුන්ට ඉඩ දෙනවා, ජ්‍යෙෂ්ඨ විභාගය සමත් නම් හෙදි විභාගය ගැනීමට. ඒ වෘත්තීය සමිති දෙක අතර විශාල භේද තිබෙනවා. හෙදියන් කියනවා, ඇටෙන්ඩන්ට්වරුන් උසස් කරන්න එපාය කියා. ඇටෙන්ඩන්ට්වරු කියනවා, හෙදියන්ට සමානම සේවයක්ය ඔවුන් කරන්නේ කියා. ඒ නිසා ඔවුන් හෙදියන් හැටියට පත් කරන්න යයි කියනවා. ඒ නිසා ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් ඇටෙන්ඩන්ට්වරුන්ට හෙදි විභාගය ගැනීමට ඉඩ දීමට අපි තීරණය කර තිබෙනවා. ඔවුන්ගෙන් අනික් අපේක්ෂකයින්ගෙන් තරම් තත්ත්වයක් බලාපොරොත්තු වන්නේ නැහැ. ඔවුන්ට එක්තරා සහනයක් දීමට බලාපොරොත්තු වෙනව. උඩරට තිබෙන සුළු ආරෝග්‍යශාලාවලට තවත් කාලයක් ඇටෙන්ඩන්ට්වරුන්ගේ සහායයි ලැබෙන්නේ. ප්‍රථමයෙන් කොළඹ, රත්නපුරය, මඩකලපුව, බදුල්ල වැනි මහා ආරෝග්‍යශාලාවලටයි, හෙදියන් පත් කිරීමට බලාපොරොත්තු වන්නේ.

ඒ වාගේම මින් ඉදිරියට ඇපොතිකරි මහත්වරුන් බඳවා ගැනීමට අපි බලාපොරොත්තු වන්නේ නැහැ. අවශ්‍ය වෛද්‍යවරුන් සංඛ්‍යාව වෛද්‍ය විද්‍යාල දෙකෙන් ලැබෙන නිසා මින් ඉදිරියට වෛද්‍යවරුන් පමණයි, බඳවා ගැනීමට බලාපොරොත්තු වන්නේ. දැනට සිටින බාල වයස් ඇපොතිකරි මහත්වරුන්ට උසස් කිරීමේ විභාගයක් පැවැත්වීමට බලාපොරොත්තු වෙනවා. ඒ අන්දමින් ඔවුන් තත්ත්වයෙන් උසස් කිරීම පිළිබඳ දැන් අමාත්‍යාංශය කල්පනා කරගෙන යනවා.

රටේ සෞඛ්‍ය සම්පත්තිය වර්ධනය කිරීම සඳහා කළ යුතු වැඩ රාශියක් තිබෙනවා. නමුත් මගෙත් නිලධාරීන්ගෙත් කාලයෙන් වැඩි කොටසක් ගත වන්නේ වින්නඹු මාතාවන් මාරු කිරීමේ ප්‍රශ්න පිළිබඳවයි. ඒ නිසා මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, අපේ අමාත්‍යාංශයෙන් කළ යුතු අත්‍යවශ්‍ය වැඩ පිළිබඳව අපේ සිත යෙදවීම සඳහා අපට



සහාය දෙන ලෙස. ගරු මන්ත්‍රීවරුන්ගේ සහාය අපට ඉතාමත්ම අවශ්‍යයි. මම සෑම ගරු මන්ත්‍රීවරයකුටම කියන්න කැමතියි, සෑම කොට්ඨාශයකම තිබෙන ආරෝග්‍යශාලා පරීක්ෂා කිරීමට මා පැමිණෙන බව. ලංකාවේ තිබෙන ආරෝග්‍යශාලාවලින් වැඩි හරියක් මම පරීක්ෂා කර තිබෙනවා.

හපුතලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා.) මතක් කළා, කොස්ලන්දේ ආරෝග්‍යශාලාව ගැන. ඒ ආරෝග්‍යශාලාව පිළිබඳව මට පැමිණිලි ලැබුණු අවස්ථාවේදී එහි තත්ත්වය කුමක් දැයි මම විමසුවේ හපුතලේ ගරු මන්ත්‍රීතුමාගෙන් බව මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕන. ඒ නිසා එහි තත්ත්වය මට අළුත් දෙයක් නොවෙයි. ඒ පිළිබඳව සුදුසු කටයුතු යොදන බව මම ඒ ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමතියි. ඒ ගරු මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ තිබෙන හපුතලේ ආරෝග්‍යශාලාව හදිසියේම පරීක්ෂා කිරීමට මට සිදු වුණා. මම බණ්ඩාරවෙල ආරෝග්‍යශාලාව පරීක්ෂා කරන්න ගිය අවස්ථාවේදී එම ආරෝග්‍යශාලාව පැය බාගයකින් පමණ පරීක්ෂා කොට අවසන් වූ නිසා මගේ නිලධාරීන් කිව්වා, වෙලාව තිබෙන නිසා හපුතලේ ආරෝග්‍යශාලාව පරීක්ෂා කරන්නටය කියා. ඒ නිසයි, ඒ ගරු මන්ත්‍රීතුමාට ඒ පිළිබඳව කලින් දැනුම් දීමට නොහැකි වූයේ. ඒ මන්ත්‍රීතුමාට දැනුම් දීමට බැරි වීම ගැන මම කණගාටු වෙනවා. වෙලාවෙන් ප්‍රයෝජන ගැනීමටයි, හපුතලේ ආරෝග්‍යශාලාව ඒ වෙලාවේදී පරීක්ෂා කරන්න ගියේ. පළාතේ සෑම ආරෝග්‍යශාලාවක්ම පරීක්ෂා කිරීමට මා බලාපොරොත්තු වන බව මම සඳහන් කරන්න කැමතියි.

1966-67 වර්ෂයේ ඇස්තමේන්තු පිළියෙළ කරන අවස්ථාව වන විට මට ලංකාවේ ඇති ආරෝග්‍යශාලා පිළිබඳව හොඳ අවබෝධයක් ඇති වේවි. දැනටමත් ලංකාවේ ඇති ආරෝග්‍යශාලාවලින් විශාල ගණනක ඇති අඩුපාඩු මේවා යයි මම බලා අවබෝධ කරගෙන සිටිනවා. හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමාටත්, කොත්මලේ ගරු මන්ත්‍රීතුමාටත් මම මතක් කරන්න සතුටුයි, ඒ මන්ත්‍රී තුමන්ලාගේ මෙන්ම එවැනි නොදියුණු ප්‍රදේශ නියෝජනය කරන අනික් මන්ත්‍රීතුමන්ලාගේත් දුක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රිකිල්ලගස්කඩ ග්‍රාමීය ආරෝග්‍යශාලාව පුළුල් කිරීම

[ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

ගැනවිලි පිළිබඳව මම ඉතා ඕනෑකමින් පරීක්ෂා කර බලා කටයුතු කරන බව. අඩු පාඩු රාශියක් තිබෙන බව මම පිළිගන්නව. ගරු මන්ත්‍රිවරුන්ට තත්ත්වය අව බෝධ වීම පිණිස මම අවසාන වශයෙන් එක කාරණයක් මතක් කර දෙන්න කැම තියි. බොහෝ අවස්ථාවලදී ගරු මන්ත්‍රී වරුන් කියනවා, අපේ ආරෝග්‍යශාලා බොහෝ අපිරිසිදු තත්ත්වයකය තිබෙන් නෙ, හුණු ගාලවත් නැත කියා. මුළු ලංකා වෙම තිබෙන ආරෝග්‍යශාලා 638 ටම හුණු ගා පිරිසිදු කර තබා ගැනීමට අපට අවුරුද් දකට වෙන් කර ඇති මුදල රුපියල් ලක්ෂ 9ක් පමණයි. රජයේ වැඩ දෙපාර්තමේන් තුව කියනවා හතරැස් අඩියක් හුණු ගා පිරිසිදු කිරීම සඳහා ශත 50ක් වැය වන වාය කියා. නමුත් ගණන් බැලූ විට අපට ලැබෙන්නෙ අවුරුදු 4කට ශත 25ක් පම ණයි. එම නිසා සෑම ආරෝග්‍ය ශාලාවකම හුණු ගාන්න පුළුවන් අවුරුදු 8කට වරක් පමණයි. කොළඹ පිහිටි ආරෝග්‍ය ශාලා අටට රුපියල් 1,75,000ක් වෙන් කර ඇති නිසා අවුරුදු දෙකකට වරක් කොළඹ ආරෝග්‍යශාලාවලට හුණු ගෑමේ අවස්ථාව සැලසී තිබෙනව. එහෙත් දැනට වෙන් කෙරෙන මුදල අනුව අනික් ආරෝග්‍ය ශාලා හුණු ගා පිරිසිදු කළ හැක්කේ අවුරුදු 8කට වරක් පමණයි. ඒ නිසා මේ කාර ණය සම්බන්ධයෙන් මා ගැන අනුකම්පා කරන ලෙස ගරු මන්ත්‍රිවරුන්ට මතක් කරනවා. ආරෝග්‍යශාලා පුළුවන් තරම් පිරිසිදු තත්ත්වයකින් තබා ගන්නවත්, හැකි සෑම අවස්ථාවකදීම ජල පහසුව ලබා දෙන්නටත් අපි උත්සාහ ගන්නව. ඒ වාගේම නොයෙක් අවස්ථාවලදී හදිසි පරීක්ෂණ පවත්වා දුප්පත් පොහොසත් භේදයක් නැතිව, කාටත් පොදුවේ හොඳින් සෞඛ්‍ය පහසුකම් ලබා දීමට ජාතික රජය අදහස් කරන බව මම සඳ හන් කරන්න කැමතියි.

තවත් එක් කාරණාවක් ගැන මේ අවස් ථාවේදී සඳහන් කළ යුතුයි. එනම් අවුරුද් දකට 28ක් පමණ බැගින් දන්ත වෛද්‍යා ගාර පිහිටුවීමට අපි බලාපොරොත්තු වන බවයි. විශේෂයෙන්ම ඈත ප්‍රදේශවලට ඒ පහසුව ඉතාමත් ඉක්මනින් ලබා දීම අපේ බලාපොරොත්තුව බවත් ප්‍රකාශ කර මින් මගේ කථාව අවසන් කරනව.

කල් තැබීම

ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි:

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු වී. ඒ. සුගතදාස].

பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப் பெற்றது:

"சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக" [கௌரவ வீ. ஏ. சுகததாச].

*Motion made, and Question proposed,*
"That the House do now adjourn".—[*The Hon. Sugathadasa*].

**බර්නාඩ් සොයිසා මයා.**
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කල් තැබීමේ යෝජනා අවස්ථාවේදී ඉතා වැදගත් ප්‍රශ්නයක් මතු කරන්න බලා පොරොත්තු වෙනවා. එනම් අද අපට ලැබුණ ආරංචියක් පිළිබඳවයි. පොලිස්පති තුමාට නිවාඩු ලබාගෙන යන ලෙස අණ කර ඇති බවත්, කොළඹ පොලිස් අධිකාරි අයි. ඩී. වැන්ච්වෙස්ට් මහතාගේ වැඩ තහනම් කර ඇති බවත් අපට දැනගන්න ට ලැබී තිබෙනව. මෙම ආරංචිය පිළිබඳව මම ප්‍රශ්න කරන්නට අදහස් කරන බව ගරු රාජ්‍ය ඇමතිතුමාට මම අද දවල් දැනුම් දුන්නා.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)
(The Hon. M. D. H. Jayawardena)

මම එයට උත්තර දෙනව.

**බර්නාඩ් සොයිසා මයා.**
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

එසේ දැනුම් දුන් අවස්ථාවේදී ගරු රාජ්‍ය ඇමතිතුමා මට කියන්න යෙදුණා, හෙට ගරු අගමැතිතුමා ඒ ගැන ප්‍රකාශයක් කරනවාය කියා. නමුත් මේ කාරණය ඉතාමත් වැදගත් දෙයක් නිසා හෙට ප්‍රකාශයක් කරන්නට මත්තෙන්—මෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආරංචිය මුළු රටේ ම පැතිර යන නිසා—විශෙෂයෙන් පොලිස් බල ඇණිය වැනි ආයතනයක මෙවැනි තනතුරු දරණ නිලධාරීන් පිළිබඳව මේ විධියේ ක්‍රියා කලාපයක් අනුගමනය කරන විට—ඊට හේතු මොනවාදැයි ආණ්ඩුව විසින් දැනුම් දීම ඉතාමත් අවශ්‍ය දෙයක් හැටියට අපි පිළිගන්නව. එසේ පිළිගන්නා නිසයි, හෙට ප්‍රකාශයක් කරන තුරු බලා සිටින්නටත් මත්තෙන් මේ ප්‍රශ්නය ඇසුවේ.

විශෙෂයෙන්ම හදිසි තත්ත්වය රට පුරාම පවතින මේ අවස්ථාවේදී, පාර්ලිමේන්තු රැස්වීම් හැර අනිකුත් ජන සම්මත පිළිවෙත්—තාවකාලිකව වෙන්න පුළුවන් ; අපේ බයකුත් තිබෙනවා තාවකාලික නොවෙන්න පුළුවන්ය කියා—සම්පූර්ණයෙන්ම වාගේ අත් සිටුවා තිබෙන මේ අවස්ථාවේදී ආරක්ෂක හමුදුවක මෙවැනි තනතුරු දරන නිලධාරීන් දෙදෙනෙකු—එක් කෙනෙක් ඒ මුළු බල ඇණියේම ප්‍රධාන ස්ථානය දරන තැනැත්තා අනික් තැනැත්තා කොළඹ නගරය පිළිබඳ ව ප්‍රධාන ස්ථානය දරන තැනැත්තා—ගැන එවැනි ක්‍රියා කලාපයක් අනුගමනය කිරීමට හේතුව කුමක්දැයි කියා අපට දැනුම්දීම අත්‍යවශ්‍ය දෙයක්ය. එය ප්‍රමාද කරන්න බැරි දෙයක්ය, කියලයි අප සලකන්නේ. හෙට ප්‍රකාශයක් කරන්න අගමැතිතුමාගේ බලාපොරොත්තුවක් තිබෙනවා යයි කී නමුත් ඒ ප්‍රකාශය කෙසේ වෙතත්-- එය හෙට ඇතිවන විවාදයට අදාළ වන විධියේ ප්‍රකාශයක් වන්න පුළුවන්—මේ කරුණ ගැන විශේෂයෙන් සලකා අද මෙතැන සිටින ගරු ඇමතිවරුන්ගෙන් මෙයට පිළිතුරු දිය හැකි ගරු ඇමතිතුමෙක් සිටිනවා නම් එයට පිළිතුරු දෙන්නටය කියා මා ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටිනවා.

අ. භා. 8.34

**එල්. සී. ද සිල්වා මයා.** (බලපිටිය)
*(திரு. எல். சீ. டி சில்வா—பலப்பிட்டிய)*
(Mr. L. C. de Silva—Balapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණු දෙකක් ගැන සඳහන් කිරීමට මා බලාපොරොත්තු වෙනව. පළමු වැනි කාරණය ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන විය යුතු එකක්. රජය මගින් පළ කරන පොත්වල ප්‍රමාදයක් තිබෙන බව අපට පෙනී යනවා. ඇත්ත වශයෙන්ම පෞද්ගලික පොත් ප්‍රකාශක සමාගම් හා ගරු අධ්‍යාපන ඇමතිතුමාත් අතර පසුගිය දිනවල විශාල සටනක් තිබුණු බවත් ඒ සටනින් ගරු අධ්‍යාපන ඇමතිතුමා යටනොවූ බවත් රටේ ප්‍රකට වී තිබෙනව. එහෙත්, රජය මගින් පළ කිරීමට නියමිතව තිබුණු පොත්වලින් වැඩි හරියක් අද වනතුරුම පිට වී නැහැ. ඒ නිසා පාසැල් යන ළමයින්ට විශාල කරදරයක් සිදු වී තිබෙනව. මේ පොත් මේ පාසැල් වර්ෂයට පාවිච්චි කිරීම සඳහා රජයෙන් පිට කරනවාද එහෙම නැත්නම් ඒවා පෞද්ගලික සමාගම්වලට පවරා දී තිබෙනවාද කියා අපි දැනගන්නට සතුටුයි. රජයෙන් පළ කර තිබෙන පොත් ටික බෙදා හැරීම වැළැක්වීමට සමහර පියවරවල් අරගෙන තිබෙනවා යයි අපට දැනගන්නට ලැබී තිබෙනව. ඒ නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මේ ගැන ප්‍රකාශයක් බලාපොරොත්තු වෙනව.

දෙවැනි ප්‍රශ්නය මෙයයි: ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමේ තොග වෙළඳුන් හැටියට ස.තො.ස ආයතනය මගින් පෞද්ගලික වෙළෙඳුන් පත් කර තිබෙනව. මේ උදවිය මොන ප්‍රතිපත්තියක් උඩ පත් කර සිටිනවාද කියා පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් දැනගන්නට කැමතියි. සමහර නගරවල වෙළෙඳ සමාගම්ය කියා අලුත් ආයතන ඇති කරගෙන තිබෙනවා. ඒ අයට මේ තොග වෙළඳාම බාර දී තිබෙනව. ඇත්ත වශයෙන්ම ඒ වෙළෙන්දෝ කවදාවත් ආහාර ද්‍රව්‍ය බෙදා හැරී අය නොවෙයි. එක නගරයක යකඩ බඩුවෙළෙන්දෙක්, අච්චු කන්තෝරු හිමියෙක් හා රෙදි වෙළෙන්දෙක් අද ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමේ තොග වෙළෙඳුන් බවට පත් වී සිටිනවා. මේ සඳහා එක්සත් ජාතික පක්ෂයට හිතවත් අය පත් කරතත් මේ වෙළඳාම ගැන පුරුද්දක් ඇති අය ඕනෑ තරම් සිටිනව. ඒ නිසා මෙය කුමන ප්‍රතිපත්තියක් උඩ කළාද යන්න දැනගන්නට කැමතියි. ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම පිළිබඳව කිසිම පළපුරුද්දක් හෝ ඇනීමක් නැති අය මේ සඳහා පත්වීම නිසා ලොකු කරදරයක් සිදු වී තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. සී. ද සිල්වා මයා.]
අනික් අතට තමුන්නාන්සේලා නිකුත් කරන බඩු ප්‍රමාණය සමුපකාර සංගම්වලින් බෙදා හැරීමට ප්‍රමාණවත් නැහැ. සමුපකාර සංගම් මගින් බෙදාහැරීමටවත් බඩු නොමැති අවස්ථාවක එය පෞද්ගලික වෙළෙඳුන්ටත් දීමේ අවශ්‍යතාවය කුමක්ද යන්න දැනගන්නට අපි කැමතියි. තමුන්නාන්සේලා දෙන ප්‍රමාණය බෙදාහැරීමට සමුපකාර සංගම්වලට පුළුවන්කම තිබියදී ඒ සඳහා පෞද්ගලික තොග වෙළෙඳුන් පත් කරන්නට හේතුව කුමක්ද? පෞද්ගලික සුළු වෙළෙන්දන් මගිනුත් බෙදා හැරීම අවශ්‍ය යයි තමුන්නාන්සේලා හිතනවා නම්, බඩු සෑහෙන ප්‍රමාණයක් සමුපකාර සංගම්වලට ලබාදී සුළු වෙළෙඳුන්ටත් බෙදන්නය කියා ඒ අයට නියම කරන්න. එසේ නොකොට නැවත සමුපකාර සංගම් සමග තරඟ කිරීමට පෞද්ගලික තොග වෙළෙඳුන් ඇති කිරීම තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තියද කියා දැනගන්නට කැමතියි.

අ. භා. 8.8

**ඊ. එල්. සේනානායක මයා.**
*(திரு. ஈ. எல். சேனநாயக்க)*
(Mr. E. L. Senanayake)

Mr. Deputy Speaker, there is a small rumour in my constituency that a building belonging to Cargills Limited is to be acquired by the Bank of Ceylon for approximately Rs. 1 million. I would like the Hon. Minister of Finance to consider this step before he actually approves it.

The building occupied by Cargills Limited is over 65 years old. I understand that in their books they have put down the value at one rupee. For Rs. 1 million you can build not only a building sufficient to house the Bank of Ceylon but all the banks.

I, as Mayor of Kandy, am prepared to give the Bank of Ceylon a bit of land adjoining any of the other banks in Kandy.

There is another aspect to this matter. Cargills Limited is a firm that handles most of the drugs, liquor, and so many other things. Today, though you cannot buy drugs yet, when you go to other places you have to pay blackmarket prices for them. However, in fairness to Cargills Limited I must say that they sell their goods at controlled prices.

Rupees one million is a very big sum of money. I was born and bred in Kandy and I know the Cargills building from top to bottom. That building is not a very big building. It is not worth more than Rs. 100,000 if you write off the wear and tear. I sincerely hope that the Hon. Minister will be very careful before he pays a bonus to the shareholders of Cargills Limited. The shareholders will get their money back and the shares they hold will be a gift to them. I hope the Hon. Minister will look into this matter.

අ. භා. 8.10

**පී. බී. විජේසුන්දර මයා. (කිරිඇල්ල)**
*(திரு. பீ. பி. விஜேசுந்தர—கிரியல்ல)*
(Mr. P. B. Wijesundara—Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා හදිසි ප්‍රශ්නයක් නගන්ට බලාපොරොත්තු වුණේ මගේ ඡන්දදායක කොට්ඨාශයෙත්, රත්නපුර දිස්ත්‍රික්කයේත් වැසියන්ගේ ප්‍රධාන රක්ෂාව වන මැණික් කර්මාන්තය සම්බන්ධයෙනුයි. මේ ප්‍රශ්නය ගරු අගමැතිතුමාගෙන් අසන්ට බලාපොරොත්තුව සිටි නමුත්, රාජ්‍ය ඇමතිතුමා එය සෞඛ්‍ය ඇමතිතුමාට පිළිතුරු දෙන්ට පවරා මේ ස්ථානයෙන් පිටවුණා.

තමුන්නාන්සේ දන්නවා ඇති, රත්නපුර දිස්ත්‍රික්කයේ අසරණ ජනතාවගේ ප්‍රධාන කර්මාන්තය මැණික් කර්මාන්තය බව. අනික් පළාත්වාසීන්ට නැති විධියේ රැකීරක්ෂා සම්බන්ධ අවහිරකම්වලට රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික් කර්මාන්තකරුවන්ට මුහුණපාන්ට සිදු වී තිබෙනව. රත්නපුර දිස්ත්‍රික්කයේ එක් රැකීරක්ෂා කාර්‍යාලයක් වන අවිස්සාවේල්ලෙ රැකීරක්ෂා කාර්යාලයෙන් ඒ ප්‍රදේශයේ රැකීරක්ෂා ලබා ගැනීම සඳහා ලියාපදිංචි වී සිටින අයට කිසිම රැකියාවක් හරියාකාර ලැබී නැහැ. මගේ ඡන්ද කොට්ඨාශයට ඇතුළුවන ස්ථානයේ පිහිටා තිබෙන අවිස්සාවේල්ලෙ රැකී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රක්ෂා කායශීලයෙන් ඒ පළාතේ ජනයාට සෙතක් සැලසී නැහැ. මන්ද? ඒ පළාතේ ආණ්ඩුවේ කායශීලයක හෝ පෞද්ගලික අංශයේ ආයතනයක හෝ ඇඩෑර්තුවක් ඇති වූ විට ඒ සඳහා කැඳවන්නේ කොළඹ රැකීරක්ෂා කාර්යාලයෙන් හෝ රත්නපුර රැකීරක්ෂා කාර්යාලයෙන්. ඒක තමයි, පළමුවැනි විපත්තිය.

ඒ වගේම අපට ඇතිවී තිබෙන අනික් ප්‍රශ්නය මේකයි. 1952 රත්නපුර දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා කැනඩා සංවර්ධන ආධාර යටතේ විශාල මුදලක් ලැබෙන්නට තිබුණා. එහෙත් ඒ මුදලවත් ලබා ගන්ට බැරි වුණා. ඒ කාලයේ මුදල් ඇමති වශයෙන් කටයුතු කළේ දැන් සෞඛ්‍ය ඇමතිතුමායි. අවාසනාවකට මෙන්, යම් යම් නිලධාරීන්ගේ ප්‍රමාද දෝෂයන් නිසා ඒ මුදල්වලින් රත්නපුර දිස්ත්‍රික්කයට කිසිම වැඩක් සිදු වුණේ නැහැ.

ඒ වගේම උඩරට සංවර්ධන ක්‍රමය යටතේ උඩරට ප්‍රදේශයට රත්නපුර දිස්ත්‍රික්කයත් ඇතුළත් කරනවා යයි පොරොන්දුවක් දී රත්නපුර දිස්ත්‍රික්කය තුළ තිබුණු සියලුම සංවර්ධන කටයුතු සහ රැකීරක්ෂා සැපයීමේ කටයුතු නවත්වා උඩරට ගැමි කොමිෂන් සභාවට ඒවා භාර දෙනවා යයි කිව්වා. ඒ ඒ කටයුතු භාර දෙපාර්තමේන්තුවලට ඒ කටයුතු නවත්වන ලෙස දැනුම් දුන්නා. එම නිසා කිසිම දෙපාර්තමේන්තුවක් රත්නපුර දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු භාර ගත්තේ නැහැ; උඩරට ගැමි කොමිෂන් සභාවෙන් ඒවා කරන තුරු බලා සිටියා. අන්තිමට සිදුවුණේ කුමක්ද? උඩරට ගැමි කොමිෂන් සභාව තීරණය කළා, රත්නපුර දිස්ත්‍රික්කය ඒ කොමිෂන් සභාවට අයත් ප්‍රදේශයෙන් ඉවත් කරන්ට. මේ නිසා රත්නපුර ප්‍රදේශයේ සියලුම සංවර්ධන කටයුතු හා රැකීරක්ෂා සැපයීම් ආදී සියල්ලක්ම අතර මග නතර වුණා. එවැනි අවස්ථාවකටයි, අප පත්ව සිටින්නේ. එම නිසා රත්නපුර වාසීන්ට සිදු වී තිබෙනවා, ඔවුන්ගේ ප්‍රධාන කර්මාන්තය වන මැණික් කර්මාන්තය නොකඩවා කරගෙන යන්න.

මගේ කොට්ඨාශයේ ජනතාවට රැකී රක්ෂා ලබා ගන්ට මාර්ගයක් නැහැ. වැසියන්ට ලබා ගැනීමට ආණ්ඩුවේ ඉඩමක්වත් නැහැ. කැලෑ දෙපාර්තමේන්තුවේ ඉඩම් කීපයක් "රෙසවේෂන්" කියා වෙන් කර තිබෙනවා. වැසියන්ට ලබා ගන්ට අඟලක්වත් නැති තත්ත්වයකුයි, තිබෙන්නේ. එම නිසා ඔවුන්ගේ ප්‍රධාන කර්මාන්තය වන මැණික් කර්මාන්තයේ යෙදීම සඳහා ඔවුන් නොයෙක් පළාත්වලට යාමේ සිරිතක් පවතිනවා.

අපේ පළාත්වාසීන් මැණික් කර්මාන්තයට විශේෂයෙන් දක්ෂ උදවිය බව තමුන්නාන්සේ දන්නවා. ලංකා ඉතිහාසයේ පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේ පටන් මැණික් කර්මාන්තය ගැන රත්නපුර දිස්ත්‍රික්කය ප්‍රසිද්ධියක් උසුලනවා. පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේදී ඉන්දියාවෙන් මුස්ලිම්වරුන් ගෙන්වා මැණික් කර්මාන්තය ආරම්භ කළ බව ඉතිහාසයේ සඳහන් වී තිබෙනවා. ඉතිහාසයේ සඳහන් වන අන්දමට වී පමණක් නොව මැණික් ද මේ රටින් පිටරට යවා මුදල් මෙරටට රැස් කර ගත්තා. මේ මැණික් බිම් පොළොන්නරුවේ—ඒ කාලයේ පුලස්තිපුර කියලයි කිව්වෙ—දියබෙදුම නමැති ස්ථානයෙන් ආරම්භ වී අන්නක් කඩවර හරහා ඇවිත් ඇලහැර, කළුගඟ, මාතලේ, ලග්ගල ආදී ප්‍රදේශ පසුකර මොනරාගල, ඔක්කම්පිටිය ඔස්සේ රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල ආදි ස්ථාන දක්වා විහිදී තිබෙනවා. එම නිසා පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේ පටන්—ඒ කාලයේ සිටි භූගර්භ විද්‍යාඥයින්ගේ අවවාද පරිදිත්, දැනට සිටින භූගර්භ විද්‍යාඥයින්ගේ අවවාද පරිදිත්—මැණික් ඉල්ලම් පාදා මැණික් ගරා ගැනීමේ සිරිතක් ඒ පළාත්වාසීන් තුළ තිබුණා; තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික් අඩු වීගෙන එන විට ඔවුන් සිරිතක් කරගෙන තිබුණ, මැණික් ප්‍රදේශ වන ඔක්කම්පිටිය, මොනරාගල, මින්නේරිය ප්‍රදේශයේ දියබෙදුම, ඇලහැර, පොළොන්නරුව, මාතලේ, කළුගඟ ආදි පළාත්වලට ගොස් මැණික් ගැරීම. දැන් ඔවුන් ඒ පළාත්වල මැණික් ගැරීමෙහි යෙදී සිටිනවා. ඒක නීති විරෝධී ක්‍රියාවක් තමයි. නීතියේ හැටියට බලන විට නම් එය නීති විරෝධි ක්‍රියාවක්. එහෙත් පසුගිය ආණ්ඩු කාලයේ වලවේ ප්‍රදේශයේත්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේසුන්දර මයා.]

මොනරාගල, ඔක්කම්පිටිය ආදි පළාත්වලත් ආණ්ඩුවේ ඉඩම් මැණික් ගරා ගැනීම සඳහා ඔවුන්ට වෙන්දේසි ක්‍රමයට දුන්නා. එහෙත් දැන් ඇළුහැර ප්‍රදේශයේත්, මාතලේ ආදි පළාත්වලත් මැණික් ගරන උදවියට ඉතා තදින් මර්දන නීති දමා තිබෙන බව මට දැනගන්ට ලැබී තිබෙනව. මා ඒ ප්‍රදේශයට පෙරේදා ගිය අවසථාවේදී මට හමු වුණා, අපේ පළාතේ මේ ගරු සභාවේ හිටපු මන්ත්‍රීතුමෙක්. එතුමාත් ඒ ස්ථානයට ගිහින් බොහොම අතවර විඳ ඇවිත් තිබෙන බව මට දැනගන්ට ලැබුණා. අපේ පළාත්වාසීන් තුන්-හාර දාහක් පමණ මේ නිසා අතරමංවී සිටිනව. පොලිස් නිලධාරීන් ක්‍රියා කරන්නේ කිසියම් නීතියක් අනුව වන්නට පුළුවනි. ඒ ගැන ඒ නිලධාරීන්ට දොස් කියන්නට බැහැ. නමුත් මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ අපේ ප්‍රදේශවල රැකීරක්ෂා අඩුකම නිසයි. රක්ෂා නැති නිසා රත්නපුර, නිවිතිගල, කිරිඇල්ල ප්‍රදේශවල උදවිය තුන් හාර දහසක් ඒ ඒ පළාත්වල මැණික් ගැරීමේ කටයුතු සඳහා ගොස් සිටිනවා. රැකීරක්ෂා නොමැතිකම නිසා මැණික් ගැරීමේ කර්මාන්තය සඳහා ඒ ඒ ප්‍රදේශවලට ගොස් ඇති ජනතාවට යම්කිසි කරදරයක් හිරිහැරයක් සිදු වෙනවා නම් එය ඉතාමත්ම කනගාටුදායකයි. දැනට කරදරේ වැටී සිටින තුන් හාර දහසක් දෙනාට සහනයක් සලසා දීම සඳහා ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ඔවුන්ට හිරිහැරයක් සිදු නොවන අන්දමට වග බලා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

මේ අතරම සෞඛ්‍ය ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරවිය යුතු කාරණයක් ගැන මතක් කරන්නට සතුටුයි. දැනට ආයුර්වේද වෛද්‍ය සහතික ගැන සැකයක් රජයේ දෙපාර්තමේන්තු තුළ ඇති වී තිබෙන බව පෙනෙන්නට තිබෙනවා. එය ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක්. එයින් පෙනෙන්නේ සිංහල වෙද මහතුන් ගැන අවිශ්වාස කරන බවයි. සමහර අය වැරදි සහතික ඉදිරිපත් කරනවා වන්නට පුළුවනි. නමුත් ඉංග්‍රීසි වෛද්‍යවරයකු සොයා ගන්නට අපහසු ප්‍රදේශ ලංකාවේ තිබෙන බව ගරු සෞඛ්‍ය ඇමතිතුමා දන්නවා ඇති. එවැනි ප්‍රදේශයක පදිංචි වී සිටින රජයේ නිලධාරියකුට යම්කිසි අසනීපයක් සැදුණහොත් ඔහුට ඉදිරිපත් කරන්නට පුළුවන් වන්නේ ආයුර්වේද වෛද්‍ය සහතිකයකුයි. ඉංග්‍රීසි වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරන ලෙස ඔහුට දැන්වුවහොත් ඔහුට කරන්නට සිදු වන්නේ බොරු සහතිකයක් ඉදිරිපත් කිරීමයි. ඒ නිසා එවැනි ප්‍රදේශයක ජීවත් වන ආණ්ඩුවේ නිලධාරියකු ආයුර්වේද වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළහොත් එය පිළිගැනීම ඉතාමත්ම සාධාරණයි. ඒ අතරම ආයුර්වේද වෛද්‍ය සහතික නොපිළිගැනීම ආයුර්වේද වෛද්‍යවරුන්ට කරන මදිකමක් බවත් මතක් කරන්නට කැමතියි. මේ සම්බන්ධයෙනුත් පිළියමක් යොදනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

අ. භා. 8.17

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයුර්වේද වෛද්‍ය සහතික සම්බන්ධයෙන් කිරිඇල්ලේ ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. රජයේ නියමයක් වශයෙන් ලියාපදිංචි වූ සෑම ආයුර්වේද වෛද්‍යවරයකුගේම සහතික පිළිගත යුතුයි. නමුත් ඉංග්‍රීසි වෛද්‍යවරුන්ගේ වේවා ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වේවා සහතික පිළිබඳව ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ට යම්කිසි සැකයක් ඇති වුවහොත් ඒ සහතික නොපිළිගෙන සිටින්නට ඔවුන්ට පුළුවනි. ඉංග්‍රීසි වෛද්‍ය සහතික සහ ආයුර්වේද වෛද්‍ය සහතික සම්බන්ධයෙන් කිසි වෙනසක් නැහැ. නමුත් ගාල්ලේ සිට වෙද මහතුන් දුම්රියෙන් පැමිණ ශත 25 ගණනේ වෛද්‍ය සහතික නිකුත් කරන බවට අපට පැමිණිලි බොහොමයක් ලැබී තිබෙනවා. එවැනි සහතික දෙන්නන් අසු වූ දවසක තදින් ක්‍රියා කරන්නට අප බලාපොරොත්තු වෙනවා. ඒ හැර වෛද්‍ය සහතිකවලට දක්වන සැලකිල්ල සම්බන්ධයෙන් නම් කිසිම වෙනසක් නැති බව කිරිඇල්ලේ ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්නට සතුටුයි.

මැණික් ගැරීම ගැනත් කිරිඇල්ලේ ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇසුවා. මාත් අධිනීතිඥයකු වශයෙන් නඩුවලට අසු වූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැණික් ගරන්නන් වෙනුවෙන් පෙනී සිට සල්ලි හම්භ කර තිබෙනවා. මැණික් ගරන අයගේ නඩු රාශියකට මාත් පෙනී සිටියා. අවසර පත්‍ර නැතිව ඒ කටයුතුවල යෙදෙන අය ගැන රජය සතුටු වන්නේ නැහැ. නමුත් තවම මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබී නැති බව රාජ්‍ය ඇමතිතුමා මා සමග ප්‍රකාශ කළා. මැණික් ගැරීමට බලාපොරොත්තුවෙන් හාර දහසක් දෙනා සිටින බවට පැමිණිල්ලක් නැහැ.

**විජේසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)

පොතේ හැටියට නීති විරෝධී වැඩක් කරන නිසා ඒ ගැන පැමිණිල්ලක් කිරීමට ඔවුන් භයයි.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

හොඳයි, අද පැමිණිලි කර තිබෙනවා. ඒ අතර රජයේ සැලකිල්ල යොමු කර මේ පිරිසට සහනයක් ලබා දීමට අප උත්සාහ කරනවා.

දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා විසින් මතු කරන ලද ප්‍රශ්නය සම්බන්ධයෙන්ද මතක් කරන ලෙස රාජ්‍ය ඇමතිතුමා මට දැනුම් දුන්නා. හෙට දින හදිසි තත්ත්වය ගැන විවාද කෙරෙනවා. ඒක වැදගත් කාරණයක් නිසා ඒ ගැන අපේ අගමැතිතුමාගෙන් හෙට පිළිතුරක් ලැබෙනවා ඇති. මීට පෙර අග්‍රාණ්ඩුකාරතුමා වෙනස් කළ දවසේවත් ඒ සම්බන්ධයෙන් මේ ගරු සභාවේදී එදාම ප්‍රකාශයක් නොකළ බව දන්නවා ඇති. ටික දවසකට පසුවයි, ඒ ගැන ප්‍රකාශයක් කෙළේ. මේ කරුණු ගැන හෙට විවාද කෙරෙන නිසා එතෙක් ඉවසිල්ලෙන් සිටින ලෙස දකුණු කොළඹ මන්ත්‍රීතුමාට මතක් කරන්නට කැමතියි. ඒ ගරු මන්ත්‍රීතුමාට පොලීසිය මගින් සෑම ආරක්ෂාවක්ම ලැබෙනු ඇති බවත් මතක් කරන්නට කැමතියි.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

There is the question raised by the hon. Member for Kandy. I shall take it up with the Chairman of the Board of Directors of the Bank of Ceylon.

අ. භා. 8.20

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලපිටියේ ගරු මන්ත්‍රීතුමා (එල්. සී. ද සිල්වා මයා.) විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් කියන්න තිබෙන්නෙ, රජයෙන් මුද්‍රණය කරන්න බලාපොරොත්තු වන පොත් ලැයිස්තුව ගැන මීට සති කීපයකට පෙර මේ ගරු සභාවට දැනුම් දුන් බවයි. භාර ගත් පොත්පත් කිසිම වෙනසක් නැතිව රජයෙන්ම මුද්‍රණය කරනවා ඇති. මේ කාර්යය නිම කිරීම සම්බන්ධයෙන් සුළු ප්‍රමාදයක් ඇති වුණු බව පිළිගන්නව. සමහර පොත් මුද්‍රණය කිරීම ප්‍රමාද වී තිබෙනව. එහෙත් මා හිතන හැටියට නම් ඒවා දැන් සම්පූර්ණයෙන් මුද්‍රණය කර ඉවරයි.

අ. භා. 8.21

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

තොග වෙළඳ මහත්වරුන් පත් කිරීම පිණිස සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් පත්‍ර මාර්ගයෙන් ඉල්ලුම් පත් ඉදිරිපත් කරන්න නියම කර ඊට පසු ඒ ඉල්ලුම් පත් ඒ ඒ පළාත්වල දිසාපතිවරුන්ට යවා ඒ දිසාපති මහත්වරුන් ලවායි ඒ තොග වෙළඳ මහත්වරුන් තෝරාගෙන තිබෙන්නෙ. ඒ අන්දමටම සුළු වෙළඳ මහත්වරුන්, බඩු සපයනු පිණිස, ඒ තොග වෙළඳ මහත්වරුන්ට බෙදා දී තිබෙනව. යම් විධියකින්, ප්‍රශ්නය ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමා මතක් කළ විධියට, මේ ව්‍යාපාරයේ යෙදී නැති යකඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඒ. පීරිස් මයා.]

සහ අනෙකුත් බඩු වෙළඳම් කිරීමේ යෙදී සිටින වෙළඳ මහත්වරුන්ට—නාම ලැයිස්තුවල නැති අයට—බඩු ලැබුණොත්, ඒ ගැන පැමිණිලි ලැබුණාම ක්‍රියා කරන බව මතක් කරනව. ඒ අතරම තවත් කාරණයක් කියන්න තිබෙනවා. පසු ගිය දවස්වල අපේ අමාත්‍යාංශයට දැන ගන්න ලැබුණා, තාවකාලික බලපත්‍ර ලැබූ ඉන්දියානුන් කීප දෙනෙකු තොග වෙළෙන්දන් වශයෙන් සිටින බව. එහෙත් දැන් ඔවුන් ගේ නම් ඉවත් කර තිබෙනවා.

පෝලිම් සම්බන්ධයෙන් අපට චෝදනාවක් එල්ල කර තිබෙනවා. පෝලිම් නැති කරන ලෙස අපට කියා තිබෙනවා. ඒ නිසා තමයි අපි දැන් සුළු වෙළඳ මහත්වරුන්ටත් ඒ බඩු බෙදා හැරීමට ඉඩ දී තිබෙන්නෙ.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.22ට, අද දින සභාසම්මතිය අනුව, 1966 ජනවාරි 26 වන බදාදා පෙ. ව. 10 වන තෙක් කල් ගියේ ය.

அதன்படி சபை, இன்றைய அதனது தீர்மானத்திற்கியைய, பி. ப. 8.22 க்கு, 1966, ஜனவரி 26, புதன்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

*Adjourned accordingly at 8.22 P.M. until 10 A.M. on Wednesday, 26th January 1966, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ආරම්භන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் : தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500, Colombo 1.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org